2007 අංක 07 දරන සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) & (LKASs) හි විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මේ අනුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් 08 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාව තුල නාගරික සැලසුම් සැකසීමේ හා ක්‍රමික නාගරික සංවර්ධනයන් හි නිරත වූ බහුවිධ ආයතනයකි.

1.1.5 අනුකූලතා ප්‍රකාශණය

විස්තිරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, අධිකාරියේ සහ සමූහයේ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය සහ අධිකාරියේ සහ සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන් සමඟ "මූල්‍ය ප්‍රකාශන" ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/ LKAS) අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සකස් කර ඇත.

1.2. සමූහයේ තොරතුරු

1.2.1. අනුබද්ධ සහ ආශ්‍රිත සමාගම්

සීමාසහිත වෝටර්ස් එජ් ලිමිටඩ්, ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් සහ නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) යන පූර්ණ හිමිකාරී අනුබද්ධ සමාගම් 03 ක් නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවතී.

නාගරික සංවර්ධන අධිකාරිය
2020.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා
වාර්ෂික ඒකාබද්ධ ගිණුම් සටහන්

තවද, නාගරික සංවර්ධන අධිකාරිය ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සහ ඔනාලි හෝල්ඩින්ස් පිඑල්සි කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර ඒවා නාගරික සංවර්ධන අධිකාරියේ ආශ්‍රිත සමාගම් වේ. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවීය.

1.2.1. අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිතයන්ගේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

සමාගමේ නම	වර්ගය	අරමුණ සහ ප්‍රධාන ක්‍රියාකාරකම්
සීමාසහිත වෝටර්ස් එජ් ලිමිටඩ්	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	වෝටර්ස් එජ් ලිමිටඩ් 2009 දී සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර එහි ව්‍යාපාරයේ ස්වභාවය ආපනශාලා සහ භෝජන සංග්‍රහ පහසුකම් සහ මෙහෙයුම් කටයුතු කළමනාකරණය යි.
ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ්	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	තානායම්, සංචාරක බංගලා, උද්‍යාන සහ අනෙකුත් විනෝදාස්වාද පහසුකම් කළමනාකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සඳහා සීමාසහිත ලංකා රෙස්ට් හවුස් ආයතනය සංස්ථාපිත විය.
නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික)	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	සීමාසහිත නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) යනු ඕනෑම ප්‍රදේශයක ඕනෑම ආකාරයක සංවර්ධන ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම, ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීමයි. සමාගමේ ආයෝජන දේපල වන්නේ සෙත්සිරිපාය II අදියර ගොඩනැගිල්ලයි.
ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම	අනුබද්ධ 43.39%	ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම ගුණාත්මක තනි නිවාස ලබා දීමෙන් දේපල සංවර්ධන අංශයේ ප්‍රමුඛස්ථානයක් ලබා ගැනීම අරමුණයි. සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වනුයේ, සාප්පු සහ මහල් නිවාස කුලියට දීම සහ විකිණීම සඳහා දේපල සංවර්ධනය කිරීමයි.
ඔනාලි හෝල්ඩින්ස් පිඑල්සි	අනුබද්ධ 44.80%	ඔනාලි හෝල්ඩින්ස් පිඑල්සි දේපල සංවර්ධන සහ දේපල ව්‍යාපාරයේ නියැලී සිටී. සමාගම ක්‍රියාත්මක වන්නේ ආයෝජන දේපල අංශය කුලියට දීමෙනි. සමාගමේ ආයෝජන දේපල වන්නේ කොළඹ 04 හි පිහිටි යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලයි.

අනුබද්ධ සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිළිබඳ අදාළ තොරතුරු 10 සහ 11 සටහන්වල අනාවරණය කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය
2020.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා
වාර්ෂික ඒකාබද්ධ ගිණුම් සටහන්

1.1 සකස් කිරීමේ පදනම සහ අනෙකුත් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.3.1. මිනුම් පදනම

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ පහත සඳහන් පරිදි ද්‍රව්‍යාත්මක අයිතම හැර අනිකුත් ගණුදෙනු ඓතිහාසික පිරිවැය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම් සඳහා වන වගකීම් හඳුනාගෙන ඇත්තේ අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකමට අමතරව හඳුනා නොගත් ක්‍රියාකාරී ලාභ, හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ක්‍රියාවලි පාඩු.

1.3.2. ගණුදෙනු ක්‍රියාකාරී සහ ප්‍රකාශිත මූල්‍ය වර්ගය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ක්‍රියාකාරී මුදල් ඒකකය ලෙස පිළිගෙන ඇත. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

1.3.3 ඇස්තමේන්තු හා මතයන් භාවිතය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිත වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවය වනුයේ, වත්කම්, වගකීම්,ආදායම් හා වියදම්වල වාර්තාගත ප්‍රතිඵල සම්බන්ධව හා භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව කළමණාකරණයට තීරණ ගැනීම, ඇස්තමේන්තු කිරීම හා උපකල්පන ඉදිරිපත් කිරීම වේ. ඇස්තමේන්තු අඟයන් සත්‍ය ප්‍රතිඵල තුලින් වෙනස් විය හැක.
ඇස්තමේන්තු සහ ඒ ආශ්‍රිත උපකල්පන පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන වෙනත් විවිධ සාධක මත වන අතර, ඒවායේ ප්‍රතිඵලය අනෙකෙන් පහසුවෙන් නොපෙනෙන වත්කම් සහ වගකීම් වල වටිනාකම් රැගෙන යාම පිළිබඳ විනිශ්චයන් සිදු කිරීමේ පදනමේ ප්‍රතිඵල වෙනත් මූලාශ්‍රවලින් පහසුවෙන් නොපෙනේ.

ඇස්තමේන්තු හා පහතින් දිවෙන උපකල්පනයන් අඛණ්ඩ පදනමක් මත නිරීක්ෂණය කරනු ඇත. ගිණුම්කරණ ඇස්තමේන්තු වල සංශෝධන එම මුදල් වර්ෂයට පමණක් බලපාන්නේ නම් ඇස්තමේන්තු සංශෝධනය කරන කාල සීමාව තුළ හෝ සංශෝධනය වත්මන් සහ අනාගත මූල්‍ය වර්ෂ දෙකටම බලපාන්නේ නම් සංශෝධන කාල සීමාව සහ අනාගත කාලසීමාවන් තුළ පිළිගනු ලැබේ.

1.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති මුදල් ප්‍රමාණයන් කෙරෙහි වඩාත්ම සැලකිය යුතු බලපෑමක් ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදීමේදී තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ.

ගිණුම් ඇස්තමේන්තු/තින්දු	සටහන් අංක	පිටු අංක
ආයෝජනදේපල වර්ගීකරණය	10	32

මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත පහත වගුවෙන් පෙන්නුම් කරනු ලබන අයිතමයන්හි ද්‍රව්‍ය ගැලපුම් නිසා සැලකිය යුතු අවදානමක් පවතින බවට උපකල්පනය කර ඇත.

ගිණුම් ඇස්තමේන්තු/තින්දු	සටහන් අංක	පිටු අංක
ආයෝජනදේපල	10	32
දේපල,පිරියතහාඋපකරණ	09	30
සේවක ප්‍රතිලාභ	29	39

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති, මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

1.4.1. ඒකාබද්ධ කිරීමේ පදනම

(අ) ව්‍යාපාර සංයෝජනය

ව්‍යාපාර සංයෝජනය අත්පත් කර ගැනීමේ ක්‍රමය භාවිතා කිරීම සඳහා ගිණුම්ගත කරනු ලබන්නේ අත්පත් කරගත් දිනට, එනම් පාලනය සමූහය වෙත මාරු කරන විටය. පාලනය යනු ආයතනයක ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එහි මූල්‍ය සහ මෙහෙයුම් ප්‍රතිපත්ති පාලනය කිරීමේ බලයයි. පාලනය තක්සේරු කිරීමේදී, සමූහය දැනට භාවිතා කළ හැකි විභව ඡන්ද බලයන් ද සැලකිල්ලට ගනී.

සමූහය කීර්තිනාමය අත්පත් කරගන්නා දිනකදී පහත සඳහන් අයුරින් ගණනය කිරීම සිදු කරනු ලබයි.

- සැලකිල්ලට ගනු ලබන සාධාරණ අගය
- අත්පත් කරගනු ලබන තැනැත්තා සතු පාලනයක් නොමැති කොටස
- ව්‍යාපාරයක් අන්තර්ග්‍රහණය කොටස් වශයෙන් සිදුවෙනම් එකී අන්තර්ග්‍රහණයට අදාලව පෙර දක්වන ලද හිමිකමෙහි සාමාන්‍ය අගය
- එලෙස සිදුකරන ලද අත්පත් කිරීමට අදාලව වන වත්කම් හා වගකීම් හි සාධාරණ අගය

මෙලෙස සිදු කරන ලද ගැලපුම සෘණ අගයක් නම් එය ලාභය හෝ අලාභයට ගැලපීමක්ද සිදු කරනු ලබයි. එසේම ව්‍යාපාර ඒකාබද්ධ කිරීමකදී ණය හා හිමිකම් සුරැකුම් සඳහා දරණ ලද ගණුදෙනු පිරිවැය එතුළින් ජනිත වූ වියදමක් ලෙස සලකනු ලබයි.

(ආ) පරිපාලිත සමාගම්

සමූහය විසින් පාලනය කරනු ලබන ව්‍යාපාර ආයතනයන් පරිපාලිතයන් ලෙස හඳුන්වනු ලැබේ. පරිපාලිතයන්හි පාලනය ආරම්භයේ සිට නවතා දමන තෙක් එම පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත කරනු ලැබේ. පරිපාලිතයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය වන විට සමූහය විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට වෙනස් කර ඇත.

(ඇ) ආශ්‍රිත සමාගම් වල ආයෝජනය (හිමිකම් ගිණුම්ගත පදනම් අනුව ආයෝජන)

පරිපාලිත සමාගමක් වශයෙන් දැක්වෙනුයේ සමූහය විසින් සැලකිය හැකි බලපෑමක් ඉටුකල හැකි නමුත් මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට සෘජුව බලපෑමක් සිදුනොකල හැකි සමූහය සතු සමාගම්ය. සැලකිය හැකි බලපෑමක් මඟින් දැක්වෙන්නේ සමූහය සතුව ජන්ද හිමි සාමාන්‍ය කොටස් වල හිමිකම 20% ත් 50% ත් අතර පවතින විටදීය.

ආශ්‍රිත සමාගම් වල ආයෝජනය පිරිවැය මත හඳුනාගෙන ඇති අතර හිමිකම් ක්‍රමය භාවිතයට ගනිමින් ගිණුම්ගත කර ඇත. ආයෝජනයේ පිරිවැය ලෙස ගණුදෙනු පිරිවැය ඇතුලත්ව ඇත. ආශ්‍රිත සමාගම් වල ලාභ හෝ අලාභයන්හි සමූහයේ කොටස හා වෙනත් විස්තිරණ ආදායම , ගැලපුම් යනාදිය ආරම්භයේ සිට නවතා දමන තෙක් එහි බලපෑම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත කරනු ලැබේ.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අන්තර් සමාගම් ගණුදෙනු වලින් පැන නඟිනු ලබන අන්තර් සමාගම් ශේෂයන් හා ගණුදෙනු සහ උපලබධි නොවූ ආදායම් හා වියදම් ඉවත් කරනු ලැබේ.

අධිකාරියේ අලාභ කොටස හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජනයට වඩා වැඩිවන විට අදාල ආයෝජනයට අදාලව ඉදිරියට ගෙන ආ ශේෂය හා ඊට අදාල දීර්ඝ කාලීන ආයෝජන ශූන්‍ය කරනු ලබන අතර මීට අමතරව පවතින අලාභ තත්වයන් වර්තමාන අගය මත ගලපනු ලබයි. මෙසේ අමතර අලාභ තත්වයන් වර්තමාන අගයන්ට ගලපනු ලබන්නේ සමූහය විසින් අදාල ආයෝජනයට අදාල වියදම් අඩු කිරීමෙනි.

(ඈ) ඒකාබද්ධකරණය මත ගණුදෙනු ඉවත් කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අන්තර් සමාගම් ගණුදෙනු වලින් පැනනඟිනු ලබන උපලබධි නොවූ ආදායම් හා වියදම් සහ අන්තර් සමාගම් ශේෂයන් හා ගණුදෙනු ඉවත් කරනු ලැබේ. ගණුදෙනු වලින් පැනනඟිනු ලබන උපලබධි නොවූ ලාභයන් සමඟ හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජන, ආයෝජනයට එරෙහිව ඉවත් කර ඇත. උපලබධි නොවූ අලාභයන්ද ඉහත සඳහන් උපලබධි නොවූ ලාභයන් ඉවත්කිරීමට ගනු ලැබූ

ක්‍රියාමාර්ගයන්ම ඒ සඳහා අනුගමනය කරනු ලබයි. උපලබධි නොවූ අලාභ උපලබධි නොවූ ලාභ අයුරින්ම ඉවත් කරනු ලබන අතර එම ඉවත් කිරීම හානිකරන අගය සඳහා සීමා වේ.

1.4.2. විදේශ විනිමය ගනුදෙනු

සියළු විදේශ විනිමය ගනුදෙනු භාවිතයට ගනු ලබන මුදල් ඒකකය සඳහා අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ දී පවතින විනිමය අනුපාතය යටතේ සටහන් කරනු ලබයි. එසේම විදේශ මුදල් ඒකකය මඟින් දැක්වෙන සියළුම මූල්‍යමය වත්කම් සහ වගකීම් වාර්තා කරනු ලබන දිනයේ එතැන් විනිමය අනුපාතිකය අනුව මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනු ලබයි.

ඒ අයුරින්ම ඓතිහාසික පිරිවැය මත ගණනය කළ විදේශ මුදල් ඒකකයන් මඟින් නිරූපණය වන මූල්‍ය නොවන වත්කම් හා වගකීම් එවැනි වටිනාකම් ගණනය කරන අවස්ථාවේ විනිමය අනුපාතිකය මත සඳහන් කරයි. මෙලෙස මුදල් ඒකක මඟින් පරිවර්ථනය කරනු ලැබූ මූල්‍ය නොවන වත්කම් මඟින් පැන නැඟුණු ලාභ හෝ අලාභ තත්වයන් මූල්‍ය වාර්තා වල සටහන් කිරීම සිදු කරනු ලබයි.

1.4.3. මූල්‍යමය වත්කම් හා වගකීම්

(අ) ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් (Non – Derivative Financial Assets)

අධිකාරිය විසින් ණය ගැනියන් හා ලැබිය යුතු ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කරනුයේ අදාල ණය ගැනියන් , ලැබිය යුතු ගිණුම් ශේෂ ජනනය වන දින තුල දිය. මීට අමතරව අනෙකුත් මූල්‍ය වත්කම් මූල්‍යමය වත්කම් ප්‍රකාශනයන් හි වාර්තා කරනුයේ එම වත්කම් සඳහා අධිකාරිය විසින් ගිවිසුම් වලට එළඹී දින තුල දිය.

ඒ අනුව කිසියම් මූල්‍යමය වත්කමක් මගින් ජනනය වන මුදල් ප්‍රවාහය සඳහා වූ අයිතිය කල් පිරීමේ දී හෝ අයිතිය පැවරීමක් මගින් විතැන් වන ප්‍රතිපාදනයන් හා අවදානම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් කරනු නොලබයි. ඒ අනුව මූල්‍ය වත්කම් වල අයිතිය පැවරීමක දී අධිකාරිය විසින් රඳවා ගනු ලැබූ පොලිය විශේෂිත වූ වත්කමක් හෝ වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනු ලබයි. මූල්‍යමය වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් නෛතික අයිතියක් ඇති අවස්ථාවන් හි දී හා ශුද්ධ අගය උපලබධි කළ හැකි අවස්ථාවන්හි දී අදාල වත්කම් හා වගකීම් වල ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනීම සිදු කරනු ලබයි.

මේ අනුව අධිකාරිය සතුව පහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍යමය වත්කම්, ණයගැති ලැබීම්, මූල්‍යමය ණය හා විකුණුම් ප්‍රතිග්‍රහනයක් සිදු කළ හැකි මූල්‍යමය වගකීම් පවති.

(i) ණයශේෂ හා ණයගැතියන්

ණයශේෂ හා ණයගැතියන් මූල්‍ය වෙළඳපොලේ ලැයිස්තුගත නොකළ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මෙම මූල්‍යමය වත්කම් හී ලැබීම් ස්ථාවර හා තීරණය කළ හැකි වේ. මූලිකව මෙම වත්කම් අගයකිරීමේ දී සාධාරණ අගය මත පදනම්ව ඒ සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වියදම් ග්‍රහණය කරනු ලබයි.මූලික වත්කම් අගය කිරීමට පරිභාහිරව ණයශේෂ හා ණයගැතියන්ගේ ශේෂ ක්‍රමක්ෂය ශේෂ මත සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින්, හානිකරන අලාභ ඉවත් කිරීමෙන් ගණනය කරනු ලබයි.මෙම ණයශේෂ හා ණයගැතිශේෂයන්හි මුදල් හා මුදල් වලට සමාන දෑ, කාර්ය මණ්ඩල ණයගැතියන්, වෙළඳපොල හා අනෙකුත් ණයගැතියන් හා ආශ්‍රිත ණයගැතියන්ගෙන් සමන්විත වේ.

(ii) මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ශේෂ, ජංගම ගිණුම් ශේෂ හා තෙමස් හා ඊට අඩු කල් පිරීමට යටත් වන ස්ථාවර තැන්පතු, බැංකු අයිරා, අයිකාරිය විසින් සෙසු ආශ්‍රිත පරිපාලිත සමාගම් වෙත ලබා දුන් ණය මුදල් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේ දී මුදල් හා මුදල් සමාන දෑ සඳහා අදාල කරගනු ලබයි.

(iii) කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන

කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන ව්‍යුත්පන්න මූල්‍ය වත්කමක් ලෙස විශ්ලේෂණය කරනු ලබන අතර එම වත්කම්හි ප්‍රතිලාභ ස්ථාවර ලෙස තීරණය කළ හැකි වේ. තව ද එම වත්කම් නිශ්චිත කල් පිරීමේ කාලයකින් සමන්විත වන අතර අයිකාරිය සතුව එම වත්කම රඳවා ගැනීමේ හැකියාවක් හා අවශ්‍යතාවයක් පවති. මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමේ දී මූලික ගණනය කිරීම් වලට පරිභාහිරව කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන ක්‍රමක්ෂය ශේෂ ක්‍රමය මත සඵල පොලී අනුපාතය උපයෝගිකර ගනිමින්, හානිකරන අලාභ අඩු කිරීමෙන් ගණනය කරනු ලබයි.

ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී අත්පත් කරගැනීම සඳහා වූ අයි මිල සහ අව මිල යොදා ගෙන සඵල පොලී නුපාතය ගණනය කරනු ලබයි. මෙම ක්‍රමක්ෂය පොලිය ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශයේ සඳහන් කරනු බන අතර එමගින් ජනිත වන අලාභයක් වේ නම් ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශයේ වෙනත් මූල්‍ය වත්කම් මගින් ජනිත වූ ගෙවීමක් ලෙස සටහන් කරනු ලබයි.

(ආ) ව්‍යුත්පන්න නොවන මූල්‍යමය වගකීම් (Non – Derivative Financial Liabilities)

අයිකාරිය විසින් ණය සුරුකුම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනුයේ අදාල ණය සුරකුම්පත් ජනනය වූ දිනදීය. අනෙකුත් සියලුම මූල්‍යමය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් කරනුයේ අදාල ණය සුරකුම් සඳහා ගිවිසුම්ගත වූ දිනයන්හිදිය. එපරිද්දෙන් අයිකාරිය විසින් ගෙවා නිදහස් කරන ලද හෝ අවලංගු කරන ලද මූල්‍යමය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කරනු නොලබයි.

අයිකාරිය විසින් ව්‍යුත්පන්න මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් වර්ගීකරණය යටතේ සටහන් කරයි. එකී මූල්‍යමය වගකීම් ප්‍රාථමිකව වෙළඳපොල වටිනාකම මත ආරෝපණය කල හැකි වියදම් ඇතුළුව අගය කරනු

ලබයි. එලෙස ප්‍රාථමික වෙළඳපොල වටිනාකම මත අගය කල මූල්‍යමය වගකීම් ද්විතීකව සුළු පොලි අනුපාතය මත අගය කිරීම සිදු කරනු ලබයි.

අනෙකුත් සියලුම කෙටිකාලීන සහ හෝ වෙළඳපොල අගයක් නොමැති සාධාරණ අගයක් මඟින් ජනනය වන වගකීම් වෙළඳ හා අනෙකුත් ණයහිමියන් ලෙස වර්ගීකරණය කරනු ලබයි. ප්‍රාථමික වෙළඳ හා අනෙකුත්ණයහිමියන් සාධාරණ අගයක් මත ගණනය කිරීම සිදුකරනු ලබයි. කෙසේ නමුත්, මෙම වගකීම් අගය කිරීමේදී අධිකාරිය විසින් ක්‍රමක්ෂය ක්‍රමය අනුගමනය නොකරයි. මෙසේ ක්‍රමක්ෂය ක්‍රමය අනුගමනය නොකිරීමට හේතුව වනුයේ අදාල ණයහිමියන් සඳහා ගෙවීම් ඉල්ලීම් කරනු ලබන අවස්ථාවේදීම සිදුකිරීමට අවශ්‍ය වන හෙයිනි.

අධිකාරිය සතුව පවත්නා මූල්‍ය වගකීම් වල විස්තරාත්මක සටහනක් අංක 24 යටතේ දක්වා ඇත.අනෙකුත් මූල්‍ය වගකීම් ණයශේෂ, වෙළඳ හා අනෙකුත් ණයහිමියන්ගෙන් සමන්විත වේ.

(i). වන්දි ප්‍රතිපත්තිය

රජයේ උපදෙස් සහ ප්‍රතිපත්ති තිරණ මත විවිධ සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිවයින පුරා ඉඩම් අත්පත් කරගෙන ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 45 වැනි වගන්තියට අනුව, එම අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේ නීත්‍යානුකූලභාවය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පිළිගත් දින සිට ආරම්භ වේ.

වන්දි සංරවකයට ප්‍රාග්ධන සංරවකය මෙන්ම පහත දැක්වෙන ආකාරයෙන් ගණනය කිරීම් හඳුනාගත් පොලි සංරවකද ඇතුළත් වේ.

1. ප්‍රාග්ධන සංරවකය: නිශ්චිත ඉඩම් ප්‍රමාණය සඳහා අදාළ අධිකාරිය විසින් තීරණය කරන ලද තක්සේරු අගය ප්‍රාග්ධන ගෙවීම ලෙස පිළිගනු ලැබේ.
2. පොලි සංරවකය: පිළිගත් දින 7 සිට ගෙවන දිනය දක්වා කාලය සඳහා ඉඩමේ හිමිකරුට ගෙවිය යුතු පොලි මුදල.

ඒ අනුව, ශේෂ පත්‍රයේ දිනට අත්පත් කරගත් මුළු ඉඩම් ප්‍රමාණයේ අයිතිකරුවන්ට ගෙවිය යුතු වන්දි මුදල, මූල්‍ය ප්‍රකාශනවල කාණ්ඩ දෙකක් යටතේ ගෙවිය යුතු වන්දියක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පිළිගැනේ.

(ඒ). ඉදිරි සිව්වන වසරේ ගෙවිය යුතු සම්පූර්ණ වන්දි මුදල අනුව, වත්මන් වගකීම ලෙස ගෙවිය යුතු වන්දි මුදල ගිණුම්ගත කෙරේ.

(බී). ඉඩම් සඳහා උපචිත වන්දි ලෙස ජංගම නොවන වගකීම් යටතේ මුළු වන්දි වටිනාකමෙන් 80% ක් තවත් වසරකින් පසු ගෙවිය යුතු මුදල 80% ක් බව සලකයි.

මෙම වන්දි මුදලේ වත්මන් වගකීම් කොටස ගෙවනු ලබන්නේ ඉඩම් විකිණීමෙන් ලැබෙන ආදායම සහ දිගුකාලීන ආයෝජනවලින් ලැබෙන පොලිය යොදා ගනිමින් එම වර්ෂය සඳහා අධිකාරියෙහි සමස්ත මුදල්

ප්‍රවාහය සලකා බැලීමෙන් පසුවය. පසුගිය වසර දෙක තුළ අධිකාරියෙහි අරමුදල් යාන්ත්‍රණයෙන් සිදු කරන ලද වන්දි ගෙවීම් පහත පරිදි වේ.

වසර	ගෙවූ වන්දි මුදල (රු.)
2018	1,663,000,000
2019	507,332,975
2020	69,293,749

1.4.4. හානිවීම්

1.4.4.1 ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්

අධිකාරිය විසින් සාධාරණ අගය මත ගණනය කරනු නොලැබූ මූල්‍ය වත්කම් සෑම මූල්‍ය ප්‍රකාශන වාර්තාකරනු ලබන දිනකදීම තක්සේරු කිරීමක් සිදුකරයි. මූලිකවම මූල්‍ය වත්කමක් හානිවීම ගණනය කරනු ලබන්නේ එකී මූල්‍ය වත්කම ප්‍රාථමික ගණනය කිරීම් වලින් පසුව සෘණාත්මක බලපෑමක් මුදල් ප්‍රවාහයට සිදු වන බැවි තහවුරු වන අවස්ථාවකදීය.

එවැනි නිශ්චිත වශයෙන්ම සිදු වන බලපෑම් සලකනුයේ ණයගැතියන් ගෙවීම පැහැරහැරීම් /කඩකිරීම අධිකාරිය විසින් ණය සංයුතියේ වෙනසක් සිදුකිරීම, ණයගැතියන් බුන්වත් වීම හෝ එවැනි බුන්වත් වීමේ ලක්ෂණ පෙන්නුම් කල අවස්ථාවන්හිදී සහ සුරැකුම් සඳහා වෙළඳපොල අහිමිවීමකදීය. මීට අමතරව හිමිකම් සහතිකයක සාධාරණ අගය දිර්ඝකාලීනව ශේෂවන අවස්ථාවන්ද එවැනි නිශ්චිත වශයෙන් සිදුවන බලපෑම් ලෙස සලකනු ලබයි.

අධිකාරිය විසින් ලැබිය යුතු ණයශේෂ සඳහා හානිවීම් නිශ්චිත වූ මට්ටමක් තුලදී සිදුකරනු ලබයි. මේ අනුව සියලුම සැලකිය යුතු ලැබිය යුතු ණයශේෂයන්හි හානිවීම් ගණනය කිරීම සිදුකරයි.

මූල්‍ය වත්කමක් සඳහා වන හානිකරන අලාභය ගණනය කරනු ලබනුයේ ක්‍රමක්ෂය ක්‍රම ක්‍රමය මත ඉදිරියට ගෙනා ශේෂයන් මූලික සඵල පොලි අනුපාතිකය යටතේ ගණනය කල අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය සලකා බැලීමක් මගිනි.

මෙසේ ඇගයීමෙන් හටගනු ලබන හානිකරන අලාභය ආදායම් හා වියදම් ප්‍රකාශය යටතේ සඳහන් කරනු ලබන අතර ණයගැතියන්ට එරෙහිව කරනු ලබන ප්‍රතිදානයක් ලෙසද මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් කිරීම සිදුකරයි. හානිකරන මූල්‍ය වත්කම සඳහා වූ අදාල පොලිය වට්ටම් මත ගැලපීමක් සිදුකරන අතර හානිකරන අලාභය අවම වීම් ආදායම් හා වියදම් ප්‍රකාශනයන්හි ගැලපීමක්ද සිදුකරනු ලබයි. විකිණීම සඳහා පවතින ආයෝජනයන්හි හානිකරන අලාභය ගණනය කරනු ලබනුයේ අදාල වත්කම සඳහා වූ සමුච්චිත අලාභය සහ අදාල වත්කම සඳහා හිමිකම්හි දක්වනු ලබන සාධාරණ අගය සලකා බැලීමෙන් පසුවය. මේ අනුව විස්තිරණ ආදායම් ප්‍රකාශයේ ඉවත් කරනු ලබන සමුච්චිත අලාභය හෝ ලාභය අත්පත්කර ගැනීම සඳහා දැරූ පිරිවැයත්, ශුද්ධ මූලික ගෙවීම් හා

ක්‍රමක්ෂයත්, සාධාරණ වටිනාකම මත අගයෙන් ඉදිරියට ගෙනා හානිකරන අලාභ හෝ ලාභයන්හි වෙනස ලෙස දැක්විය හැක. එසේම හානිකරන අලාභය සඳහා වන වෙන්කිරීමේ සිදුවන වෙනස්වීම් පොලි ආදායම මත වන කාලානුරූපී අගයන් ලෙස ගැලපීමද සිදුකිරීම කරනු ලබයි.

1.4.4.2 මූල්‍ය නොවන වත්කම්

තොග සහ විලම්බිත බදු වත්කම් හැර අධිකාරිය සතුව පවත්නා අනෙකුත් මූල්‍යමය නොවන වත්කම් සමාලෝචනය කිරීමක් සෑම මූල්‍ය ප්‍රකාශන වාර්තා කරන දිනයක් තුලදීම සිදුකරනු ලබන අතර එමඟින් කිසියම් හෝ හානාකරන ලාභයක් හෝ අලාභයක් සිදු වී අත්දැයි නිර්ණය කරනු ලබයි. එවැනි අවස්ථාවන්හිදී අදාල වත්කමේ අපේක්ෂිත ප්‍රතිලාභ අගය සටහන් කිරීම සිදුකරනු ලබයි.

වත්කමක ප්‍රතිලාභය අගය ලෙස සටහන් කරනු ලබනුයේ අදාල වත්කමේ ප්‍රයෝජ්‍ය අගය හා සාධාරණ අගයෙන් විකුණුම් වියදම් අඩුකොට ලැබෙන අගයෙන් වැඩි අගය සැලකීමට යොමු කිරීමෙනි. මේ අනුව, වත්කමේ ප්‍රතිලාභය ගණනය කරනුයේ වත්කම මඟින් ජනිතවන අනාගත මූල්‍ය ප්‍රවාහ බදු පෙර වට්ටම් අනුපාතය වෙළඳපොල ප්‍රතිලාභ හා අවදානම් තත්වයන් සැලකීමෙන් පසුව වර්තමානය සඳහා ඇස්තමේන්තු සැලකීමෙනි. මෙලෙස හානිකරන ලාභ හෝ අලාභ පරීක්ෂා කිරීම පිණිස අධිකාරිය සතු වත්කම් ඉහාකුඩා ඒකක (මුදල් ජනිත ඒකක) වලට බෙදාවෙන්කිරීම සිදුකරන අතර එමඟින් ජනිත වන ස්වකීය මුදල් ප්‍රවාහ ඵලෙස වෙන්කරනු ලැබූ ඒකකයන් වලින් වෙනස් වේ.

ව්‍යාපාර අන්තර්ග්‍රහණය කිරීම මඟින් ඇතිවන්නා වූ සහක්‍රියාව මඟින් ජනිත වන කීර්තිනාමයේ සිදුවන හානිකරන අගයේ වෙනස් වීම මුදල් ජනිත ඒකකයන්හි ගැලපීම සිදුකරනු ලබයි. මේ අනුව අදාල වත්කමේ හෝ මුදල් ජනිත ඒකකයේ ඉදිරියට ගෙනා ශේෂයට වඩා ප්‍රතිලාභය අගය වැඩි අවස්ථාවන්හිදී හානිකරන අලාභයක් ලෙස සටහන්කිරීම කරනු ලබයි.

මෙලෙස සිදුවන්නා වූ හානිකරන අලාභය ප්‍රථමයෙන්ම අදාල වත්කමේ මුදල් ජනිත ඒකකයේ කීර්තිනාමය අඩුවීමක් ලෙස දක්වන අතර අනෙකුත් වත්කම්හි ඉදිරියට ගෙනා ශේෂයේ අනුපාතික අඩුවීමක් ලෙස පෙන්නුම් කරනු ලබයි.

කීර්තිනාමය මත සිදුවන හානිකරන අගයේ අඩුවීමක් නැවත ප්‍රතිග්‍රහණය කිරීමක් සිදුනොකරයි. අනෙකුත් වත්කම් වලට අදාලව පෙර වර්ෂ වලදී සිදු කරන ලද හානිකරන අලාභ අඩුවීමක් හෝ ඉවත්වීමක් සිදුවුනිද යන්න ගණනය කරනු ලබයි. ප්‍රතිලාභය අගයේ සිදුවන වෙනස්වීම් හේතුවෙන් හානිකරන අලාභය නැවත සැකසීම සිදුකරන අතර එසේ වෙනස්කමක් ගැලපීම වත්කමේ ඉදිරියට ගෙනා ශේෂයත්, ක්ෂය කිරීම සමඟ ගැලපූ පසු ප්‍රතිලාභය අගයට වඩා අඩු අගයක් ගන්නේනම් පමණක් සිදුකිරීම කරනු ලබයි.

1.4.5 දේපල පිරියත හා උපකරණ

(i) හඳුනා ගැනීම හා මැනීම

වත්කම් හා සම්බන්ධයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ හා වත්කමවල පිරිවැය විශ්වාසනීය ලෙස මනි මැන බැලිය හැකි වත්කම් දේපළ පිරියත හා උපකරණ ලෙස හඳුනා ගෙන ඇත.

දේපළ පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන් පසු පිරිවැයට හෝ ප්‍රත්‍යාගනිත අගයට හඳුනා ගනු ලබයි.

දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය හඳුනාගනු ලබන්නේ එය මිලදී ගැනීමේ වටිනාකම හෝ එය අපේක්ෂිත භාවිත තත්වයට පත් කිරීම සඳහා දරනු ලබන පිරිවැයයි. තමා විසින්ම නිෂ්පාදනය කරනු ලබන වත්කමක පිරිවැය ලෙස සළකනු ලබන්නේ එය අපේක්ෂිත භාවිත තත්වයට පත් කිරීම සඳහා දරනු ලබන අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය හා අනෙකුත් සෘජු වියදම්ය. යම් දේපළ පිරියත හා උපකරණයක එක් එක් කොටස් සඳහා වෙනස් ආයු කාලයක් පවතී නම් ඒවා වෙන වෙනම කොටස් ලෙස සලකා ගිණුම්ගත කරනු ලබයි.

(ii) ආයෝජන දේපල නැවත වර්ගීකරණය

සමූහය සතු දේපලක් ආයෝජන දේපල වලට මාරු වන විට එම දේපල නැවත සාධාරණ වටිනාකමකට මනිනු ලබන අතර එය ආයෝජන දේපල වශයෙන් නැවත වර්ගීකරණය කර ඇත. නැවත ගණනය කිරීම මඟින් මතුවන්නා වූ ලාභය හෝ අලාභය අදාල වත්කම උදෙසා පෙර කරනු ලැබූ හානිවීම් මත ගැලපීම සිදු කරනු ලබයි. මීට අමතරව පවත්නා වූ ලාභයක් වෙතොත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණිත සංචිතයක් වශයෙන්හි මිකම්හි දැක්වීම සිදු කරනු ලබයි. මෙලෙස හඳුනා ගනු ලැබූ අලාභයන් ආදායම් හා වියදම් ප්‍රකාශනයන්හි සටහන් කිරීම සිදු කරනු ලබයි.

(iii) ධාරණ පිරිවැය

දේපල , පිරියත හා උපකරණ වලට යම් කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය එහි ධාරණ පිරිවැය ලෙස හඳුනාගෙන ඇති අතර එම කොටස එකතු කිරීම තුළින් සමස්ත දේපල කට්ටලය තුලම අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනිත වීනම් එහි පිරිවැය මැනිය හැකිය. ප්‍රතිෂ්ඨාපන කොටසෙහි ධාරණ පිරිවැය ඉවත් කිරීමටද හැකිය. දේපල , පිරියත හා උපකරණ එදිනෙදා නඩත්තු කිරීමේ පිරිවැය ලාභාලාභ ගිණුම තුළින් හඳුනාගත හැකිය.

(iv) ඉවත් කිරීම

දේපල , පිරියත හා උපකරණවල අඩංගු යම් අයිතමයක් ඉවත් කිරීමකදී හෝ එය භාවිතා කිරීම තුළින් එහි අනාගත ප්‍රතිලාභ නොමැති විටකදී එහි ඉවත්කිරීම මත පැන නඟිනු ලබන ලාභය හෝ අලාභය ලාභාලාභ ගිණුම තුල වෙනත් ආදායම් යටතේ හඳුනාගනු ලැබේ.

1.4 සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.4.5 **යන්ත්‍ර සූත්‍ර පිරියත හා උපකරණ (continued)**

(v) ක්ෂය

දේපල පිරියත හා උපකරණ වල අඩංගු එකිනෙක අයිතම ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය කර ඇති ආකාරය ලාභාලාභ ගිණුම තුලින් හඳුනා ගත හැකිය. කල්බදු පහසුකම් යටතේ පවතින වත්කම් ක්ෂය කිරීමේ දී කල්බදු ගිවිසුමේ ඇති ගිවිසුම්ගත කල්බදු කාලය හා ඵලදායී ජීවකාලයෙන් අවම වූ කාලපරිච්ඡේදය පුරා ක්ෂය කිරීම කරනු ලබයි. මෙසේ කල්බදු යටතේ පවතින වත්කම් සමූහය විසින් ක්ෂය කිරීම සිදු කරනුයේ අදාල වත්කමේ අයිතිය කල්බදු කාලයෙන් පසුව සමූහය වෙත ලැබේ යැයි අපේක්ෂිත අවස්ථාවන්හි දීය. වත්කම් ක්ෂය කිරීම ආරම්භ කරනුයේ එම වත්කම භාවිතයට ගන්නා දින වන අතර , ක්ෂය කිරීම නතර කරනුයේ, එම වත්කම විකිණීම සඳහා වර්ගීකරණය කරන විටදීය. (විකිණීම සඳහා වර්ගීකරණය කරනු ලබන වත්කම් සමූහයේ ඉවත් කිරීම් තුළ අන්තර්ගත කරනු ලැබේ.) ඉඩම් හා නොනිම් වැඩ ක්ෂය කරනු නොලැබේ.

ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

වත්කම්කාණ්ඩය	ඵලදායීජීවකාලය
ගොඩනැගිලි	අවු.50
මෝටර් රථ	අවු.05
ලිබඳු හා සවිකිරීම්	අවු.10
කාර්යාල උපකරණ	අවු.05
පද්ධති හා ජාල	අවු.05
පොත්	අවු.04
යන්ත්‍ර හා උපකරණ	අවු.05

1.4.6 ආයෝජන දේපළ

1.4.6.1. හඳුනා ගැනීම හා මැනීම

දේපල , කුලී ආදායම් ඉපැයීමට හෝ ප්‍රාග්ධන අගය වර්ධනය කිරීම සඳහා හෝ නැතහොත් මෙම අරමුණු දෙක සඳහාම පවත්වාගෙන යනු ලබන අතර එය ආයෝජන දේපල වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. ආයෝජන දේපල මූලිකවම මනිනුයේ, පිරිවැය මත වන අතර එහි ගණුදෙනු පිරිවැය අන්තර්ගතය.

1.4.6.2. ධාරණ පිරිවැය

මූලික පිළිගැනීමෙන් පසුව, ආයෝජන දේපල සැලකිය යුතු පිරිවැයකින් අඩු සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත ආබාධ අලාභය ලෙස දක්වා ඇත. UDA විසින් වසර 50 ක කාලය තුළ ඉඩම් හැර එහි ආයෝජන දේපල අවප්‍රමාණය කිරීමට සරල ක්‍රමයක් භාවිතා කරන ලදී.

1.4.6.3 ඉවත් කිරීම

ආයෝජන දේපල අලෙවිකිරීමකදී හෝ භාවිතයෙන් ස්ථිරවම ආපසු ගැනීමකදී සහ ඒවා බැහැර කිරීමේදී අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැතිනම් එම ආයෝජන දේපල ඉවත් කිරීම් ලෙස හඳුනාගනු ලැබේ. එසේ ඉවත් කරනු ලබන ආයෝජන දේපල වල ධාරන වටිනාකම හා ශුද්ධ විකුණුම් අතර වෙනස එලෙස ඉවත් කරනු ලබන කාලපරිච්ඡේදයෙහි ආදායම් ප්‍රකාශය තුළින් හඳුනා ගත හැකිය.

1.4.6.4 වර්තමාන ක්‍රමවේදය

අත්පත් කර ගැනීමේ පිරිවැය පදනම් කරගෙන පෙර SLAS වලට අනුකූලව මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සඳහන් කර ඇති ඉඩම් සහ ආයෝජන දේපල ගොඩනැගීමේ පිරිවැය SLFRS සංක්‍රාන්ති දිනයේ (2011 දෙසැම්බර් 31 දිනට සැලකූ පිරිවැය) අධිකාරිය විසින් සාධාරණ වටිනාකමක් යටතේ ඉඩම් සහ ආයෝජන දේපල ගොඩනැගීමේ පිරිවැය මනින ලදී.

SLFRS 16 අධිකාරියට අනුව 99 බදු දීම සඳහා ලබා දී ඇති ඉඩම මූල්‍ය බදු ලෙස වර්ගීකරණය කර ඉඩමේ රැගෙන යන වටිනාකම හඳුනා නොගෙන ලාභ අලාභ ගිණුම වෙත යම් ලාභයක් හෝ අලාභයක් හඳුනා ගත යුතුය. කෙසේ වෙතත්, වසර 99කට බදු දී ඇති ඉඩමේ ප්‍රායෝගික අයිතිය බදු කාලය අවසානයේ බදුකරු වෙත පැවරෙන්නේ නැති නිසාත්, රජයේ ආයතනයක් ලෙස අවශ්‍ය ඉඩම් තොරතුරු ගිණුම් පොත්වල පවත්වාගෙන යාමටත් සලකා බලමින්, අධිකාරිය විසින් සියලු දේ සටහන් කර ඇත. වසර 99 ක බදු කාලයකට බදු දී ඇති ඉඩම ඔවුන්ගේ ඓතිහාසික පිරිවැය මත වන අතර අනෙකුත් ඉඩම් නැවත තක්සේරු කර එය SLFRS සංක්‍රාන්තියේදී සැලකූ පිරිවැය ලෙස සලකනු ලැබීය. 2012 වර්ෂයේ සිට සිදු වූ අවසන් SFRS සංක්‍රාන්තියේ සිට මෙය සිදු විය.

1.4.6.5. ආයෝජන දේපල වෙත හෝ ඉන් මාරු කිරීම

භාවිතයේ වෙනසක් ඇති විට පමණක් ආයෝජන දේපල වෙත හෝ ඉන් මාරුවීම් සිදු කෙරේ. ආයෝජන දේපල සිට නිමිකරු පදිංචි දේපල හෝ තොග (WIP) වෙත මාරු කිරීම සඳහා, පසුව ගිණුම්කරණය සඳහා සැලකූ පිරිවැය භාවිතය වෙනස් වූ දිනයේ සාධාරණ වටිනාකම වේ. අයිතිකරු පදිංචි දේපල ආයෝජන දේපලක් හෝ තොග (WIP) බවට පත් වුවහොත්, අධිකාරිය විසින් දේපල, කම්හල් සහ උපකරණ යටතේ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව භාවිතය වෙනස් වන දිනය දක්වා එම දේපල සඳහා ගිණුම්ගත කරයි.

1.4.6.6 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය

සමාගම් සමූහය අනුබද්ධිත ආයතනයක ආයෝජන දේපලෙහි සැලකිය යුතු කොටසක් අත්පත් කරගෙන සිටින විට, එවැනි ආයෝජන දේපල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත සහ උපකරණ ලෙස සලකනු ලබන අතර, දේපල, පිරියත සහ උපකරණ සඳහා කණ්ඩායම් ගිණුම්කරණ ප්‍රතිපත්තිය භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

1.4.6.7 ආයෝජන දේපල වලින් ආදායම

ඉඩම් සහ ගොඩනැගිලි 99,50 හෝ 30 අවුරුදු බදු කාලීන පදනම සඳහා අධිකාරිය විසින් බාහිර පාර්ශ්වයකට කුලියට දෙනු ලබන අතර දේපල බදු/කුලී ආදායම හෝ ප්‍රාග්ධන අගය කිරීම සඳහා රඳවා තබා ගනී. ඒ අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය-LKAS 40 - "ආයෝජන දේපල" ප්‍රකාරව UDA හි මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ආයෝජන දේපල ලෙස මෙම ඉඩම් සහ ගොඩනැගිලි වර්ගීකරණය කර ඇති අතර කල්බදු වාරිකය කල්බදු කාලය තුළසරල මාර්ග පදනම මත හඳුනා ගැනේ.

1.4.7 කල්බදු

කිසියම් වූ එකඟතාවයක් කල්බදු ලෙස වර්ගීකරණය කරනු ලබනුයේ අදාල එකඟතාවයේ ස්වභාවය හා එමඟින් අදාල වත්කම පරිහරණය කිරීමට ලැබෙන අයිතිය සැලකිල්ලට ගැනීමෙනි.

- **මෙහෙයුම් කල්බදු - අධිකාරිය දීමනා කරු ලෙස**

  අධිකාරිය විසින් කිසියම් වත්කමක් සඳහා වූ සියලුම හෝ ප්‍රමාණාත්මක ප්‍රතිලාභ හා අවදානම් පැවරීමක් සිදුනොකල අවස්ථාවන් මෙහෙයුම් කල්බදු ලෙස සටහන් කල හැක.

  අදාල මෙහෙයුම් කල්බදුව සම්බන්ධයෙන් සාකච්ඡා සිදු කිරීම සඳහා වැයවන පිරිවැය අදාල මෙහෙයුම් වත්කමේ ඉදිරියට ගෙනා ශේෂය එකතු කිරීම කරනු ලබන අතර එය එම කල්බදු ගිවිසුම සඳහා වූ කාලපරිච්ඡේදය පුරා කුලී ආදායමක් මෙන් හඳුනාගැනීම සිදු කරයි. අධිකාරිය සතු වත්කමක් වන සෙත්සිරිපාය පරිශ්‍රය බොහෝ රාජ්‍ය ආමාත්‍යාංශ වෙත මෙහෙයුම් කල්බදු පදනම මත ලබා දී ඇති අතර ඉන් පරිභාහිරව අධිකාරිය කල්බදු දීමනාකරුවෙකු වශයෙන් දිවයිනපුරා ඉඩම් හා ගොඩනැගිලි රාශියක් මෙහෙයුම් කල්බදු ලෙස ලබාදෙමින් කුලී ආදායම් හා ප්‍රාග්ධන අගය ඉහළයාම් මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කරනු ලබයි.

1.4.8 සම්පූර්ණ කරන ලද URPCC නිවාස

ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දරන ලද සියලුම ප්‍රාග්ධන පිරිවැය අදාළ ව්‍යාපෘතියට වෙන වෙනම ප්‍රාග්ධනීකරණය කර ඇත. ඉදිකිරීම් කාලය තුළ ඉහත සියලු වියදම් ශේෂ පත්‍රයේ WIP යටතේ සටහන් කර ඇත. ඉදිකිරීම් අවසන් වූ පසු මේ වන විට ප්‍රාග්ධනීකරණය කර ඇති සියලුම වියදම් සම්පූර්ණ කරන ලද URPCC නිවාස ගිණුම් වෙත මාරු කර ඇත.

කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රවාහනය යනාදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සියලුම පුනරාවර්තන වියදම් සහ නිවාස ව්‍යාපෘතිවල නඩත්තු වියදම් වාර්ෂිකව ලාභ අලාභ ලෙස අය කර ඇත.

1.4.9 ප්‍රාග්ධන නොනිමි වැඩ

වාර්තා කරන ලද දිනට සම්පූර්ණ නොකරන ලද ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන නොනිමි වැඩ යටතේ පෙන්නුම් කර ඇති අතර වර්ෂය තුල වැඩ අවසන් කල හා භාවිතය සඳහා පවතින ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ යටතට මාරු කර ඇත.

1.4.10 ණය ගැනුම් පිරිවැය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 23 (LKAS 23) අනුව, ණයගැනුම් පිරිවැය සැදුම්ලත් වනුයේ, ඍජු මිළදී ගැනීම්, ඉදිකිරීම් හෝ සුදුසුකම්ලත් වත්කමක් නිපදවීම යනාදී වත්කමක කොටසක් ලෙස ප්‍රාග්ධනිත කිරීම වේ. ණය ගැනුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම නතර කරනුයේ, සුදුසුකම්ලත් වත්කම සම්පූර්ණයෙන් නිම කල පසුය.

1.4.11 තොග

තොග අගය කරනුයේ, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයට වේ. පිරිවැය ක්‍රමයේදී, බරතැබූ සාමාන්‍ය පිරිවැය පදනම භාවිතා කරන අතර එහි පිරිවැය ලෙස තොග මිළදී ගැනීමේ වියදම් හා ඒවා පවත්නා ස්ථානයට හා තත්වයට ගෙන ඒමට දරන ලද වියදම් අන්තර්ගතය.

1.4.12 සේවක ප්‍රතිලාභ

(අ) නිර්ණය කරන ලද දායක සැලසුම්

නිර්ණය කරන ලද දායක සැලසුමක් ලෙස හඳුන්වනු ලබන්නේ අධිකාරිය විසින් සේවකයින් සේවයෙන් ඉවත් වූ පසු ප්‍රතිලාභ ලැබෙන පරිදි සකසනු ලැබූ අරමුදලකි. මේ සඳහා නෛතික හෝ අර්ථ සාධක වගකීමක් අධිකාරිය විසින් දරනු නොලබයි. මෙලෙස අදාල දායක සැලැස්ම වෙනුවෙන් කරන ලද වියදම ආදායම් හා වියදම් ප්‍රකාශනයන්හි සඳහන් කරනු ලබන අතර පෙර ගෙවුම් මූල්‍ය ප්‍රකාශනයන්හි වත්කමක් ලෙස සටහන් කරනුයේ අනාගත ගෙවීම් වල සිදුවන්නා වූ අඩු වීමක් හේතුවෙනි.

(ආ) නිර්ණය කරන ලද දායක සැලසුම් - සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා දායක වන සේවකයන් ඒ සඳහා අදාල වන නීති හා රෙගුලාසි වලට යටත්වේ. මේ අනුව අධිකාරිය විසින් සම්පූර්ණ වේතනයෙන් 15% හා 3% වශයෙන් සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් සඳහා බැර කිරීම සිදු කරනු ලබයි.

(ඇ) නිර්ණය කරන ලද දායක සැලසුම් - පාරිතෝෂික

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි අංක 19 වන සේවක ප්‍රතිදාන යටතේ සේවයෙන් පසුව ලැබෙන ප්‍රතිදානයන් ලෙස නිර්ණය කල දායක සැලසුම් හැර අන් සියලු සැලසුම් අඩංගු වේ. මේ අනුව අධිකාරිය විසින් පාරිතෝෂික

ගෙවීම 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතට යටත්ව සිදු කල යුතුය. මේ අනුව අදාල සේවක පාරිතෝෂිකයන්සඳහා වූ වෙන්කිරීම සේවකයකු සේවයට බැඳී ප්‍රථම වසර තුළදීම සිදු කරනු ලබයි. පාරිතෝෂික සැලසුමක් මේ පරිද්දෙන් සේවකයකු හට ලැබෙනුයේ සේවකයා ආයතනය තුල සේවය කරනු ලැබූ කාලසීමාව හා තවත් බාහිර වූ කරුණු සැලකිල්ලට ලක්කිරීම මඟිනි. අදාල පාරිතෝෂික සැලසුම සඳහා වන වගකීමේ වර්තමාන අගය ශේෂපත්‍රයේ සඳහන් කරනු ලබයි. මේ අනුව සේවකයන් සඳහා වන පාරිතෝෂික වගකීම ගණනය කරනු ලබනුයේ වාර්ෂිකව ආයුගණන ක්‍රමය මත පුරෝකථනය කල ඒකක ණය ක්‍රමය මත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුවය. මෙලෙස නිර්ණය කරන ලද දායක සැලසුමේ වර්තමාන අගය ගනනය කරනු ලබන්නේ රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සඳහා යොදා ගනුලබන වට්ටම් අනුපාතය පදනම් කර ගැනීමෙනි. අදාල ආයුගණන ලාභය හෝ අලාභය මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීම සිදු කර එම ලාභය හෝ අලාභය සිදු වූ අවස්ථාවේදීම සිදු කරනු ලබයි.

1.4.12. වෙන්කිරීම්

අධිකාරිය විසින් වෙන්කිරීම් සිදුකරනු ලබනුයේ අතීතයේ සිදු කරනු ලැබූ ක්‍රියාවක් සම්බන්ධයෙන් වර්තමානයේ නෛතික හෝ ව්‍යවස්ථාපිත වගකීමක් පවතින අවස්ථාවන්හිදීය. මෙම වෙන්කිරීම සඳහා වූ අනාගත මූල්‍ය වැයකිරීම නිශ්චිත වශයෙන් ගණනය කල හැකි වීමද වෙන්කිරීමක් සිදුකිරීමට ප්‍රථමයෙන් සලකා බලනු ලබන කාරණයකි. එසේ සිදු කරනු ලබන වෙන්කිරීම් ශේෂපත්‍රයේ සටහන් කරනු ලබයි. වෙන්කිරීම් සඳහා ගණනයන් සිදුකරනු ලබනුයේ බදු පෙර වට්ටම් අනුපාතය උපයෝගි කර වෙළඳපොල වටිනාකම් මත අනාගතයේ සිදු වන මූල්‍ය වැය වර්තමාන අගයට ගැලපීම් මඟිනි.

1.13 විස්තීරණ ආදායම් ප්‍රකාශය

1.4.13.1. ආදායම්

(අ) කුලී ආදායම්

ආයෝජන දේපල තුලින් උපයනු ලබන කුලී ආදායම් කල්බදු ගිවිසුමට අනුව සරල මාර්ග ක්‍රමය අනුගමනය කරමින් ලාභාලාභ තුල හඳුනාගනු ලැබේ. ප්‍රදානය කරන ලද කල්බදු දිරිදීමනාව සමස්ත ආදායමෙහි සංකලිත කොටසක් වශයෙන් හඳුනාගෙන ඇත. උපකල්බදු වලින් උපයනු ලබන කුලී ආදායම් වෙනත් ආදායම් වශයෙන් හඳුනාගෙන ඇත.

(ආ) සේවා සැපයීම් සඳහා ගාස්තු

විදුලිය ගාස්තු , ජල ගාස්තු , තානායම් සඳහා ලැබෙන කළමණාකරණ ආදායම් හැර අනෙකුත් සේවා සැපයීම් සඳහා අයකරන සියළුම ගාස්තුන් මුදල් පදනම් මත ගිණුම්ගත කර ඇත.

(ඇ) අක් මුදල්

අධිකාරිය විසින් කල් බදු හෝ කුළී ආදායම් ලබන දේපළ සඳහා ලබා ගන්නා ලද අක් මුදල් අදාළ අක් මුදල ලැබුනු වර්ෂයේම ආදායමක් ලෙස හඳුනා ගනු ලබයි. කෙසේ වෙතත්, ගණුදෙණුකරුවෙකු හෝ රජය වෙනුවෙන් අධිකාරිය විසින් කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබෙන අක් මුදල් ව්‍යාපෘතිය අවසානයේදී ව්‍යාපෘති සංවර්ධන වියදම් සඳහා හිලව් කල යුතු බැවින් වගකීම් යටතේ පෙන්වනු ලබයි.

1.4.13.2. පොලි ආදායම්

සියලුම මූල්‍ය වත්කම්, පොලි රැඳවුම් මූල්‍ය වත්කම් විකිණීමට පදනම්ව පවත්නා වත්කම් ගණනය කරනු ලබනුයේ සඵල පොලි අනුපාතිකය යටතේය. මෙම සඵල පොලි අනුපාතිකය අනාගත මුල්‍ය ගෙවීම් සහ ලැබීම් මත පදනම්ව මූල්‍ය සුරැකුමේ සඳහන් කාලසීමාව හෝ කෙටිකාලිනව උචිත අයුරින් අදාල මූල්‍ය වත්කමේ ඉදිරියට රැගෙන එන ශේෂයට ගැලපීම් සිදු කරයි.

1.4.13.3 ලාභාංශ ආදායම්

ලාභාංශ ආදායම් ගිණුම් ප්‍රකාශයන්හි සටහන් කරනුයේ කොටස්හිමියන් හට ලාභාංශ හිමිකම් ලද අවස්ථාව තුලදීය.

1.4.13.4 වෙනත් ආදායම්

දේපල , පිරියත හා උපකරණ ඉවත් කිරීමකදී එසේ ඉවත් කරනු ලබන වත්කම්වල ධාරණ වටිනාකම් හා සම්බන්ධ වියදම් අඩුකල පසු පැන නඟිනු ලබන ලාභය හෝ අලාභය වෙනත් ආදායම් යටතේ හඳුනා ගත හැකිය. විදේශ මුදල් ලාභ හෝ අලාභ ශුද්ධ පදනමක් මත වාර්තා කර ඇත.

1.4.13.5 රාජ්‍ය ප්‍රදාන

රජයේ ප්‍රදාන සාධාරණ වටිනාකමක් යටතේ කල් දැමූ ආදායමක් ලෙස පිළිගනු ලබන්නේ ඒවා ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ කණ්ඩායම ප්‍රදානය හා සම්බන්ධ කොන්දේසිවලට අනුකූල වන අතර පසුව ක්‍රමානුකූලව වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය මත පදනම් ව රුපියල් 15,717,001 ක වෙනත් ආදායමක් ලෙස ලාභ හෝ අලාභ ලෙස පිළිගනු ලැබේ. සමූහයට දරන ලද වියදම් සඳහා වන්දි ලබා දෙන ප්‍රදාන, වියදම් හඳුනාගෙන ඇති එම කාලසීමාවන් තුළ ක්‍රමානුකූල පදනමක් මත ලාභ හෝ අලාභ ලෙස හඳුනා ගැනේ.

1.4.13.6 URPCC සහ මධ්‍යම ආදායම් කාණ්ඩය යටතේ නිවාස බැහැර කිරීමෙන් ලැබෙන ආදායම්

ශ්‍රී ලංකා රජයේ මහපෙන්වීම් අනුව, කොළඹ නගරයේ අඩු පහසුකම් සහිත ප්‍රජාවට වඩා හොඳ නවාතැන් සැපයීමේ ජාතික ව්‍යාපෘතියක් ලෙස අධිකාරිය විසින් කොළඹ නගරයේ නාගරික පුනර්ජනන ව්‍යාපෘතිය ආරම්භ

කරන ලද අතර දැරිය හැකි මිලකට නිවාස ඒකකයක් ලබාදීමේ අරමුණින් මධ්‍යම ආදායම් කාණ්ඩය සඳහා නිවාස වැඩසටහනක් ආරම්භ කරන ලදී.

SLFRS 15 අනුව, ඉහත ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායම හඳුනා ගැනීමට පියවර පහේ ආකෘතිය යෙදිය යුතුය.

- පියවර 01 - පාරිභෝගිකයා සමඟ ඇති ගිවිසුම හඳුනා ගන්න
- පියවර 02 - කොන්ත්‍රාත්තුවේ කාර්ය සාධන වගකීම් හඳුනා ගැනීම.
- පියවර 03 - ගනුදෙනු මිල තීරණය කරන්න
- පියවර 04 - ගනුදෙනු මිල වෙන් කරන්න
- පියවර 05 - කාර්ය සාධන වගකීමක් සම්පූර්ණ වූ විට ආදායම හඳුනා ගන්න

පොරොන්දු වූ වත්කම පාරිභෝගිකයෙකුට පැවරීමෙන් ආයතනය කාර්ය සාධන වගකීමක් ඉටු කරන විට (හෝ ලෙස) අධිකාරිය ලාභ හෝ අලාභය හඳුනා ගනී. පාරිභෝගිකයා එම වත්කමේ පාලනය ලබා ගන්නා විට (හෝ ලෙස) වත්කමක් මාරු කරනු ලැබේ. SLFRS 15 ට අනුව, කාර්ය සාධන වගකීමක් යම් අවස්ථාවක දී හෝ කාලයත් සමඟ සම්පූර්ණ විය හැකිය. මෙය කාලයත් සමඟ කාර්ය සාධන වගකීම සම්පූර්ණ කරන්නේද නැතහොත් යම් අවස්ථාවක කාර්ය සාධන වගකීම සම්පූර්ණ කරන්නේද යන්න කොන්ත්‍රාත්තුවේ ආරම්භයේදීම තීරණය වේ. ආයතනයක් කාලයත් සමඟ කාර්ය සාධන වගකීමක් සම්පූර්ණ නොකරන්නේ නම්, කාර්ය සාධන වගකීම යම් අවස්ථාවක දී සම්පූර්ණ වේ. ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරිය ඉහත නිවාස වැඩසටහනෙන් ලැබෙන ආදායම එම අවස්ථාවේ හඳුනා ගනී.

1.4.13.6. වියදම් හඳුනා ගැනීම

(අ) වෙනත් වියදම්

සමූහය පවත්වාගෙන යාම සඳහා දරණ වියදම් සහ දේපල , උපකරණ හා පිරියත කාර්යක්ෂමව පවත්වාගෙන යාමට දරන ලද නඩත්තු වියදම් වර්ෂයේ ලාභයට එළඹීම සඳහා ආදායමට ගලපන ලදී.

1.4.13.7. බදු

(අ) වර්තමාන බදු

වර්තමාන බදු වගකීම ගණනය කරනුයේ වර්තමාන කාල පරිද්ශේදය සහ පෙර කාල පරිවිශේදයන් සඳහා ගෙවීමට හෝ ප්‍රතිපූර්ණය කර ගැනීමට ඇති වටිනාකම් සැලකිල්ලට භාජනය කිරීම මගිනි. මෙලෙස බදු ගණනය කිරීම සඳහා යොදා ගනු ලබනුයේ අදාල කාල පරිවිශේදයට අදාලව පවත්නා වූ බදු ගණනය සම්බන්ධ බදු අනුපාත හා නීති සැලකිල්ලට ගැනීමෙනි.

නාගරික සංවර්ධන අධිකාරිය
2020.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා
වාර්ෂික ඒකාබද්ධ ගිණුම් සටහන්

වාර්තා කරන ලද දිනට බදු ගණනය කිරීම සඳහා බදු අනුපාතයන් හා බදු නීතීන් භාවිතා කර ඇත. දේශීය ආදායම් බදු පනතෙහි විධිවිධානයන්ට අනුව, මූල්‍ය ප්‍රකාශයන් තුල වාර්තා කරන ලද ආදායම් හා වියදම් පදනම් කරගෙන ආදායම් බදු වෙන්කිරීම ගණනය කර ඇත.

මූල්‍ය ප්‍රකාශයන් තුල මේ හා සම්බන්ධ අදාල තොරතුරු අනාවරණය කර ඇත.

මූල්‍ය වාර්තාකරණ අරමුණු උදෙසා වත්කම් හා වගකීම් වල ධාරණ වටිනාකමෙහි තාවකාලික වෙනස විලම්බිත බදු වශයෙන් හඳුනාගෙන ඇති අතර එලෙස හඳුනාගත් වටිනාකම් බදු අරමුණු උදෙසා භාවිතා කර ඇත. පහත දැ විලම්බිත බදු ලෙස හඳුනා නොගනී,

- තාවකාලිකව හඳුනාගත් ගණුදෙනු මගින් හටගත් ගිණුම් සහ බදු සඳහා බලනොපාන වත්කම් හා වගකීම් වල වෙනස්වීම්
- පරිපාලිත සමාගම් / බද්ධ ව්‍යාපාරයන් සඳහා කල ආයෝජනයන්හි තාවකාලික වෙනස්වීම්
- ප්‍රාථමික කීර්තිනාමය වාර්තා කිරීම මත හඳුනාගනු ලැබූ තාවකාලික බදු වෙනස්වීම්

1.5වෙනත් පොදු ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) සම්බන්ධ පාර්ශව සඳහා වන ගණුදෙනු

සම්බන්ධ පාර්ශව විසින් සිදු කරනු ලබන ගණුදෙනු මගින් මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වන බලපෑම මූල්‍ය ප්‍රකාශයන්හි සඳහන් කිරීම සිදු කරනු ලබයි.

අදාල තොරතුරු සටහන් අංක 33 යටතේ මූල්‍ය ප්‍රකාශන වල සටහන් කිරීම සිදු කරනු ලබයි.

1.6 සාධාරණ අගය නිර්ණය කිරීම

අධිකාරිය සතුව පවත්නා වත්කම් හා වගකීම් බහුතරයක් සාධාරණ අගය මත ගණනය කිරීම සිදු කරනු ලබයි.මේ සඳහා වන විස්තරාත්මක තොරතුරු හා උපකල්පනයන් අදාල සටහන් මගින් නිරූපනය කල හැක.

(අ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ වෙළඳපොල වටිනාකම මත ලැයිස්තුගත මිල පදනම් කොට සිදු කරනු ලබයි.

(ආ) ආයෝජන වත්කම්

අධිකාරියේ වෘත්තිමය සුදුසුකම් ලත් ස්වාධීන තක්සේරුකරුවන් මණ්ඩලයක් මගින් වත්කම් තක්සේරු කටයුතු වර්ෂ 2011 ජනවාරි මස 01 වන දිනට අදාලව සිදු කරන ලදි. ව්‍යාපාරයේ සාධාරණ වටිනාකම් වෙළඳපොල වටිනාකම් මත ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් විසින් එකඟ විය හැකි වටිනාකමක් මත අගය කොට ඇත.එසේම වෙළඳපොල ප්‍රතිලාභයන් අපේක්ෂිත කුලී ආදායමට ගැලපීම් මගින් වත්කම් අගය ගණනය කිරීම සිදු කරනු ලබයි. අධිකාරිය මගින් අයකරනු ලබන අපේක්ෂිත කුලී ආදායම් සහ සත්‍ය කුලී ආදායම් වෙනස්වන අවස්ථාවන්හිදී අදාල ගැලපීම් සිදු කිරීමද කරනු ලබයි.

නාගරික සංවර්ධන අධිකාරිය
2020.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා
වාර්ෂික ඒකාබද්ධ ගිණුම් සටහන්

තක්සේරු කිරීම අවශ්‍ය පරිද්දෙන්, අදාල වත්කමෙන් වර්තමාන පදිංචිකරුවන් නඩත්තු කිරීම්, රක්ෂණයන්, ඵලදායී ජීව කාලය යනාදී කරුණු රාශියක් පදනම් කොටගෙන ගණනය කිරීම සිදු කරනු ලබයි. මේ අනුව කිසියම් වූ බදුකුලී යාවත්කාලීන කිරීමක් තින්දු නොවූ අවස්ථාවකදී අදාල දැන්වීම් කටයුතු නියමිත කාලපරිච්ඡේදය තුලදී සිදු කිරීම කරනු ලබයි.

ඉදිකරනු ලබන ආයෝජන වත්කම් ගණනය කරනු ලබනුයේ නිශ්චය කරනු ලැබූ සාධාරණ අගයක් මත පදනම්ව අඩුකරනු ලැබූ ඉදිකිරීමට වැයවන අපේක්ෂිත පිරිවැය , මූල්‍ය පිරිවැය සහ ලාභාංතිකය සැලකීමට ගැනීමෙනි.

1.7 මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමෙන් පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන වාර්තා සටහන් කරනු ලබන දින සහ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන දිනයන් අතර වූ වෙනස් වීම් මෙමඟින් දක්වනු ලැබේ. මේ අනුව,ඉහත සඳහන් දිනයෙන් පසුව සිදු වන උචිත ගැලපීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් වශයෙන් දැක්වීම සිදු කරනු ලබයි.

		සමූහය		අධිකාරිය	
		දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31 දිනට
	උප සටහන	2020 රු.	2019 රු.	2020 රු.	2019 රු.
2. ආදායම්					
කුලී	2.1	2,341,115,970	2,183,760,058	1,734,607,117	1,766,194,297
සේවා සැපයීම් වෙනුවෙන් ලද ගාස්තු	2.2	603,238,645	1,040,984,295	602,397,842	815,406,522
ආහාර පාන ආදායම්		884,874,100	1,337,151,779	-	-
		3,829,228,714	4,561,896,132	2,337,004,958	2,581,600,819
3. ආයෝජන ආදායම්					
පොළී ආදායම්	3.1	1,801,319,802	1,911,461,962	1,772,299,233	1,886,207,657
ලභාංශ ලැබීම්	3.2	5,917,895	7,790,622	23,834,559	31,440,618
		1,807,237,697	1,919,252,584	1,796,133,792	1,917,648,276
4. වෙනත් ආදායම්					
වෙනත් ආදායම්	4.1	69,608,000	93,239,039	52,319,656	56,509,735
ගාඟ භාණ්ඩ/වාහන විකිණීමෙන් ලද ලාභ	4.3	21,282,454	19,986,172	21,282,454	19,986,172
මධ්‍ය ආදායම් නිවාස විකිණීමෙන් ලද ලාභ	4.4	1,073,750,142	459,989,308	1,073,750,142	459,989,308
නාගරික පුනර්ජීවන නිවාස විකිණීමෙන් ලද ලාභ	4.5	110,312,983	-	110,312,983	-
		1,274,953,579	573,214,520	1,257,665,235	536,485,211
5. පරිපාලන වියදම්					
වැටුප් හා වේතන		1,870,046,125	1,911,482,189	1,663,317,110	1,680,683,077
සේ.ඇ.ඇ./ සේ.ශා.ඇ. හා පාරිතෝෂික වැනි දෑ		305,888,646	291,965,613	266,910,817	252,224,322
කලින් ගෙවූ සේවක පිරිවැය		31,247,534	25,135,868	31,247,534	25,135,868
ප්‍රසාද දීමනා		48,022,737	112,105,822	23,947,688	69,957,634
නාවිකයට නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම්		79,168,427	63,814,703	78,905,166	63,814,703
සුභ සාධන ගෙවීම්		24,143,480	27,568,945	24,143,480	27,546,579
ගමන් වියදම්		16,585,022	34,825,432	16,394,671	33,471,552
කාර්යාල අවගතකා		117,194,650	137,724,264	110,944,118	127,027,734
අළුත්වැඩියා හා නඩත්තු වියදම්		384,919,296	393,298,196	328,023,808	353,992,812
විදුලි ගාස්තු		217,690,649	183,364,957	205,246,922	188,487,645
දුරකතන ගාස්තු		11,190,230	13,149,023	10,709,074	12,727,765
ජල ගාස්තු		7,751,999	12,324,549	5,604,556	9,275,745
සෞඛ්‍ය හා ඝනීපාරක්ෂණ සේවා		210,208,125	259,722,023	125,356,100	129,571,089
කුලී හා කුලීපිට ගාස්තු		70,627,173	89,461,126	69,706,573	88,510,416
ප්‍රවාහන, දැන්වීම්, ආරක්ෂක හා වෙනත් දෑ		211,090,838	357,844,715	109,748,188	216,588,788
ක්ෂය වෙන්කිරීම්		573,459,162	570,334,153	400,564,888	397,255,633
විගණන ගාස්තු		7,049,210	3,058,120	1,200,000	1,200,000
වරිපනම් හා බදු		9,459,386	12,218,363	5,173,255	5,983,735
රක්ෂණ ගාස්තු		13,322,779	12,195,776	10,073,669	9,464,862
සාමාජික හා දායක මුදල්		500,762	575,815	500,762	575,815
පාඩු හා ලියා හැරීම්		17,984,443	13,360,797	17,180,043	12,851,352
වෙනත්		7,515,355	29,676,903	5,746,200	26,352,815
නීති ගාස්තු		9,450	3,353,975	9,450	3,353,975
අධ්‍යක්ෂ ගාස්තු		1,656,805	3,273,526	-	-
		4,236,732,283	4,561,834,850	3,510,654,072	3,736,053,913
6. මූල්‍ය වියදම්					
බැංකු ණය මත පොළිය		148,891,015	209,942,553	5,612,080	-
බැංකු අධිරා මත පොළිය		11,214	2,773	11,214	2,773
බැංකු ගාස්තු		644,176	922,422	619,001	883,335
කල්බදු අවලංගු කිරීම් සඳහා පොළිය		-	(7,852)	-	(7,852)
ණයපත් වට්ටම් හා වෙනත්		8,769,880	11,209,569	-	-
		158,316,285	222,069,465	6,242,295	878,256
7. වෙනත් වියදම්					
ප්‍රදාන, පරිත්‍යාග හා වෙනත්		629,413	7,250,000	629,413	7,185,000
ජාතිය ගොඩනැඟීමේ බද්ද		-	63,555,986	-	50,645,607
ව්‍යාපෘති මෙහෙයුම් පිරිවැය- සටහන 36		16,023,413	49,064,138	16,023,413	49,064,138
		16,652,825	119,870,124	16,652,825	106,894,745
8. ආදායම් බදු					
වර්ෂය සඳහා වෙන් කිරීම්		300,368,270	367,483,319	278,640,653	338,560,798
විලම්බිත බදු ප්‍රතිලාභ / (අලාභ)		296,767,030	(220,908,278)	290,937,987	(217,317,935)
		597,135,300	146,575,041	569,578,640	121,242,863

		සමූහය		අධිකාරිය	
		දෙසැම්බර් 31 දිනට 2020 රු.	දෙසැම්බර් 31 දිනට 2019 රු.	දෙසැම්බර් 31 දිනට 2020 රු.	දෙසැම්බර් 31 දිනට 2019 රු.
2.1	**කුළී**				
2.1.1	මාසික කුළිය	1,249,597,323	1,222,700,468	812,743,521	770,004,270
2.1.2	බදු කුළී	526,286,995	582,482,268	580,369,285	618,419,146
2.1.3	බිම් කුළී	1,759,782	2,180,706	1,759,782	2,180,706
2.1.4	පරිශ්‍රයන් භාවිතය සඳහා කුළී	10,075,358	11,666,688	10,075,358	11,666,688
2.1.5	අත් මුදල් ලැබීම්	69,325,440	80,675,875	69,325,440	80,675,875
2.1.6	තාවකාලික කුළී	88,305,729	114,370,966	82,540,685	113,564,526
2.1.7	විදුලි ගාස්තු	395,765,344	169,683,086	177,793,047	169,683,086
		2,341,115,970	2,183,760,058	1,734,607,117	1,766,194,297
2.2	**විවිධ සේවා සැපයීම් වෙනුවෙන් ලද ආදායම්**				
2.2.1	සැලසුම් අනුමත කිරීමේ ගොඩනැගිලි අනුමත කිරීමේ ගාස්තු	281,419,481	376,882,011	281,419,481	376,882,011
2.2.2	නීති ගාස්තු	11,425,511	20,821,344	11,425,511	20,821,344
2.2.3	අනුකූලතා සහතික නිකුත් කිරීමේ පෙරසැරි ගාස්තු	25,001,573	33,245,677	25,001,573	33,245,677
2.2.4	රථ ගාල් ගාස්තු	45,289,003	53,884,506	45,289,003	53,884,506
2.2.5	නිර්මිත කටයුතු සඳහා මාරු ගාස්තුව	2,447,010	69,895,396	2,447,010	69,895,396
2.2.6	රේස් කෝස් වෙන්කරවා ගැනීමේ ගාස්තු	9,079,617	21,138,509	9,079,617	21,138,509
2.2.7	MRICC වෙන්කරවා ගැනීමේ ගාස්තු	675,000	5,643,919	675,000	5,643,919
2.2.8	බැද්දගාන තෙත්බිම් උද්‍යානයෙන් ගාස්තුව	5,733,409	7,095,657	5,733,409	7,095,657
2.2.9	අනවසර ඉදිකිරීම් ගාස්තු	6,688,492	13,013,810	6,688,492	13,013,810
2.2.11	නඩත්තු ගාස්තු	109,740	219,927,134	109,740	96,774
2.2.12	මූල්‍ය කළමනාකරණ ගාස්තු	1,375,000	1,517,850	1,375,000	1,517,850
2.2.13	කළමණාකරණ හා උපදේශන ගාස්තු	63,161,890	84,463,290	62,321,087	78,715,877
2.2.14	ඉරින සහතිකය නිකුත් කිරීම සඳහා සැකසුම් ගාස්තු	41,663,341	6,000	41,663,341	6,000
2.2.15	ගොඩනැගිලි භාවිතය වෙනස් කිරීමේ ගාස්තු	67,831,218	111,107,707	67,831,218	111,107,707
2.2.15	කල්බදු මත සේවා ගාස්තු	9,069,950	8,213,100	9,069,950	8,213,100
2.2.16	ගෘහ නිර්මාණ ශිල්පී ගාස්තු	30,419,623	11,739,101	30,419,623	11,739,101
2.2.17	පරිසනක සේවා සැපයීමේ ගාස්තු	1,848,786	2,395,285	1,848,786	2,395,285
		603,238,645	1,040,990,295	602,397,842	815,412,522

		සමූහය		අධිකාරිය	
		දෙසැම්බර් 31 දිනට 2020 රු.	දෙසැම්බර් 31 දිනට 2019 රු.	දෙසැම්බර් 31 දිනට 2020 රු.	දෙසැම්බර් 31 දිනට 2019 රු.
3.1	**පොළී ආදායම**				
3.1.1	කාලීන තැන්පතු පොළී	1,681,049,664	1,786,741,431	1,653,303,481	1,762,853,320
3.1.2	ප්‍රති මිලදී ගැනුම් පොළී	73,773,559	86,554,984	71,929,173	84,618,790
3.1.3	ඉනිරි කිරීමේ තැන්පතු	658	631	658	631
3.1.4	සේවක ණය පොළී	40,937,669	37,129,156	40,937,669	37,129,156
3.1.5	බදු කුළී සඳහා පොළී	2,964,401	294,901	3,534,401	864,901
3.1.6	නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘති ණය පොළී	2,593,851	740,860	2,593,851	740,860
		1,801,319,802	1,911,461,962	1,772,299,233	1,886,207,657
3.2	**ලාභාංශ**				
3.2.1	සීමාසහිත ඔෂාලි හෝල්ඩිංස් සමාගම	-	-	17,916,664	23,649,996
3.2.2	ලංකා විදුලි සමාගම (පුද්)	5,894,854	7,773,347	5,894,854	7,773,347
3.2.4	S.I.T.S.T. අරමුදල	23,041	17,275	23,041	17,275
		5,917,895	7,790,622	23,834,559	31,440,618
4.1	**වෙනත් ආදායම්**				
4.1.1	නැවත නොගෙවන වෙන්ඩර් තැන්පතු	4,374,380	18,752,327	4,374,380	15,485,327
4.1.2	ප්‍රමාද ගෙවීම් සඳහා දඩ මුදල්	37,988,950	2,935,281	37,988,950	2,935,281
4.1.3	කඩා දැමීමේ ගාස්තු	100,000	329,000	100,000	329,000
4.1.4	විවිධ	(32,982,330)	21,174,331	(35,466,373)	17,811,762
4.1.5	වෙනත් විවිධ ආදායම්	138,083	865,638	136,971	865,402
4.1.6	ප්‍රකාශන විකිණීම්	142,954	264,885	142,954	264,885
4.1.7	කාර්යාල මණ්ඩලයෙන් ලද විවිධ ආදායම්	19,000	37,635	19,000	37,635
4.1.8	රබර් විකිණීමෙන් ලද ආදායම්	18,497,556	18,686,877	18,497,556	18,686,877
4.1.9	මිල්ලැවවත්ත කෘෂි අස්වැන්න විකිණීමෙන් ලද ආදායම්	-	87,565	-	87,565
4.1.10	හරිත සහතිකය නිකුත් කිරීම සඳහා සැකසුම් ගාස්තු	-	-	-	-
4.1.11	සාමාජික ගාස්තු	1,126,099	2,035,872	-	-
4.1.12	ශාලා කුලියට දීමේ ආදායම් හා වෙනත් ආදායම්	13,677,090	28,063,627	-	-
4.1.13	ලංසු බැඳුම්කර අවලංගු කිරීම	1,000,000	-	1,000,000	-
4.1.14	දීඝකාලීන ණයගැතියන් මත P/L වෙත ආපසු ලියා ඇති මුදල	25,526,218	-	25,526,218	
		69,608,000	93,233,039	52,319,656	56,503,735
4.3	**ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම**				
	ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම	21,282,454	19,986,172	21,282,454	19,986,172
	අඩුකලා : විකුණන ලද ස්ථාවර වත්කම් වල පිරිවැය	(12,393,878)	(19,265,571)	(12,393,878)	(19,265,571)
		8,888,576	720,601	8,888,576	720,601
	එකතු කලා : විකුණන ලද ස්ථාවර වත්කම් වල සමුච්චි	12,393,878	19,265,571	12,393,878	19,265,571
	ස්ථාවර වත්කම් විකිණීමෙන් ලාභය	21,282,454	19,986,172	21,282,454	19,986,172
4.4	**නාගරික පුනර්ජීවන නිවාස විකිණීමෙන් ලද ලාභ**				
	මධ්‍ය ආදායම් නිවාස විකිණීමෙන් ලද ලාභ	6,020,613,791	1,709,575,000.00	6,020,613,791	1,709,575,000.00
	අඩු: විකුණන ලද ගොඩනැගිලි පිරිවැය	(4,946,863,650)	(1,249,585,691.71)	(4,946,863,650)	(1,249,585,691.71)
	මෙම වසර සඳහා ලාභය	1,073,750,142	459,989,308.29	1,073,750,142	459,989,308.29
		1,073,750,142	459,989,308.29	1,073,750,142	459,989,308.29

ශ්‍රී ලංකා රජයේ මහජනවීම අනුව, දැරිය හැකි මිලකට නිවාස ඒකකයක් ලබාදීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මධ්‍යම ආදායම් කාණ්ඩය සඳහා නිවාස වැඩසටහනක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපෘතිය 2015 වසරේ බොරැල්ලේ රජයේ සේවක නිවාස යෝජනා ක්‍රමය ලෙස ප්‍රධාන ව්‍යාපෘතිය ලෙස ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව URPCC යටතේ අංගොඩදී ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිය මධ්‍යම ආදායම් කාණ්ඩයේ නිවාස ව්‍යාපෘතිය බවට පත් කරන ලදී .

නාගරික සංවර්ධන අධිකාරිය විසින් එම ව්‍යාපෘතිවල නිවාස ඒකක පෙර විකිණීම් හරහා එකතු කරන අක් මුදල් වලින් මෙම නිවාස වැඩසටහන සඳහා අරමුදල් සපයනු ලැබේ. ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා දරන ලද සියලුම ප්‍රාග්ධන පිරිවැය ව්‍යාපෘතිය සඳහා වෙන වෙනම ප්‍රාග්ධනීකෘත කර තිබේ .

මධ්‍යම ආදායම්ලාභී නිවාස වූ බොරැල්ලේ ඔවල් විව් රෙසිඩන්සිස් හි නිවාස සංඛ්‍යාව 608 ක් සමාලෝචනය යටතේ බැහැර කර ඇත . නිවාස 608 ක් සඳහා වූ විකුණුම් සලකා බැලීම් රුපියල් 5,936,743,750 ක් වූ අතර වියදම් රුපියල් 4,731,240,306 ක් විය.

4.5	**URPC නිවාස විකිණීමෙන් ලාභය**				
	URPC නිවාස විකිණුම්	719,000,000	3,683,000,000	719,000,000	3,683,000,000
	අඩු: විකුණන ලද ගොඩනැගිලි පිරිවැය	(608,687,017)	(4,126,078,239)	(608,687,017)	(4,126,078,239)
	පෙර වසරට අදාළ ලාභය / (අලාභය)	110,312,983	(443,078,239)	110,312,983	(443,078,239)
	මෙම වසර සඳහා ලාභය	-	-	-	-
		110,312,983	(443,078,239)	110,312,983	(443,078,239)

8. (අ) යන්ත්‍ර සූත්‍ර පිරියක හා උපකරණ (අධිකාරිය සඳහා)

	ඉඩම	ගොඩනැගිලි	පිරියක හා උපකරණ	ලී බඩු හා සවිකිරීම්	මොටර් රථ	පද්ධති සහ මෘදුකාංග	යතුරුපැදි	කාර්යාල උපකරණ	පුස්ථකාල පොත්	එකතුව
පිරිවැය **01/01/2019** දිනට	90,883,000	1,699,204,256	429,706,495	440,008,825	86,785,312	5,158,424.00	469,752	587,339,289	1,599,636	3,341,154,990
ක්ෂය **01/01/2019** දිනට	-	266,362,251	314,894,328	180,113,374	84,503,802	160,974.00	242,828	396,688,955	1,580,888	1,244,547,400
ශුද්ධ අගය **01/01/2019** දිනට	**90,883,000**	**1,432,842,005**	**114,812,167**	**259,895,451**	**2,281,510**	**4,997,450.00**	**226,924**	**190,650,334**	**18,748**	**2,096,607,590**

පිරිවැය	ඉඩම	ගොඩනැගිලි	පිරියක හා උපකරණ	ලී බඩු හා සවිකිරීම්	මොටර් රථ	පද්ධති සහ මෘදුකාංග	යතුරුපැදි	කාර්යාල උපකරණ	පුස්ථකාල පොත්	එකතුව
2019/01/01 දිනට ශේෂය	90,883,000	1,699,204,256	429,706,495	440,008,825	86,785,312	5,158,424	469,752	587,339,289	1,599,636	3,341,154,989
මිලදී ගැනීම්	-	-	3,915,270	43,891,966	219,500	6,359,188	-	45,105,210	-	99,491,135
ඇලවුම්	-	**901,840,885**	(1,449,135)	(9,013,031)	219,500	-	(219,100)	9,245,308	-	900,624,427
බැහැර කිරීම්	-	-	-	(1,244,256)	(14,613,308)	-	-	(3,408,007)	-	(19,265,571)
2019/12/31 දිනට ශේෂය	**90,883,000**	**2,601,045,141**	**432,172,630**	**473,643,504**	**72,611,004**	**11,517,612**	**250,652**	**638,281,800**	**1,599,636**	**4,322,004,980**

ක්ෂය වෙහෙ කිරීම්	ඉඩම	ගොඩනැගිලි	පිරියක හා උපකරණ	ලී බඩු හා සවිකිරීම්	මොටර් රථ	පද්ධති සහ මෘදුකාංග	යතුරුපැදි	කාර්යාල උපකරණ	පුස්ථකාල පොත්	එකතුව
2019/01/01 දිනට ශේෂය	-	266,362,251	314,894,328	180,113,374	84,503,802	160,974.00	242,828	396,688,955	1,580,888	1,244,547,400
අයකිරීම්	-	33,486,078	47,554,859	38,089,706	84,142	1,506,610	5,880	63,537,370	5,749	184,270,394
ඇලවුම්					7,317		(7,317)			-
ඉවත්කිරීම් මත ලියාහැරීම්	-	-	-	(1,244,256)	(14,613,308)	-	-	(3,408,007)	-	(19,265,571)
2019/12/31 දිනට ශේෂය	**-**	**299,848,329**	**362,449,187**	**216,958,824**	**84,587,944**	**1,667,584**	**248,708**	**456,818,318**	**1,586,637**	**1,409,552,223**

2019/12/31 දිනට ශේෂය	**90,883,000**	**2,301,196,813**	**69,723,443**	**256,684,680**	**(11,976,940)**	**9,850,028**	**1,944**	**181,463,482**	**12,999**	**2,912,452,758**

පිරිවැය	ඉඩම	ගොඩනැගිලි	පිරියක හා උපකරණ	ලී බඩු හා සවිකිරීම්	මොටර් රථ	පද්ධති සහ මෘදුකාංග	යතුරුපැදි	කාර්යාල උපකරණ	පුස්ථකාල පොත්	එකතුව
2020/01/01 දිනට ශේෂය	90,883,000	2,601,045,141	432,172,630	473,643,504	72,611,004	11,517,612	250,652	638,281,800	1,599,636	4,322,004,980
23A:1R:9.05P සහ 1A:3R:34.02P ආවරණය වන පරිදි වසර 99ක් සහ අවුරුදු 20ක කාලයක් සඳහා පිළිවෙලින් රුපියල් 4,275,046,730 සහ රුපියල් 80,000,000බදු පදනම යටතේ ඉඩම් කට්ටි 2ක් බදු දීම් සඳහා UDA සමාගම වෝටර්ස් එජ් සමාගම් සමඟ බදු ගිවිසුමකට එළැඹ ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන 35 හි අනාවරණය කර තිබීම හැර වෙනත් සම්බන්ධිත පාර්ශවීය ගනුදෙනු කිසිවක් නොතිබුණි.

37 මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය **(MRICC)**
මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සාම්ප්‍රදායික මධ්‍යස්ථානයේ වත්කම් වටිනාකම UDA වත්කම් පදනමට පවරා ගැනීමේ ක්‍රියාවලියක පවතී. කෙසේ වෙතත්, පරිපාලන කටයුතු UDA විසින් සිදු කරනු ලබන බැවින්, පරිපාලන වියදම් යටතේ නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රුපියල් මිලියන 23.5ක් පටහන් කර ඇති අතර පරිශ්‍රයේ පැවති කාර්යයන් කුළින් රුපියල් මිලියන 0.67ක ආදායමක් UDA වෙත ලැබී ඇත. මෙම ආදායම විවිධ ආදායම්

38 මීතොටමුල්ල ව්‍යාපෘතිය
මීතොටමුල්ල ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය සඳහා 2020 වර්ෂය සඳහා දරන ලද මුදල රු. 82.96 ක් සහ ඉහත පිරිවැයෙන් රුපියල් මිලියන 2.58 ක් පරිපාලන වියදම් යටතේ පෙන්වා ඇත.තවද, එම ව්‍යාපෘති සඳහා දරන ලද ප්‍රාග්ධන ස්වභාවය වියදම් රුපියල් මිලියන 80.37 ක් කෙරෙහෙන යන වැඩ ගිණුම් යටතේ ද ඉතිරිය දේපල පිරියත සහ උපකරණ යටතේ ද දක්වා ඇත.

39 වෙනත් වියදම්- ව්‍යාපෘති මෙහෙයුම් පිරිවැය
නාගරික සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති ලෙස වර්ගීකරණය කළ නොහැකි ව්‍යාපෘති අවසන් වූ පසු දරන ලද ප්‍රාග්ධන ස්වභාවය වියදම් සාමාන්‍යයෙන් ආදායම් සහ වියදම් ගිණුමට අය කෙරේ. කෙසේ වෙතත්, මිල්ලැව වත්ත අත්පත් කර ගැනීම් අක්කර 735 ක භූමි ප්‍රමාණයක සිදුවෙමින් පවතින අතර යෝජිත සංවර්ධන කටයුතු තවමත් ආරම්භ කර නොමැත. නමුත් මෙම දේපල රබර් කිරි විකිණීමෙන් උපයා ඇති අතර කෘෂි අස්වැන්න රුපියල් මිලියන 18.4 ක් වන අතර එය වෙනත් ආදායම් යටතේ පෙන්වා ඇති අතර එම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම් රුපියල් මිලියන 23.61 ක මුදල ව්‍යාපෘති

40 **URPCC** නිවාස බැහැර කිරීම් සම්බන්ධ පිරිවැය වර්ගීකරණය

Project Name	No. of Disposal Houses	Balance houses as at 01/01/2020	Sale Consideration (Rs)	Total Cost (Rs)	Disposal cost per house	Total Disposal Cost	Profit / Loss (Rs)
	a	b	c	d	e=(d/b)	f = e* a	g = c-f
Lakhiru Sewana	171	798	684,000,000	2,706,384,562	3,391,459	579,939,549	104,060,451
Siyapath Sewana	7	709	35,000,000	2,911,707,788	4,106,781	28,747,468	6,252,532
	178		719,000,000			608,687,017	110,312,983

41 හානිකරණය සඳහා වෙන් කිරීම්

සාමාන්‍යයෙන් අලාභ සිදුවීමක් වන විත්තකම් පිළිබඳ අධිකාරියේ වෛෂයික සාක්ෂි මත දුර්වල වීම් පදනම් විය යුතුය. කුලී, බද්ද, කානායම් සහ අනෙකුත් ණය ගැතියන්ගේ ආබාධ පහත පරිදි ගණනය කර ඇත. මූල්‍ය විත්තකම් පහත පරිදි සිදු කරනු ලැබේ.

කුලී සහ කල්බදු ණයගැතියෝ	
අක්‍රිය ණයගතියන් සඳහා සම්පූර්ණ හානිකරණය (100%)	118,003,320
අවුරුදු 1ට වැඩි ණයගැතියන් සඳහා සම්පූර්ණ හානිකරණය (100%)	145,083,748
මාස 11-12 අතර ණය ගැතියන් සඳහා 77% ක හානිකරණය	21,354,077
මාස 9-10 අතර ණය ගැතියන් සඳහා 55% ක හානිකරණය	24,199,109
මාස 7-8 අතර ණය ගැතියන් සඳහා 45% ක හානිකරණය	25,752,701
මාස 5-6 අතර ණය ගැතියන් සඳහා 35% ක හානිකරණය	23,196,911
මාස 3-4 අතර ණය ගැතියන් සඳහා 21% ක හානිකරණය	10,657,201
මාස 2 ට අඩු හෝ සමාන ණය ගැතියන් සඳහා 6% ක හානිකරණය	19,763,250
100% ක දඩ මුදල් සඳහා වෙන් කිරීම	178,336,460
	566,346,777
ගැලපීම්	(48,783,050)
තාන්නායම් ණය ගැතියන් සඳහා සම්පූර්ණ හානිකරණය (100%)	114,065,409
සංවර්ධන වියදම් ණය ගැතියන් සහ අනෙකුත් ණය ගැතියන් සඳහා හානිකරණය	256,707,195
2020 වසර තුළ ලියාහැරීම්	(62,768,128)
2019/12/31 වන දිනට ණයගැතියන් සඳහා සම්පූර්ණ හානිකරණය	**825,568,203**

2022 වර්ෂය තුළ UDA හි BOM විසින් රු.62,768,128.37ක් රාජ්‍ය සංවිධානයට ලැබිය යුතු දිගු හිඟ ණය ගැතියන් කපා හැරීම් සඳහා එහි රැස්වීම් අංක 77/2022 සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව මෙම ප්‍රකාශයෙන් රුපියල් 62,768,128.37ක් කපා හැර ඇත.

42 පිටිපන මාහේන්වත්තේ ඉඩම් බැහැර කිරීම්

පිටිපන මාහේන්වත්තේ ඉඩමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට වෙන් කර ඇති අතර 2019 වසරේ සිට වාර්ෂික වාරික හතරකින් රුපියල් මිලියන 2,701ක් ගෙවීමට UGC එකඟ වී ඇත. කෙසේ වෙතත්, UGC වෙතින් ලැබිය යුතු රුපියල් මිලියන 675ක් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා දී නොමැත.

කෙසේ වෙතත්, මාහේන්වත්ත ඉඩම සඳහා ගෙවිය යුතු ඇස්තමේන්තුගත වන්දි මුදල 2019 මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත.

43 අවණ්ඩ වගකීම් සහ වෙනත්

UDA ආයතනය Sanken Construction (pvt) Ltd සමඟ ගිවිසුම්ගත ගිවිසුමකට එළඹ ඇත. හෝටලයක් ඉදිකිරීම සඳහා අංක 182 කින් සමන්විත වේ. 2019 වර්ෂයේදී වෝටර්ස් එජ් වෙනුවෙන් අමතර පහසුකම් සහිත කාමර. කෙසේ වෙතත්, පසුව, ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති අතර තවමත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව පැවසිය.

එම කොන්ත්‍රාක්කරු වන M/S Sanken Construction Company Ltd. විසින් UDA ආයතනයට එරෙහිව වාණිජ මහාධිකරණයේ නඩුවක් ගොනු කර ඇත්තේ ඉදිකිරීම් කටයුතු සඳහා තමන් දරන ලද වියදම් සඳහා වන්දියක් ලෙස රුපියල් 180,600,000/- ක මුදලක් ඉල්ලා සිටින ලෙසයි. ඒ අනුව 2020 වර්ෂයේදී වෝටර්ස් එජ් සමාගම විත්තිකරුවෙකු ලෙස ඇතුළත් කරන ලෙස අධිකරණය පෙත්සම්කරුට දන්වා ඇති අතර එදින සිට වාණිජ මහාධිකරණය විසින් ලබාදුන් උපදෙස් පරිදි එය සිදුකිරීමට Sanken Construction (Pvt) Ltd සමාගම කටයුතු කර නොමැත. 28/11/2022 දක්වා. එබැවින්, 2020 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සපයා නොමැත.

44 අනුබද්ධ සමාගම්වල ලාභ සහ අලාභ ප්‍රකාශයේ සාරාංශය

	වෝටර්ස් එජ් ලිමිටඩ්	නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) සමාගම	සීමාසහිත ලංකා රෙස්ට් හවුස්
	රු.	රු.	රු.
ආදායම්	**1,312,520,425**	**672,526,558**	**27,898,354**
යෙදුම් වියදම්	**(431,996,847)**	-	**(3,141,841)**
දළ ලාභය	**880,523,578**	**672,526,558**	**24,756,513**
වෙනත් ආදායම්	**47,953,082**	**10,193,231**	**6,035,764**
පරිපාලන වියදම්	**(583,851,014)**	**(133,917,911)**	**(20,585,300)**
විකිණීමේ හා අලෙවි වියදම්	**(56,738,253)**	-	-
වෙනත් වියදම්	**(125,897,553)**	**(14,750,984)**	-
මෙහෙයුම් කටයුතු වලින් ලද ප්‍රතිඵල	**161,989,840**	**534,050,894**	**10,206,977**
මූල්‍ය පිරිවැය	**(1,577,153)**	**(213,924,586)**	-
කොටස් හිණුම්ගත ආයෝජකයන්ගේ ලාභයේ කොටස			
බදු පෙර ලාභය	**160,412,687**	**320,126,308**	**10,206,977**
ආදායම් බදු වියදම්	**(26,788,794)**	**3,047,644**	**(1,591,028)**
වර්ෂය සඳහා ලාභය / (අලාභය).	**133,623,893**	**323,173,952**	**8,615,949**

45 ආශ්‍රිත සමාගම්වල ලාභ සහ අලාභ ප්‍රකාශයේ සාරාංශය

	සටහන	ඔෂන් වීව් ඩිවලොප්මන්ට් කම්පනි පුද්ගලික සමාගම රු	ඔනාලි හෝල්ඩින්ස් පීඑල්සී රු
ආදායම්	2	**1,254,504,766**	**180,137,952**
සෘජු වියදම්	3	(348,227,788)	-
දළ ලාභය		**906,276,978**	**180,137,952**
වෙනත් ආදායම්		106,622,564	70,387,138
රාජ්‍ය ප්‍රදාන			129,175,899
පරිපාලන වියදම්	4	(760,245,956)	(64,254,573)
විකිණීමේ හා අලෙවි වියදම්		(55,775,660)	-
වෙනත් වියදම්	6	(28,173,097)	-
මෙහෙයුම් කටයුතු වලින් ලද ප්‍රතිඵල		**168,704,829**	**315,446,416**
මූල්‍ය පිරිවැය	5	**(15,296,656)**	-
බදු පෙර ලාභය		**153,408,173**	**315,446,416**
ආදායම් බදු වියදම්	7	(21,477,144)	(373,383,263)
වර්ෂය සඳහා ලාභය / (අලාභය)		**131,931,029**	**(57,936,847)**
වෙනත් විස්තීරණ ආදායම්			
පශ්චාත් රැකියා ප්‍රතිලාභ වගකීම් ප්‍රතිගණනය කිරීමේදී ලාභය/(අලාභය).			46,550
ගොඩනැගිල්ල නැවත තක්සේරු කිරීමේදී ලාභය/(අලාභය).			4,440,000
වෙනත් විස්තීර්ණ ආදායම් මත බද්ද			(1,256,234)
වර්ෂය සඳහා මුලු අනෙකුත් විස්තීරණ ලාභය/ (අලාභය).			3,230,316
වර්ෂය සඳහා සම්පූර්ණ විස්තීරණ ලාභය / (අලාභය).			**(54,706,531)**

4.3. වසර 10 තුල සාරාංශ වාර්තාව (මූල්‍ය තත්වයේ ප්‍රකාශය, විස්තීරණ අදායම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය)

මූල්‍ය තත්වය ප්‍රකාශයේ සාරාංශය


වර්ගීකරණය	2020	2019	2018	2017	2016	2015	2014	2013	2012	2011
රු (මිලියන)										
වත්කම්										
ජංගම නොවන වත්කම්	163,277	166,075	155,570	144,921	131,956	125.197	116,905	99,410	95,659	9,437
ජංගම වත්කම්	32,600	30,640	32,229	27,328	12,355	9,578	17,031	15,771	16,068	14,829
මුළු වත්කම්	**195,877**	**196,715**	**187,799**	**172,249**	**144,311**	**134,775**	**133,936**	**115,181**	**111,727**	**24,267**
කොටස් හා සංචිත										
ප්‍රාග්ධනය	100	100	100	100	100	100	100	100	100	100
රජයේ ශුද්ධ දායකත්වය	907	922	938	954	970	986	1,001	1,015	1,030	1,044
සංචිත	76,912	75,636	88,485	83,265	74,767	74,930	75,140	73,851	77,763	(1,167)
ජංගම නොවන වගකීම්	93,919	95,582	63,648	61,699	33,253	31,094	30,955	32,975	27,555	20,845
ජංගම වගකීම්	24,040	29,475	34,628	26,231	35,221	27,665	26,740	7,239	5,278	3,444
සමස්ත කොටස් සහ වගකීම්	**195,877**	**196,715**	**187,799**	**172,249**	**144,311**	**134,775**	**133,936**	**115,181**	**111,727**	**24,267**

විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශයේ සාරාංශය

2011 සිට 2020 දක්වා කාලය සඳහා අධිකාරියේ සාරාංශගත ආදායම් හා වියදම් ප්‍රකාශය පහත පරිදි වේ.

පසුගිය වසර 10 තුල අධිකාරියේ ආදායම් සහ වියදම් විශ්ලේෂණය

වර්ගීකරණය	2020	2019	2018	2017	2016	2015	2014	2013	2012	2011
					Rs. (Mn.)					
ආදායම්	2,337	2,582	2,457	2,227	1,749	1,757	2,352	1,350	1,055	816
වෙනත් මෙහෙයුම් ආදායම්	3,053	2,454	2,339	1,673	2,562	464	779	1,550	822	633
සමස්ත ආදායම	**5,390**	**5,036**	**4,796**	**3,900**	**4,311**	**2,221**	**3,131**	**2,900**	**1,877**	**1,449**
ආයතනික හා පරිපාලන වියදම්	(3,510)	(3,736)	(3,654)	(2,814)	(2,415)	(2,082)	(1,903)	(1,935)	(1,423)	(1,201)
වෙනත් මෙහෙයුම් වියදම්	(17)	(107)	(182)	(70)	(353)	(75)	(492)	(36)	(23)	(18)
මූල්‍ය පිරිවැය	(6)	(1)	(29)	(812)	(1,426)	(263)	(1)	(1)	(1)	(2)
මූල්‍ය පිරිවැයට පසු මෙහෙයුම් ලාභය / (අලාභය)	1,857	1192	931	204	117	(199)	755	928	430	228
මෙහෙයුම් නොවන ආදායම්	16	16	16	16	16	16	14	14	14	14
බදු වලට පෙර ලාභය / (අලාභය)	**1,873**	**1,207**	**947**	**220**	**133**	**(183)**	**749**	**942**	**444**	**242**
බදු / කල් දැමූ බදු ආදායම මත වියදම්	(570)	(121)	(178)	(122)	65	(51)	(284)	(247)	(31)	(174)
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය / (අලාභය)	**1,303**	**1,086**	**769**	**98**	**198**	**(132)**	**(1,033)**	**695**	**413**	**69**
සැබෑ ලාභය / (පාඩුව)	(26)	(26)	(14)	7	22	(8)	(3)	(52)	(1)	-
වර්ෂය සඳහා සමස්ත ආදායම	**1,277**	**1,060**	**755**	**105**	**220**	**(141)**	**1,030**	**643**	**412**	**69**


ආදායම් සහ වියදම් විශ්ලේෂණය
6,000
5,000
4,000
3,000
2,000
1,000
0
-1,000
2020
2019
2018
2017
2016
2015
2014
2013
2012
2011
Total Revenue
Total Expenditure
Profit / (Loss)

මුදල් ප්‍රවාහ ප්‍රකාශවල සාරාංශය

2011 සිට 2020 දක්වා අධිකාරියේ සාරාංශ මුදල් ප්‍රවාහ ප්‍රකාශ පහත පරිදි වේ.

වර්ගීකරණය	2020	2019	2018	2017	2016	2015	2014	2013	2012	2011
Rs.(Mn.)										
ආදායම් බදු වලට පෙර ශුද්ධ ලාභය / (අලාභය)	1,873	1,208	947	220	133	(183)	749	942	444	242
ගැලපීම්	(4,249)	(3,695)	3,234	(2,423)	(1,621)	(1,212)	(2,121)	(1,634)	(953)	(732)
කාරක ප්‍රාග්ධනයට පෙර මෙහෙයුම් (අලාභය)	(2,376)	(2,487)	(2,287)	(2,203)	(1,488)	(1,395)	(1,372)	(692)	(509)	(490)
කාරක ප්‍රාග්ධන වෙනස්කම්	3,830	4,948	(2,075)	5,361	5,410	4,523	(1,484)	1,119	1,345	(1,385)
මෙහෙයුම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	2,410	1,630	(1,150)	21.052	5,908	4,677	1,434	5,345	6,089	1,474
ආයෝජන වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(8,918)	(11,407)	(3,150)	(24,461)	(6,764)	(15,428)	(4,493)	(5,945)	(14,270)	(4,137)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	4,989	7,035	4,332	4,638	(240)	10,682	3,522	(75)	452	914
මුදල් හා මුදල් වලට සමාන	(65)	(12)	32	1,229	(1,096)	(69)	463	(675)	(7,729)	(1,749)

දෑ වල ශුද්ධ වැඩිවීම										
වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	27	38	6	(1,223)	(127)	(57)	(520)	(155)	7,884	9,633
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	(38)	26	38	6	(1,223)	(127)	(57)	(520)	155	7,884



4.4 ආයතනික පාලනය

නාගරික සංවර්ධන අධිකාරිය තම විෂය පථයට අයත් සංවර්ධන කාර්යයන් ඉටු කිරීමේදී සමාජ හා ආර්ථික පරිසරයේ ප්‍රශස්ත සංවර්ධනයක් ඇති කිරීමේ මූලික අරමුණ ඇතිව ක්‍රියාත්මක වේ. කළමනාකරණ මණ්ඩලය, ඉහළ කළමනාකාරීත්වය සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සමඟ සමීප සහයෝගයෙන් විනිවිදභාවය සහ වගවීම පවත්වා ගනිමින් තම රාජකාරි ඉටු කිරීමට අධිකාරිය බැඳී සිටී.

මෙම ක්‍රියාමාර්ගවල ප්‍රධාන අරමුණ වන්නේ විනිවිදභාවය සහ නිරවද්‍යතාවයට අනුගත වෙමින් මහජන අවශ්‍යතාවලට අනුකූලව අධිකාරියේ අරමුණු සාක්ෂාත් කර ගැනීමයි. යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ අත්පොත එවැනි අරමුණු වඩා හොඳින් ඉටු කර ගැනීම සඳහා මඟ පෙන්වීමක් අවශ්‍ය බව සඳහන් වේ.

මහජන ව්‍යවසායයක් වන බැවින් ඉහළ ආර්ථික සංවර්ධනයක් සහ මහජන සුබසාධනයක් සහතික කිරීම සඳහා ක්‍රියාත්මක වීම නාගරික සංවර්ධන අධිකාරියේ යුතුකම වේ. ඒ අනුව අධිකාරියේ අභ්‍යන්තර හා බාහිර මෙහෙයුම් ක්‍රමානුකූලව සහ මනා විනයකින් යුතුව සිදු කෙරේ. අධිකාරියේ සියලුම පාලන රීති සහ රෙගුලාසි වලට අමතරව, මෙම මූලධර්ම භාවිතා කිරීම, අධිකාරියේ අඛණ්ඩතාව ආරක්ෂා කිරීම සඳහා සැලකිය යුතු සහයෝගයක් ලබා දී ඇත.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශවල දක්වා ඇති නීති රීති, රෙගුලාසි, චක්‍රලේඛ සහ නියෝග වඩා හොඳ රාජ්‍ය සේවාවක් ඇති කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. යහපත් මූල්‍ය විනයක් හැඩගැස්වීම සඳහා යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ හරහා හඳුන්වා දී ඇති භාවිතයන් ඉතා වැදගත් වේ. මෙම මාර්ගෝපදේශ සම්පාදනයේ ප්‍රධාන අරමුණු වන්නේ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරිත්වය උසස් ප්‍රමිතීන් සහිත රාමුවකට ගෙන ඒම, අදාළ මෙහෙයුම් ක්‍රම සරල කිරීම සහ එවැනි ක්‍රමවල ඵලදායීත්වය වැඩි දියුණු කිරීමයි. නාගරික සංවර්ධන අධිකාරියේ අරමුණු සහ ඉලක්ක රාජ්‍ය ව්‍යවසාය ආයතනයක් ලෙස එහි ධාරිතාවය තුළ සාක්ෂාත් කරගත හැකි ආකාරය පිළිබඳව මෙම මාර්ගෝපදේශ මඟපෙන්වීම් සපයයි.

කළමනාකරණ මණ්ඩලය

නාගරික සංවර්ධන අධිකාරී පනතට අනුව අධිකාරියේ සභාපතිවරයා සහ කළමනාකරණ මණ්ඩලය පත් කරනු ලබන්නේ නාගරික සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසිනි. පනතට අනුව කළමනාකරණ මණ්ඩලයේ ද සභාපතිවරයා විය යුත්තේ අධිකාරියේ සභාපතිවරයායි. කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ගේ යුතුකම් සහ කාර්යයන්:

- ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සහ අධීක්ෂණ ක්‍රියාවලියේ කාර්ය සාධනය සහ සඵලතාවය ඇගයීම.
- ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික අයවැය අනුමත කිරීම.
- වාර්ෂික වාර්තා, අතුරු මූල්‍ය වාර්තා සහ වාර්ෂික මූල්‍ය වාර්තාව අනුමත කිරීම
- නීති, රෙගුලාසි සහ මූලික යහපාලන මූලධර්මවලට අනුකූල වීම සහතික කිරීම
- ව්‍යදම් ප්‍රාග්ධන ආයෝජන පිළිබඳ තීරණ ගැනීම අධිකාරියේ ක්‍රියාකාරිත්වය සහ අන්තර් සම්බන්ධතා අධීක්ෂණය කිරීම.
- අනුබද්ධ ආයතනවල අධ්‍යක්ෂක මණ්ඩලවලට සාමාජිකයන් පත් කිරීම.

විගණන කමිටු වාර්තාව සහ මුල්‍ය ප්‍රකාශන

5.1. විගණන කමිටුවේ කාර්ය භාරය

5.2. විගණන කමිටු සාමාජිකයන්

5.3. විගණන කමිටු රැස්වීම සඳහා සාමාජිකයින්ගේ සහභාගීත්වය -2020 වර්ෂය

5.4. 2020 වර්ෂය සඳහා විගණන කමිටුවේ කාර්ය භාරය

5.5. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශන



5. විගණන කමිටු වාර්තාව - 2020

5.1. විගණන කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ මූල්‍ය වාර්තාකරණය, අවදානම් කළමනාකරණය සහ රෙගුලාසි සහ ආචාර ධර්මවලට අනුකූලව නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයට සහාය වීමයි.

විගණන කටයුතු සිදු කිරීම සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවට ද මෙම කමිටුව සහාය වේ. 2020 වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් 05ක් පවත්වා ඇති අතර කමිටු සාකච්ඡා සටහන් සහ නිර්දේශ කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

5.2. විගණන කමිටුවේ සාමාජිකයින්

අංකය	නම	තනතුර
01	කේ. වී. සී. ඩිල්රුක්ෂි මහත්මිය	සභාපති
02	ජී. කේ. පතිරණ මහතා	ලේකම්
03	සාකාය උක්වත්ත මහතා	සාමාජික
04	ඩබ්ලිව්. එම්. එස්. විජේසිංහ මහතා	සාමාජික

රජයේ විගණන අධිකාරීවරයා සහ අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයා ආරාධනයෙන් විගණන කමිටුව සඳහා සහභාගී විය. නාගරික සංවර්ධන අධිකාරියෙහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) සහ ප්‍රධාන අභ්‍යන්තර විගනකාදි වරයා නිත්‍ය පදනමින් විගණන කමිටුව රැස්වීම් සඳහා සහභාගී වූ අතර අනෙකුත් අංශ ප්‍රධානීන් අවශ්‍යතාවය මත විගණන කමිටු රැස්වීම්වලට සහභාගී විය.

5.3 2020 විගණන කමිටු රැස්වීම සඳහා සාමාජිකයින්ගේ පැමිණීම

අංකය	සාමාජිකයින්	26.02.2020 01/2020	19.08.2020 02/2020	06.10.2020 03/2020	24.11.2020 04/2020	22.12.2020 05/2020
01	කේ. වී. සී. ඩිල්රුක්ෂි මහත්මිය සභාපති, විගණන කමිටුව	√	√	√	√	√
02	ජී. කේ. පතිරණ මහතා සාමාජික විගණන කමිටුව	√	√	√	√	√
03	සාකාය උක්වත්ත මහතා සාමාජික, විගණන කමිටුව	√	√	√	√	√
04	ඩබ්ලිව්. එම්. එස්. විජේසිංහ මහතා සාමාජික විගණන කමිටුව		absent	√	√	√

විගණන කමිටුවේ කාර්යභාරය

• විගණන කමිටුව පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට වගකිව යුතු අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටුවකි.

ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට සහ එහි අධීක්ෂණ වගකීම ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා එහි නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට විගණන කමිටුව වගකීම දරයි. මෙය ඉටු කිරීමේදී කමිටුවේ ප්‍රධාන වගකීම් වන්නේ මූල්‍ය වාර්තාකරණය සහ නියාමන අනුකූලතාවය වේ.

- ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම, ඉදිරිපත් කිරීම සහ තොරතුරු ප්‍රමාණවත් ලෙස හෙළිදරව් කිරීම සහතික කිරීම සඳහා අධිකාරියේ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ ක්‍රමානුකූල අධීක්ෂණය.
- ආයතන පිහිටුවීමේ පනතට සහ මුදල් පනත ඇතුළු අනෙකුත් අදාළ පනත්වලට නිසි ලෙස අනුකූල වීම සමාලෝචනය කිරීම.

අභ්‍යන්තර පාලනය

- අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ ඵලදායී බව
- සමාලෝචනය කර තක්සේරු කිරීම සහ විශේෂ අවධානයක් අවශ්‍ය ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

අභ්‍යන්තර විගණනය

- අභ්‍යන්තර විගණන කාර්යයන්හි ස්වාධීනත්වය, ඵලදායිතාවය සහ නිපුණතාවය, ඒවායේ සම්පත් අවශ්‍යතා සමාලෝචනය කර ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- අභ්‍යන්තර විගණන අංශය සහ බාහිර විගණකවරුන් අතර සම්බන්ධීකරණය සහතික කිරීම.
- අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කිරීම සහ අනුමත කිරීම මගින් අධිකාරියේ කාර්යයන් පිළිබඳ අවදානම් තක්සේරුව මත පදනම්ව අභ්‍යන්තර විගණන කාර්යය සිදු කරන බවට සහතික වීම.

බාහිර විගණනය

- විගණන සොයාගැනීම් පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සුදුසු සන්නිවේදනයන් සිදු කිරීම සහ ගැටළු නිවැරදි කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම.

අවදානම් කළමනාකරණය

- අධිකාරිය අදාළ ප්‍රධාන අවදානම් තක්සේරු කරන බව සහතික කර ගැනීම සහ අවදානම් කළමනාකරණ උපාය මාර්ග අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

5.4. 2020 වර්ෂය සඳහා විගණන කමිටුවේ කාර්යයන්

1. අභ්‍යන්තර පාලන පද්ධති සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සමාලෝචනය කරන ලදී.
2. අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම්වලට අදාළ අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කර වාර්තා කළ කළමනාකරණ දුර්වලතා මහඟරවා ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
3. අධිකාරියේ ඉඩම් සහ දේපළ පිළිබඳ තොරතුරු පරිගණකගත දත්ත ගබඩාවක පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය සමාලෝචනය කර ගිණුම්කරණ සහ තක්සේරු ක්‍රියාවලිය පිළිබඳ නිර්දේශ ලබා දෙන ලදී.
4. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සිදු කරන ලදී.
5. අධිකාරියේ අනුබද්ධ සමාගම්වල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී.
6. වාර්ෂික වාර්තා සැකසීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
7. අධිකාරිය සඳහා මූල්‍ය අත්පොත් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සපයන ලදී.
8. මාසික කුලී එකතු කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර කුලී එකතු කිරීමේ කාර්යක්ෂමතාව සහ වාර්තා නඩත්තු කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී.
9. 2017 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇති ගිණුම්කරණ සහ කළමනාකරණ දුර්වලතා වැඩිදියුණු කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.
10. නාගරික සංවර්ධන අධිකාරිය සඳහා යෝජිත වන්දි ප්‍රතිපත්තිය සමාලෝචනය කර නිර්දේශ ලබා දී ඇත.
11. පවතින ගිණුම්කරණ පද්ධතියේ අවදානම් සහ දුර්වලතා සමාලෝචනය කර වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දෙන ලදී.
12. වර්ෂයට අදාළ රජයේ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ පිළිබඳව සාකච්ඡා කරන ලදී.

K.V.C.Dilrukshi

කේ. වී. සී. ඩිල්රුක්ෂි මහත්මිය
සභාපති, විගණන කමිටුව

5.5. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහාවූ මුල්‍ය ප්‍රකාශනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. HUD/B/UDA/01/2020/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 නොවැම්බර් 13 දින

සභාපති

නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය සහ එහි පරිපාලිතයන්ගේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය ව්‍යාවනය

නාගරික සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") සහ එහි පරිපාලිතයන්ගේ ("සමූහය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන සඳහා මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

1.2.1 සමූහය

(අ) 2017 වර්ෂයෙන් පසුව පැලියගොඩ වෙයා හවුසස් සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ලබා නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සැලකිල්ලට ගෙන නිබූ යටෝක්ත සමාගමේ රු.මිලියන 267.88 ක වත්කම් හා රු.මිලියන 25.74 ක වගකීම්වල නිවැරදිභාවය ඒකාබද්ධ මූල ප්‍රකාශණ විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

පිටු 1 | 18

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

(ආ) සමුහයට අයත් එහි ව්‍යාපාර ඒකක 05 අතුරින් නාගරික සංවර්ධන අධිකාරිය හා වෝටර්ස් එජ් සමාගම පමණක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව පාරිතෝෂික සඳහා ගැලපීමකර තිබීම හේතුවෙන් සමුහයට අදාළ පාරිතෝෂික වෙන්කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ට අනුකූලව සිදු කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සී/ස වෝටර්ස් එජ් සමාගම සඳහා සියයට 100 ක කොටස් හිමිකාරිත්වයකින් යුතු අධිකාරියට සියයට සියයක පාලන බලයක් වකුව හිමිව ඇති උප පරිපාලිත සමාගමක් වූ වෝටර්ස් එජ් රීක්‍රියේෂන් සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමුහයට ඒකාබද්ධකර නොතිබුණි.

1.2.2 නාගරික සංවර්ධන අධිකාරිය

<u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම</u>

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන සංකල්පනාත්මක රාමුවෙන් විස්තර වන පරිදි වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය කල යුතු වේ. එසේ වුවද, 2019 දෙසැම්බර් 31 දිනට බලාත්මක වන පරිදි, 2021 වර්ෂයේදී අධිකාරිය විසින් සිදුකරන ලද තක්සේරුවක් අනුව අධිකාරිය සතු ආයෝජන දේපලවලින් කොටසක් (ගොඩනගන ලද දේපල, නිවාස ව්‍යාපෘති සහ අධිකාරිය සතු දේපල) එකතුව රු.මිලියන 602,256 කට තක්සේරුකර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල එම තක්සේරු කරන ලද අගයන් ගැලපීම් කර නොතිබුණු අතර ගිණුම් සටහනක් මගින් පමණක් හෙළිදරව් කර තිබුණි. 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන අධිකාරියේ ආයෝජන දේපලවල ධාරණ වටිනාකම රු.මිලියන 96,706 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට තක්සේරු කරන ලද ආයෝජන දේපල වටිනාකම හා මෙම වටිනාකම අතර වෙනස රු.මිලියන 505,550 ක් වන බව ද නිරීක්ෂණය විය. මේ අනුව වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන තුළින් නිරූපණය නොවන බව නිරීක්ෂණය විය.

(ii) ප්‍රමිතයෙහි 28 ඡේදය අනුව බදුකරුවන් විසින් එකවර හෝ වාරික වශයෙන් ගෙවීමකළ ද උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විලම්භිත කල්බදු වගකීමෙහි මුළු වටිනාකම ගිවිසුමට එළඹෙන අවස්ථාවේදී හඳුනාගත යුතු වේ. එසේ වුවද 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 10,439.68 ක කල්බදු වටිනාකමක් සහිත කල්බදු දේපල සඳහා මුදල් පදනම මත එකී වගකීම හඳුනාගෙන තිබූ බව විගණනයට නිරීක්ෂණය විය.එමෙන්ම තවත් කල්බදු දේපල 216 ක් සඳහා විලම්භිත කල්බදු වගකීම් වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිති අංක 15 - ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් පැන නගින අයභාර** අනුව සේවාදායක ව්‍යාපෘති (Client Projects) වලින් පැන නගින ලද ආදායම් හෝ වියදම් හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය අවසානයට ගනුදෙනුකරුවන්ගෙන් ලද රු

මිලියන 4,679.65 ක් වූ තැන්පතු මුදලින් එදින දක්වා එම ව්‍යාපෘති වෙනුවෙන් වැය කරන ලද වියදම වූ එකතුව රු. මිලියන 4,298.15 ක් අඩුකර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ශේෂයක් හඳුනාගෙන තිබුණි. එමෙන්ම වැඩ නිමවෙමින් පවතින සේවාදායක ව්‍යාපෘති කෙරිගෙන යන වැඩ ලෙස හඳුනාගෙන නොතිබූ අතර එකිනෙක ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රමිතියේ ප්‍රතිපාදන පරිදි පැන නගින ලද ලාභ හෝ අලාභ හඳුනාගැනීම සඳහා ක්‍රමවේදයක්ද අනුගමනය කර නොතිබුණි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 - දේපල පිරියත සහ උපකරණ,** 51 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම එහි වත්කම්වල සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත සමාලෝචනය කළයුතු අතර එම අපේක්ෂිත අගයන් පෙර ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කළයුතු වේ. කෙසේ වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති ලියාහල අගය රු.මිලියන 2,909.53 ක් වූ වත්කම් සම්බන්ධයෙන් සුන්බුන් අගය සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය නැවත සමාලෝචනයට කටයුතු කර නොතිබුණි. තවද, අධිකාරියට අයත් රු.මිලියන 729.20 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ අතර තවදුරටත් භාවිතා කරමින් පැවති නමුත් එම වත්කම්වල ඇස්තමේන්තුගත දෝෂය නිවැරදි කිරීම සම්බන්ධයෙන් සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ඈ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17 – කල්බදු**

(i) ප්‍රමිතයට හා අධිකාරියේ කල්බදු අදායම් සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්ති අංක 1.4.6.7 ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් පිළියෙල කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බදු කාල සීමාව හඳුනා නොගත් කල්බදු දේපල 311 ක් පැවති අතර ඒවායේ කල්බදු ප්‍රතිශ්‍යාව රු.මිලියන 840.93 ක් වූ අතර එයට අදාල කල්බදු ආදායම් කිසිවක් හඳුනාගෙන නොතිබුණි. ඊට අමතරව අධිකාරිය විසින් විගණනය වෙත ලබා දෙන ලද තොරතුරු අනුව කල්බදු කාල සීමාවේ ආරම්භක දිනයක් සඳහන් නොවන රු.මිලියන 6,433.13 ක වටිනාකම් ඇති කල්බදු දේපල 304 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 2,048.95 ක කල්බදු කුලී ආදායමක් ද හඳුනාගෙන තිබුණි.

(ii) අධිකාරියේ ගිණුම් ප්‍රතිපත්ති අංක 1.4.13.2 ට අනුව ආයෝජන මත පොලිය සඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතයෙන් ව්‍යවහාරකරන බව හෙළිදරවිකර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iii) ප්‍රමිතියේ ප්‍රතිපාදනවලට පටහැනිව අධිකාරිය විසින් කැබරට් 28 ක් මූල්‍ය කල්බදු ක්‍රමයට මිලදී ගැනීමට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත පොලී ගිණුම් ශේෂය වූ රු. මිලියන 56.41 ක් එදිනට ණය මුදලින් අඩු කර දක්වා නොතිබීම නිසා ජංගම වගකීම් රු.මිලියන 11.88 කින්ද ජංගම නොවන වගකීම් රු.මිලියන 44.53 කින්ද අධිගණනය වී තිබුණි.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 - රාජ්‍ය ප්‍රදාන** ප්‍රමිතියෙහි 12 ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබූ රු. මිලියන 357.39 ක රාජ්‍ය ප්‍රදාන සම්බන්ධව ක්‍රමක්ෂය ගණනය කර නොතිබූ අතර එම ප්‍රදාන කුමන කාර්යක් සඳහා අධිකාරිය වෙත ලැබුණේද යන්න පිළිබඳවද කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36- වත්කම් හානිකරණය**

(i) ප්‍රමිතියේ 12 වන ඡේදයේ සඳහන් පරිදි වත්කම් අගය අඩුවීම පිළිබඳ යම් ලක්ෂණ පවතී නම් අදාල ශේෂ සඳහා හානිකරණ පරීක්ෂාවන් සිදුකල යුතුවේ. එහෙත් වැඩ අතරමඟ නවතා දමා තිබූ ව්‍යාපෘති 11 ක් සඳහා වූ නොනිමි වටිනාකම රු.මිලියන 350.58 ක් 2018 වර්ෂයේ සිට නොනිමි වැඩ ගිණුම යටතේ මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙන එමින් පැවතුණි. එවැනි හානිකරණ පරීක්ෂාවක් සිදුකර නොතිබුණි.

(ii) තවද ප්‍රමිතියේ 09 වන ඡේදය අනුව ආයෝජන දේපළ වලට අදාළ හානිකරණ අගයන්ද හඳුනාගෙන නොතිබුණි. 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහ 2020 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද ආයෝජන දේපල උපලේඛන සැසඳීමේ දී දේපල 49 ක වටිනාකම රු. මිලියන 1,319.85 කින් වැඩි වී තිබුණද එම දේපල වලට අදාල සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වර්ෂයේ එකතු කිරීම් ලෙස රු.මිලියන 920.02 ක් පමණක් සටහන් කර තිබීම හේතුවෙන් ඒ අතර රු.මිලියන 399.83 ක වෙනසක් නිරීක්ෂණය විය.එමෙන්ම ආයෝජන දේපල 12 ක අගය පෙර වසරට සාපේක්ෂව රු.මිලියන 4,651.72 කින් අඩුවී තිබූ නමුත් එම අඩුවීම් ද මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණු අතර මෙම වෙනස්වීම් වලට අදාල හේතු විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(උ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 - අස්පෘශ්‍ය වත්කම්** ප්‍රමිතියෙහි 21 වන ඡේදයේ දැක්වෙන පරිදි අස්පෘශ්‍ය වත්කම් වෙනම හඳුනා ගත යුතු වුවද එයට පටහැනිව අධිකාරිය සතු පිරිවැය රු.මිලියන 23.21 ක පද්ධති සහ මෘදුකාංග, දේපල පිරියත හා උපකරණ යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. ඒ අනුව දේපළ පිරියත හා උපකරණ වල පිරිවැය එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණු අතර අස්පෘශ්‍ය වත්කම් ඌණ ගණනය වී තිබුණි.

(ඌ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 - ආයෝජන දේපල**

(i) මෙම ප්‍රමිතයේ 16 ඡේදය අනුව ආදායම් උත්පාදනය වන හා අනාගත ආයෝජන අවස්ථා ඇති දැ ආයෝජිත දේපල ලෙස හඳුනා ගත යුතු වුවත් ඊට පටහැනිව කිසිදු ආදායමක් උත්පාදනය නොකරන නගර සංවර්ධන හා අලංකරණ කටයුතු සඳහා වූ ව්‍යාපෘති 13 ක් වෙනුවෙන් අධිකාරිය විසින් වැයකරන ලද රු.මිලියන 508.86 ක් හා 2020 දෙසැම්බර් 31 දිනට අනුව ලියාහල අගය රු. මිලියන 43.19 ක් වූ අධිකාරිය සතු දේපල, පිරියත මෙන්ම රු.මිලියන 849.27 ක් වූ වෙනත් ආයතන වෙනුවෙන් සිදුකළ ව්‍යාපෘති 03 ක් ද ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද ප්‍රමිතයේ 07 ඡේදය අනුව අනාගතයේදී ආයෝජන අවස්ථාවන්හි ආයෝජන කිරීමට යෝජිත දේපල වන්නේ නම් එම දේපලද ආයෝජන දේපල වශයෙන් ගිණුම්ගත කළ යුතුය. නමුත් පාර්ලිමේන්තු ඉඩමට අයත් අක්කර 1,167 ක් වූ ඉඩම්වල්, අක්කර 37 ක් නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් වෙන්කර තිබුණද එම ඉඩම් කොටස් තක්සේරු කර ආයෝජන දේපල යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 30, 32 (අ) සහ 34 ඡේදවල දක්වා ඇති ව්‍යාතිරේඛ 33 – 35 ඡේදවල දක්වන ලද සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ 56 ඡේදයෙහි සඳහන් පිරිවැය ආකෘතිය ආයතනයක් විසින් එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරා ගත යුතු වේ. ප්‍රමිතයේ ඡේද අංක 53 අනුව, සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස මිනුම් කිරීමට හැකියාවක් නොපවතින අවස්ථාවකදී හැර තෝරාගත් ප්‍රතිපත්තිය සියළුම

ආයෝජන දේපල ගිණුම් කැබීම සඳහා භාවිතා කළ යුතු වේ. එසේ වුවද, නියැදි විගණන පරීක්ෂාවට අනුව අධිකාරිය විසින් ඇතැම් ආයෝජන දේපල පිරිවැයටත්, ඇතැම් ඒවා ප්‍රත්‍යාගණන අගයටත් ඇතැම් අවස්ථාවල වටිනාකම් දෙකේම එකතුවක් ලෙසද මූල්‍ය ප්‍රකාශවල වාර්තා කරන බව නිරීක්ෂණය විය.

ගණකාධිකරණ අඩුපාඩු

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් පිළියෙල කර තිබූ ශේෂ පරීක්ෂුමෙහි ඇතුළත්ව තිබෙන රු.මිලියන 628.51 ක වටිනාකම සහිත හර ශේෂ 03 ක් හා රු. මිලියන 628.49ක වටිනාකම සහිත බැර ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

(ඒ) අධිකාරිය පිහිට වූ 1979 වසරේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වූ කාලය තුළ විටින් විට අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 1303 ක් සඳහා වැය කරන ලද එකතුව රු.මිලියන 162,280.56 ක වියදම්, සංවර්ධන වියදම් නමින් ප්‍රාග්ධන වියදම් ගිණුම් 115 ක් යටතේ පොදු ලෙජරයේ ඇතුලත් කොට පසුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී එම ශේෂයන් කෙරිගෙන යන වැඩ, ආයෝජිත දේපල, ඉඩම් හා ගොඩනැගිලි, ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති හා සම්පූර්ණ කළ නිවාස යන වත්කම් අයිතම 5ක් යටතේ එකිනෙක වර්ගීකරණය කර වාර්තා සකස් කර තිබුණි. මේ හේතුවෙන් වත්කම් නිරූපණය කිරීම සඳහා ලෙජරය තුළ නිවැරදි හා පැහැදිලි ක්‍රමවේදයක් නොතිබූ බව නිරීක්ෂණය විය. මේ නිසා අධිකාරිය විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ පද්ධතිය මූල්‍ය වාර්තා සකස් කිරීම සඳහා සෘජුවම උපයෝගි කර ගත නොහැකි බව නිරීක්ෂණය විය.

(ඔ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ලෙජරය ඇසුරෙන් පිළියෙල කරන ලද ශේෂ පරීක්ෂුමෙහි ඇතුලත් මුළු වත්කම්වල ධාරණ වටිනාකම් එදිනට වගකීම් සහ හිමිකම් වල එකතුවට සමාන නොවන බැවින් ඒ අතර වූ රු.මිලියන 2,147 ක් වූ වෙනස රඳවාගත් අතිරික්ත ගිණුම් යටතේ ශේෂ පරීක්ෂුම තුළ දක්වා තිබුණි. නමුත් මෙම ගිණුම් අධිකාරියේ පොදු ලෙජරය තුල දක්වා නොතිබුණි. එමෙන්ම මෙම රඳවාගත් අතිරික්ත ගිණුමේ ශේෂය වර්ෂ 2016 සිට 2019 දක්වා අදාල වන අතර ශේෂ පරීක්ෂුමේ දැක්වෙන රු.මිලියන 73,478.73 ක ශේෂය වර්ෂ 2015 දක්වා අදාල වන බැවින් එම එකිනෙක ශේෂයන් එකතු කල විට මූල්‍ය තත්ව ප්‍රකාශනයේ 2020 ජනවාරි 01 දිනට වූ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ දැක්වෙන 2020 ජනවාරි 01 දිනට සමුච්චිත ලාභයට සමාන විය යුතු නමුත් ඒ අතර රු.මිලියන 10.26 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඕ) අධිකාරිය විසින් 2021 සහ 2022 වර්ෂවලදී 99 අවුරුදු කල්බදු පදනමට ලබාදී තිබූ ඉඩම් 02ක් වෙනුවෙන් රු.මිලියන 2,098.2 ක් 2019 හා 2020 වර්ෂවල අධිකාරියට ලැබීම් ලෙස සලකා මුදල් පදනමින් එම වටිනාකම් විලම්බිත කල්බදු වගකීම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. තවද කල්බදු කාල සීමාව ඉක්ම වූ රු.මිලියන 7.15 ක වටිනාකම් සහිත කල්බදු දේපල 11ක්ද අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 2105.35 කින් විලම්බිත කල්බදු වගකීම් වටිනාකම් අධිගණනය වී තිබුණි.

(ක) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ විලම්භිත බදු වටිනාකම යටතේ දැක්වෙන නව කල්බදු සහ වැරදි නිවැරදි කිරීම් ලෙස දක්වා ඇති රු.මිලියන 6,497.52 ක් වූ වටිනාකම සම්බන්ධයෙන් කිසිදු තොරතුරුක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ග) ගනුදෙනුකරුවන් විසින් අධිකාරියේ බැංකු ගිණුම්වල තැන්පත් කරනු ලබන මුදල්, ආදායමද පියවීමද යන්න හඳුනාගැනීම සඳහා නිවැරදි වූ යාන්ත්‍රණයක් අධිකාරියට නොතිබුණි. මේ හේතුවෙන් බැංකු ගිණුම් 03 කට අදාළ එකතුව රු.මිලියන 13.45 ක ශේෂයක් හා ලංකා බැංකුවේ ගිණුම් අංක 1534 දරන ගිණුම් වෙනුවෙන් 2020 දෙසැම්බර් මාසය සඳහා සකස්කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ අඩංගු රු.මිලියන 67 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස දක්වා තිබුණද ඒවා හඳුනා නොගත් තැන්පතු හෝ ආදායම් විය හැකි බව නිරීක්ෂණය විය.

(ච) නියැදි විගණන පරීක්ෂාවකදී හඳුනාගත් පරිදි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ මූලාශ්‍ර වලින් අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ චෙක්කම් අයිතම 225 ක් පැවති නමුත් එම චෙක්කම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඡ) අධිකාරිය විසින් වැඩ අවසන් කොට අදාළ ගනුදෙනුකරුට භාර දී තිබූ ව්‍යාපෘතිවලට අදාළව රු. මිලියන 2,126.44 ක වටිනාකම 2020 දෙසැම්බර් 31 දින වන විටද නොනිමී වැඩ යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් නොනිමී වැඩ ගිණුම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු මිලියන 103.98 ක ශේෂයක් සහිත වූ ව්‍යාපෘති 8 ක අදාළ කාර්යයන් පිළිබඳව කිසිදු විස්තරයක් සඳහන් නොවන ස්ථානය පමණක් නොනිමී වැඩ උපලේඛනයේ දක්වා තිබුණි.

(ට) නාගරික සංවර්ධන අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ එහි පරිපාලිත සමාගමක් වන චෝටර්ස් ඒජ් සමාගමෙහි හි ආයෝජිත වටිනාකම ලෙස රු.මිලියන 200 ක් දක්වා තිබුණද මෙම වටිනාකම සඳහා චෝටර්ස් ඒජ් සමාගම කොටස් නිකුත්කර නොතිබුණි.

(ඩ) අධිකාරියේ පරිපාලිත සමාගමක් වන ලංකා රෙස්ට් හවුසස් සමාගම වෙත අධිකාරිය සතු තානායම් වල මෙහෙයුම් කටයුතු භාරදී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට සමාගම සතුව තානායම් 31 ක් පැවති නමුත් මෙවා අධිකාරියේ ආයෝජිත දේපල ලෙස ගිණුම්ගත වී නොතිබුණි. 2020 වර්ෂයේ අධිකාරියේ තක්සේරු වාර්තාවට අනුව තානායම් 02 ක් රු.මිලියන 2,004 කට තක්සේරුකර තිබුණු නමුත් අදාල අගයන් ගිණුම් වලට ගෙන නොතිබීම නිසා ආයෝජිත දේපල ඌනගණනය වී තිබුණි.

(ත) 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි ලෙස රු. මිලියන 11,831.83 ක් දක්වා තිබුනද 2020 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් විගණනය වෙත තහවුරු කරන ලද තොරතුරු අනුව තවදුරටත් වන්දි හා පොළී ලෙස සටහන් විය යුතු රු.මිලියන 8,894.27ක් පැවති බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියේ වූ මුළු වගකීම් ද එම ප්‍රමාණයෙන් ඌන ගණනය වී තිබුණි.

(ද) 2019 දෙසැම්බර් 31 දිනට විගණනය වෙත ඉදිරිපත් කර තිබූ ගෙවිය යුතු වන්දි උපලේඛනයේ පැවති රු.මිලියන 366.55 ක ශේෂයන් 04 ක් ඉදිරියට ගෙන ඒමේදී එනම් 2020 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ගෙවිය යුතු වන්දි උපලේඛනයෙන් ඉවත්කර තිබුණි.

1.2.3 අධිකාරියේ පරිපාලිත සමාගම් සම්බන්ධ විගණන මතයන් හා ප්‍රමාණාත්මක නිරීක්ෂණ

අධිකාරියට පූර්ණ හිමිකමක් සහිත ලංකා රෙස්ට් හවුසස් සමාගම සහ නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම යන පරිපාලිත සමාගම් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව අනුව විගණන මතය ව්‍යාවනය කරන ලද අතර චේ්ටර්ස් එජ් සමාගමේ එකී වාර්තාව අනුව විගණන මතය තත්ත්වාගණනය කරන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබූ මෙම වාර්තාවේ දිනවන විටත් නිවැරදි නොකර ලද නිරීක්ෂණ කිහිපයක් පහත පරිදි වේ.

(i) ලංකා රෙස්ට් හවුසස් සමාගම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 6 ඡේදය අනුව භාණ්ඩ හා සේවා සැපයීමේදී භාවිතා කරන, බදු පදනමට ලබාදීම සඳහා තබාගෙන ඇති සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරන භෞතික පැවැත්මක් ඇති දෑ දේපල, පිරියත හා උපකරණ වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 හි 5 ඡේදය අනුව බදු කුලී ඉපයීම් සඳහා හා/හෝ ප්‍රාග්ධන ඉපයීම් සඳහා පවත්වාගෙන යන ඉඩම් හා ගොඩනැගිලි ආයෝජන දේපළ වේ. නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය යටතට පත්කර තිබූ තානායම්වල පාලනය 2010 වර්ෂයේදී සමාගම වෙත ලබාදී තිබුණි. 2020 දෙසැම්බර් 31 දින වන විට එවැනි තානායම් 31 ක් පැවති අතර එයින් තානායම් 23 ක කළමණාකරණය පෞද්ගලික අංශය වෙත පවරා තිබූ අතර තානායම් 07 ක් අක්‍රියව පැවැතුණි. එසේ වුවද, සමාගම විසින් එම දේපල භාවිතා කිරීමේ පදනම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම් හෝ හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් සම්බන්ධයෙන්, ගිණුම්කරණ ප්‍රමිතියකින් අවසර දී ඇත්නම් මිස හිලව් නොකළ යුතු වේ. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ ගිවිසුම්ගත කළමනාකරණ ගාස්තු ආදායම රු.මිලියන 45.47 ක් විය යුතු වුවත් එම ආදායම රු.මිලියන 17.08 ක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්වීමේදී එම ආදායමෙන් සියයට 65 ක්වූ තානායම් ඉඩම් පරිහරණය කිරීම වෙනුවෙන් පළාත්පාලන ආයතන වලට ගෙවිය යුතු ගාස්තු අඩුකර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, එම වියදම නිශ්චිතව හඳුනා ගැනීම සඳහා කිසිදු විස්තරාත්මක උපලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ඇතුළත් කර තිබූ ආදායම් සහ වියදම් දළ වශයෙන් රු.මිලියන 28.80 කින් අඩුවෙන් දක්වා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගය රු.මිලියන 13.34 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ නමුත් මේ සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ ස්ථාවර වත්කම් ලේඛනයෙහි ඇතුළත් කර තිබුණේ 2012 වර්ෂයෙන් පසු සමාගම

විසින් මිලදී ගෙන තිබූ ස්ථාවර වත්කම් පමණි. ඒ අනුව 2012 ට පෙර තානායම් වල පැවති ස්ථාවර වත්කම් හඳුනාගෙන ගිණුම්වලට ඇතුළත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක (LKAS) 16 ට අනුව, සම්පූර්ණයෙන් ක්ෂයකර ඇති නමුත් දැනටමත් භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිකළ යුතු අතර එම වත්කම් වල ඵලදායි ජීවිත කාලය නැවත තක්සේරුකර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කළ යුතුය. එසේ වුවද, සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.මිලියන 22.1 ක වත්කම් සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන් වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා අධිකාරිය තබා තිබෙද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ දක්වා ඇති 1.2 ඡේදයෙහි දක්වා ඇති අ,ඇ,ඉ,උ,ඒ සහ ඔ යනාදී නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) භාණ්ඩාගාර වක්‍රලේඛ	
(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර වක්‍රලේඛය	වක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියට අයත් අධිකාරිය භාරයේ පවත්නා, ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පොදු 287 ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවද එලෙස ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපර දෙපාර්තමේන්තු වක්‍රලේඛ අංක පිරිඩි/12	
(i) 10.2.4 (අ) (ආ) ඡේද	අධිකාරියට පූර්ණ හිමිකාරීත්වය සහිත පැලියගොඩ වෙයා හවුසස් සමාගම ඇවරකිරීමේ කාර්යයන්වල කාර්යසාධනය අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් අධීක්ෂණය කළ යුතු අතර භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ත්‍රෛමාසිකව එහි කාර්යසාධනය පිළිබඳව වාර්තා කළ යුතුය. එසේම ඇවරකිරීම සඳහා ගතකරන කාලය මාස 06 ක උපරිමයක් විය යුතු අතර එම කාලසීමාව තුළදී ඇවරකිරීමට කටයුතු සිදුකළ නොහැකි වූ විටක ඇවර කිරීමේ කාලය දීර්ඝ කරගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතු වුවද සමාගම මෙම අවශ්‍යතාවයන්ට අනුකූල වී නොමැතිව තිබූ අතර 2012 ජූලි 01 දින ආරම්භ කරන ලද ඇවර කිරීමේ කාර්යයන් මෙම වාර්ථාවේ දින වන විටත් අවසන් කර නොතිබුණි.
(ඇ) 2007 අංක 7 දරන සමාගම් පනතේ 270 (ආ) ඡේදය	ව්‍යාපාර කටයුතු එක් වර්ෂයකට අත්හිටුවනු ලැබුවහොත් එවැනි සමාගම් අධිකරණය විසින් ගණන් බෙරා වසා දමනු ලැබිය හැකි බව සඳහන් කර ඇති නමුත් පරිපාලිත සමාගම් ලෙස අධිකාරිය විසින් 2014 නොවැම්බර් 21 දින පිහිටුවා තිබූ නාගරික ආයෝජන සහ දේපල වෙළඳාම පෞද්ගලික සමාගම, නාගරික ආයෝජන සහ හෝටල් සංවර්ධන සමාගම, ඕචිරඩ් (Orchard) නාගරික නිවාස සංවර්ධන සමාගම සහ චෝටර්ස් එජ් හෝටල් සංවර්ධන සමාගම යන සමාගම් වර්තමානය වන විට ක්‍රියාත්මක නොවන අතර ඒවා ගණන් බෙරා වසා දැමීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය	අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා සකස් කර මාස 06 කට වැඩි නොවන කාලයක් තුළ නිතිපතා යාවත්කාලීන කළ යුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර ක්‍රමානුකූලව විස්තර කෙරෙන ප්‍රසම්පාදන කාලසටහනක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.
(ii) 8.10.1 වගන්තිය සහ 8.11.4 (අ)(i) වගන්තිය	අධිකාරිය විසින් ප්‍රදානය කර තිබූ කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ හෝ වෙනත් උචිත මාධ්‍යයක හෝ ප්‍රසිද්ධියට පත් කර නොතිබූ අතර, කොන්ත්‍රාත් පැහැර හැරි සැපයුම්කරුවන් පිළිබඳ දත්ත මූලාශ්‍රයක් නඩත්තු කර නොතිබුණි.
(ඉ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ PED 03/2015	මාසික පාරිශ්‍රමික ලබාගන්නා නිලධාරීන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීමෙදී දීමනා ලබාගත නොහැකි වුවද හිටපු සභාපති, අධ්‍යක්ෂ ජනරාල් හා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් වක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව 2015 මාර්තු මස සිට 2020 ඔක්තෝම්බර් දක්වා රු.මිලියන 3.20ක් දීමනා වශයෙන් ලබාගෙන තිබුණි. 2020 දෙසැම්බර් සිට අදාළ ගෙවීම් නතර කර තිබුණද ගෙවන ලද මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 8 ඡේදයේ (එ) වගන්තිය	අදාළ පළාත් පාලන ආයතන විසින් ක්‍රියාත්මක කළ යුතු නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කිරීම සිදුකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කටයුතු නිමකර නොතිබුණි.
(ආ) 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනත II කොටසේ 8 (අ) වගන්තිය	අධිකාරිය විසින් මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති නාගරික සංවර්ධන ප්‍රදේශ 273ක් අතුරින් මෙම වාර්තාවේ දිනය දක්වා සංවර්ධන ප්‍රදේශ 188 ක් සඳහා මෙම වාර්ථාවේ දින වන විටත් සංවර්ධන සැලසුම් සකස්කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී නිවැසියන් සඳහා ඉදිකරන නිවාස සංකීර්ණවල පදිංචි කිරීමේදී ඔවුන් පදිංචි වී සිටි ස්ථාන (වතු) 18 ක ඉඩම් නිදහස් කර ගැනීමක් සිදුවුවත් එයින් වතු 06 කට අදාළ හෙක්ටයාර් 11.23 ක පමණ වූ ඉඩම්වල අයිතිය අධිකාරිය වෙත මේ දක්වා පවරාගෙන නොතිබුණි. එසේම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂය අවසාන වන විට ඉදිකරන ලද නිවාස සංකීර්ණ 22 කට අයත් ඉඩම් අතුරින් නිවාස යෝජනා ක්‍රම 09ක් පිහිටි ඉඩම් මේ දක්වා අධිකාරියට පවරාගෙන නොතිබුණි. මේ හේතුවෙන් නිවාස ලාභීන්ට එම නිවාසවල අයිතිය ලබාදීම හා නිවාස යෝජනා ක්‍රම සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය ලබාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාසික කුලී පදනමට වාණිජ කටයුතු සඳහා කුලියට ලබාදුන් පරිශ්‍ර 7,655 ක් පැවති අතර එයින් අක්‍රිය කුලී හිමියන් ගණන 3,053 ක් වෙත් සියයට 47 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම කුලී හිමියන්ගෙන් අධිකාරිය වෙත ලැබිය යුතු හිඟ කුලී මුදල රු.මිලියන 255.79 ක් විය. තවද සක්‍රීය කුලී හිමියන් 4,602 කින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අධිකාරිය වෙත ලැබිය යුතු හිඟ බදු කුලී ශේෂය රු.මිලියන 718.25 ක් විය. ඒ හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට රජයට අයවිය යුතු එකතුකළ අගය මත බදු (VAT) ආදායම රු. මිලියන 90.66 ක්ද අහිමි වී තිබුණු බව නිරීක්ෂණය විය. ගිවිසුම් ප්‍රකාරව නියමිත කුලී මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු නොවීම මේ සඳහා ප්‍රධාන ලෙස බලපා තිබුණි.

(ඇ) නාගරික සංවර්ධන කලාපයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති කොලොන්නාව රාජගිරිය ප්‍රදේශයේ පිහිටි අක්කර 6.451 විශාලත්වයෙන් යුතු ඉඩමක් කසල බැහැර කිරීම සඳහා පවරාගැනීමට කටයුතු කර තිබූ අතර 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතේ 44 වෙනි වගන්තිය යටතේ බලය පැවරීමේ සහතික පත්‍රයක් 2008 අප්‍රේල් 23 දින අධිකාරිය වෙත නිකුත් කර තිබුණි. නමුත් ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තිය ප්‍රකාරව ඉඩම සඳහා නීත්‍යානුකූල අයිතිය විගණිත දිනය වන 2022 නොවැම්බර් 28 දින වන දක්වාද අධිකාරිය වෙත ලබාගෙන නොතිබුණි. 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දින සිදුකරන ලද වත්කම් තක්සේරුවෙන් අධිකාරියේ වත්කම් වලින් මෙම ඉඩම ඉවත්කර තිබීම නිසා ඉඩම් සංවර්ධනයට දරණ ලද රු.මිලියන 4.46ක වියදම් 2012 වර්ෂයේ ලාභයට එරෙහිව කපාහැර තිබුණි. කොලොන්නාව තෙල් ගබඩා සංකීර්ණය අසල පිහිටා ඇති සමාජ ආරක්ෂාවක් අවශ්‍ය එම භූමිය කසල බැහැර කිරීම සඳහා යොදවාගැනීමට වූ ශක්‍යතා අධ්‍යනයක් හෝ කසල බැහැර කිරීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කරන ලද පාරිසරික බලපත්‍රයක්ද ලබාගෙන නොතිබුණි. කෙසේ නමුත් මෙම ඉඩම මේ දක්වා කිසිදු කාර්යයකට නොයොදා නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) අධිකාරිය විසින් 2013 වර්ෂයේ ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලැබූ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත වූ නිවාස ඒකක 68,000 කින් නිවාස ඒකක 14,542ක් පමණක් ඉදිකර එයින් ද නිවාස ඒකක 12,325ක පමණක් 2020 දෙසැම්බර් 31 දින වන විට නිවාස ලාභීන් පදිංචි කර තිබුණි. නිවාස ඒකක 1,946 ක් විවිධ රජයේ ව්‍යාපෘති සඳහා වෙන්කර තිබූ අතර නිවාස 271ක් නිශ්කාර්යව පැවතුනි. පදිංචි කරන ලද නිවාසලාභීන් වෙත නිවාසවල හිමිකාරිත්වය ලබාදීමට නොහැකි වීම නිසා ඒවායේ කළමනාකරණ සංස්ථා පිහිටුවා නඩත්තු කටයුතු පැවරීමට නොහැකි වීම හේතුවෙන් 2020 වර්ෂය සඳහා පමණක් මෙම නිවාස ඒකකවල විදුලිය, ආරක්ෂක වියදම්, ජලය, පිරිසිදු කිරීම් සහ නඩත්තු කටයුතු වෙනුවෙන් රු.මිලියන 230.93ක වැයබරක් අධිකාරියට දැරීමට සිදුවී තිබූ අතර නියමිත පරිදි විදුලි බිල් නොගෙවීම මත 2020 වර්ෂය සඳහා රු.මිලියන 1.2 ක දඩ මුදලක්ද අධිකාරියට ගෙවීමට සිදුවී තිබුණි.

(ඉ) එවකට පැවති මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වූ "සුඛිත පුරවර" නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි එක් අදියරයක් වූ කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 269.12 ක් වූ මහල් 05 කින් සමන්විත මහර පරිපාලන හා වාණිජ සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු අධිකාරිය විසින් 2017 දී ආරම්භ කර 2019 අවසන් කර තිබුණද නිසි පරිදි අදාළ පාර්ශවයන්ට භාරදී නොතිබුණි. එමෙන්ම බිම් මහල හා පළමු මහලේ කාර්යාල 04 ක් ස්ථාපනය කර තිබූ නමුත් ගොඩනැගිල්ලේ ඉතිරි කොටස සැලසුම් කළ පරිදි කිසිදු වාණිජ හෝ කාර්යාල පහසුකම් සඳහා භාවිතා නොකර 2022 ඔක්තෝම්බර් 31 දින දක්වාම නිශ්කාර්යව පැවැතුණි.

(ඊ) පොදු මහජනතාව වෙත සේවා සපයනු ලබන මූල්‍ය හා පරිපාලන ආයතන සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් වශයෙන් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 04 පර්චස් 43ක් වූ ඉඩම් කොටස් 03 ක් 2013 ඔක්තෝබර් 09 දින අධිකාරියට අත්කරගෙන තිබුණි. නමුත් මෙලෙස අත්පත් කරගනු ලැබූ ඉඩමෙන් අක්කර 02 රූඩ් 03 පර්චස් 01 ක් වූ ඉඩම් කොටස් 02 ක් වර්ෂ 2015 දී හා 2016 වර්ෂ වලදී මුල් හිමිකරුවන්ට නැවත අවසතු කර තිබූ අතර ඉතිරි රූඩ් 01 පර්චස් 02 ක ඉඩම් ප්‍රමාණය සඳහා 2021 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 213.22 ක් වන්දි වශයෙන් ගෙවීම්කර තිබුණි.කෙසේ නමුත් එම ඉඩම් කොටස 2023 ජූනි වන විටත් මුලින් අපේක්ෂා කල කාර්යයට හෝ වෙනත් කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා යොදවාගෙන නොතිබුණි.

(උ) කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියට අයත් ඉඩමෙහි පදිංචිවී සිටි පවුල් සඳහා මහල් නිවාස ඒකක ඉදිකිරීමේ කාර්යය 2015 වර්ෂයේදී නිමකළ යුතුව තිබුණි. නමුත් ඉදිකිරීම් කටයුතු භාරදී තිබූ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය මත අදාළ ඉදිකිරීම් උපදේශක ආයතනය වෙත රු.මිලියන 5.49 ක අමතර උපදේශක ගාස්තුවක් හා ඉඩමෙහි මුල් පදිංචිකරුවන් සඳහා මහල් නිවාස ඒකක ලබාදෙන තෙක් මාසික කුලී ලෙස රු.මිලියන 61.20 ක් ලෙස එකතුව රු.මිලියන 66.69 ක් අධිකාරිය විසින් ගෙවීම් කර තිබුණද එම මුදල් ඉඩම් සංවර්ධන සමාගමෙන් 2023 ජූලි දක්වා ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඌ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් කොළඹ 05 මයුර පෙදෙසේ පර්චස් 56.5 ක විශාලත්වයෙන් යුත් ඉඩම පුද්ගලික ආයතනයක් වෙත මාස 06 ක එනම් 2016 ජූනි සිට නොවැම්බර් දක්වා කාලයකට මාසයකට රු. 650,000 ක තක්සේරු බදු වටිනාකමකට ලබා දී තිබුණි. එවකට

නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉඩම්) ලෙස කටයුතු කළ අභ්‍යන්තර තක්සේරු කමිටුවේ සභාපති කමිටු රැස්වීම් පැවැත්වීමකින් තොරව කිසිදු සාධාරණ හේතුවක් නොදක්වා පිළිගත් තක්සේරු ක්‍රමවේදයක් අනුගමනය නොකරමින් තක්සේරු වටිනාකමෙන් සියයට 70 ක් අඩුකර එනම් මාසික කුලිය රු. 200,000 දක්වා අඩුකර විටිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව එම ඉඩම භාවිතය සඳහා ලබාදී තිබුණි. තවද මාස 6 ක කාලය ඉක්මවා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව වසර 3 ½ කට එනම් 2020 දෙසැම්බර් 31 දින දක්වා එම ඉඩම බදු දීමට කටයුතු කර තිබුණි. බදුකරුගෙන් ඉඩම පරිහරණය කළ කාලය තුළ තක්සේරු කළ කුලිය අය නොකළ නිසා අධිකාරියට සිදුව තිබූ පාඩුව රු. මිලියන 18.90 ක් වූ අතර ඊට අමතරව කුලිය මත VAT හා NBT ලෙස ගෙවිය යුතු මුදල්ද අයකර නොගැනීම නිසා සිදුව ඇති මුළු පාඩුව රු.මිලියන 20 කට අධික බව බව නිරීක්ෂණය විය. මෙම සිදු වූ අලාභය අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් 2023 සැප්තැම්බර් 31 අයකරගෙන නොතිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී වැඩ අවසන් කර තිබූ නිවාස ඒකක 608 කින් සමන්විත ඔවල් විව් නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන් සහ 2018 වැඩ අවසන් කර තිබූ නිවාස ඒකක 500 කින් සමන්විත අංගොඩ ලේක් ක්‍රිස්ට නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන් විසින් පිළිවෙලින් රු. මිලියන 4,756.32 ක් සහ රු.මිලියන 816.3 ක මුදලක් අධිකාරිය වෙත ගෙවා තිබියදීත් එම නිවැසියන් වෙත නිවාසවල නීත්‍යානුකූල අයිතිය පැවරීම 2023 ජූලි වන විටත් නිමකර නොතිබුණි.

(ආ) කොළඹ පිටකොටුව වෙළඳ සංකීර්ණය (මැනිං මාර්කට්) පැලියගොඩ නැවත ස්ථාපනය කිරීම සඳහා අධිකාරිය විසින් 2016 වර්ෂයේදී රු. බිලියන 6.99 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝජනය කර ඉදිකළ පැලියගොඩ වෙළඳ සංකීර්ණය සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් වන විට වැඩ අවසන් තිබුණි. නමුත් 2022 ඔක්තෝම්බර් 31 වන විටත් එහි කඩකාමර 1,395 කින් කඩකාමර වෙළඳ මහතුන් වෙත ලබාදී නොතිබුණි.

(ඇ) 2006 වර්ෂයේ දී අධිකාරිය රු.මිලියන 345 ක් ආයෝජනය කර පිහිටුවා තිබෙන නාගරික සංවර්ධන සහ ආයෝජන (පෞද්ගලික) සමාගමෙන් සහ 2010 වර්ෂයේ දී පිහිටුවා තිබෙන ලංකා රෙස්ට් හවුසස් සමාගමෙන් ආරම්භ කළ දින සිට කිසිදු ලාභාංශයක් අධිකාරිය වෙත ලැබී නොතිබුණි. තවද රු.මිලියන 236.81 ක් ආයෝජනය කර තිබූ වෝටර්ස් එජ් සමාගමෙන්ද කිසිදු ලාභාංශයක් සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරිය වෙත ලැබී නොතිබුණි.

(ඈ) දිවයිනේ ප්‍රධාන නගර කේන්ද්‍ර කරගත් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ සහ පෞද්ගලික ඉඩම් අධිකාරිය වෙත පවරාගැනීමට 2020 ඔක්තෝම්බර් 12 දිනැති අංක MUD/H/2020/CP/37 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020 ඔක්තෝබර් 27 දින අනුමැතිය ලැබී තිබුණි. එම සංදේශයට ඇමුණුම්කර තිබූ ඉඩම් 45 ක් අතුරින් සමාජශාලා ලෙස පවත්වාගෙන ගිය ඔටර්ස් ඇක්වටික් හා 80 ක්ලබ් යන ආයතන දෙක පිහිටි හෙක්ටර්යාර් 1.8274 ක ගොඩනැගිලි සහිත ඉඩම් තුනක් අධිකාරිය විසින් පවරාගෙන සංවර්ධනය කර මහජනයාට විවෘත කළ යුතු බවට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. නමුත් අධිකාරිය 2023 ජූනි දක්වාම අදාල සමාජ ශාලා

මහජනයාට විවෘතකර නොතිබුණි.තවද 80 ක්ලබ් සමාජ ශාලාවේ නවීකරණ කටයුතු සඳහා අධිකාරිය විසින් 2021 වර්ෂයේ දී රු.මි.453.88 ක් වැයකර තිබුණි.

(ඉ) හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමේදී එහි ප්‍රධාන ශ්‍රවනාගාරය, කොරියානු අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සිය විසින් (KOICA) ඇමරිකන් ඩොලර් මිලියන 6.4 ක් (රු.මිලියන 851.2) වැය කරමින්ද සම්මන්ත්‍රණ ශාලාවේ අනෙකුත් ඉදිකිරීම් සඳහා රු.මිලියන 3,830.87 ක් රජයේ අරමුදල් වලින් වැය කරමින් ද ඉදිකර තිබුණි. ඊට අමතරව මෙය පවත්වා ගෙන යාමට අයහාර වියදම් ලෙස වර්ෂ 2017 සිට 2020 දක්වා රු.මිලියන 93.38 ක් අධිකාරිය විසින් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘතියෙන් එම කාලපරිච්ඡේදයට අදාළව ආදායම ලෙස උපයා තිබුණේ රු. මිලියන 20.64 ක් පමණි. මේ අනුව එම ව්‍යාපෘතිය පිරිවැය ඵලදායී නොවන ව්‍යාපෘතියක් බව නිරීක්ෂණය විය.

(ඊ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබූ රථගාල් 07 කින් 2023 පෙබරවාරි 01දිනට හිඟ කුලී ආදායම රු.මිලියන 13.18 ක් වී තිබුණි.

(උ) පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස යෝජනා ක්‍රමය ඉදිකිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය පත්කළ ප්‍රසම්පාදන කමිටුවක් මඟින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත් සමාගමක් වෙත 2017 ජුනි 15 දින කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ අවසන් කළ යුතු දිනය 2019 දෙසැම්බර් 31 දින වූ නමුත් එම කාලය තුළ වැඩ අවසන් කිරීමට නොහැකිවීම හේතුවෙන් අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතියෙන් 2022 සැප්තැම්බර් 29 දක්වා කාලය දිර්ඝ කර තිබුණි. මෙම නිවාස ඒකක 500 න් ආරක්ෂක අමාත්‍යාංශය සහ නාවික හමුදාව වෙත නිවාස ඒකක 101 ක්ද , පෙර විකුණුම් ක්‍රමය යටතේ විකුණන ලද නිවාස ඒකක 202 ක්ද වූ අතර ඉතිරි නිවාස 197 කිසිදු පෙර විකුණුම් සිදු කිරීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකරමින් තිබුණි. ආරක්ෂක අමාත්‍යාංශය සහ නාවික හමුදාව විසින් මිලියන 1,011.79 ක් හා පෙර විකුණුම් ක්‍රමය යටතේ මිලදී ගත් නිවාස සඳහා රු.මිලියන 2,176.84 ක් වශයෙන් එකතුව රු.මිලියන 3,188.63 ක මුදලක් අධිකාරිය වෙත ලැබී තිබූ නමුත් 2023 ජූලි වන විටත් එම නිවාසවල වැඩ අවසන්කර නිවාස ලාභීන්ට භාරදී නොතිබුණි.

(ඌ) 2022 ජූලි 16 දිනැති අංක 22/0970/502/019 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා පන්නිපිටිය වීරමාවතේ පිහිටි නිවාස 500 කින් යුත් නිවාස ව්‍යාපෘතියෙන් වසරක කුලී පදනම මත නිවාස ඒකක 101 ක්, වාර්ෂික කුලිය රු.මිලියන 69.45ක් රජයෙන් අධිකාරියට ගෙවීමේ පදනම මත ලබාදී තිබුණි. නමුත් 2023 ජූලි වන විටත් මේ සඳහා කුලිය අධිකාරිය වෙත ලැබී නොතිබූ අතර එක් එක් නිවාසභිමියන් විසින් ගෙවිය යුතු නඩත්තු වියදම් සහ නිවාස ඒකකයන් වෙනුවෙන් ගෙවිය යුතු විදුලිය, ගෑස්, ජලය වෙනුවෙන් අධිකාරියට මුදල් නොගෙවීම නිසා 2023 ජූලි 31 දිනට රු.මිලියන 9.88ක් අධිකාරියට අයවීමට පැවැතුණි.

(එ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ලබාදී තිබූ නිවාස ඒකක 11,900කින් 2023 ජනවාරි 31 දිනට රු.798.56 ක් වූ බදු කුලී සහ රු.154.19 ක් වූ ජල බිල්පත් වෙනුවෙන් එකතුව රු.මිලියන 952.75 ක් හිඟ හිට තිබුණි.

(ඒ) 2006 වර්ෂයේ දී ගාල්ල නගර සංවර්ධන සැලැස්ම යටතේ ඇලෝසියස් විද්‍යාලීය ක්‍රීඩාංගනය, ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය හා ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා නිවාස, වගාවන් හා ව්‍යාපාර පැවති යාබඳ ඉඩම් අක්කර 16 රූඩ් 3 පර්චස් 0.57 ක් අත්පත්කර ගැනීමට අධිකාරිය කටයුතු සිදුකර තිබුණි. මෙම ඉඩම් සඳහා වන්දි මුදල් ගෙවා නිරවුල් කිරීම වෙනුවෙන් රු.මිලියන 400 ක මුදලක් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීම් කර තිබූ අතර 2021 ජූලි 13 දිනට රු.මිලියන 281.57 ක් වන්දි හා පොලී වෙනුවෙන් ගෙවා තිබුණි. කෙසේ නමුත් එලෙස පවරාගන්නා ලද භූමියෙන් වැඩි ප්‍රමාණයක් 2023 සැප්තැම්බර් 30 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

(ඔ) අධිකාරිය සතු කොළඹ කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිමව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4 ක ඉඩම 2023 ජූනි දක්වාම කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි.

(ඕ) 2018 ජනවාරි ආරම්භ කර 2019 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් නිම කිරීමට යෝජිත අදියර 5 කින් සමන්විත වූ රු.මිලියන 400 ක ඇස්තමේන්තුගත වටිනාකමක් සහිත බෙරේ වැවෙහි බටහිර ඉවුර සංවර්ධන කිරීමේ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 20 ක් වූ එක් ව්‍යාපෘතියක වැඩ අවසන් නොකර අධිකාරිය භාරගෙන තිබුණි.

(ක) අධිකාරියේ අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ සැලසුම් සහකාර තනතුර සඳහා නිළධාරීන් 108 ක් අධිකාරිය යටතේ ඇති පරිපාලිත සමාගමක් හරහා බඳවාගෙන අධිකාරියේ සේවයට යොදවාගෙන තිබුණි. එම නිළධාරීන් සඳහා 2021 වර්ෂය අවසානය වන විට එකතුව රු. මිලියන 99.21 වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

(ග) මීතොටමුල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානයක් ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ දී නායයාමකට ලක්වූ කසල කන්ද ස්ථායීකරණය කිරීම පිණිස බලැන්කට් ලේයරයක් යෙදීම හා හරිතාගාර වායු විමෝචන ඒකකයක් ස්ථාපනය කිරීමේ කොන්ත්‍රාත්තුව 2020 ජූනි 09 දින රු. මිලියන 269.5 කට පෞද්ගලික ආයතනයක් වෙත ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා 2023 ඔක්තෝබර් 25 දින විට රු.මිලියන 432.95 ක් අධිකාරිය විසින් වැයකර තිබූ නමුත් සැලසුම් කළ පරිදි උද්‍යානයක් ඉදිකර නොතිබූ අතර ස්ථායීකරණය කරන ලද කසල පිහිටි ස්ථානය වර්තමානය වන විට වල් බිහිවී අතහැර දමා තිබූ බව විගණනය විසින් 2021 දෙසැම්බර් 23 සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේම මෙම ස්ථානයේ ස්ථාපිත කර ඇති බැහැර වන අපජලය ඇලමාර්ග වලට හා භූගත ජලයට එකතුවීම වැලැක්වීම හා වායු විමෝචන මධ්‍යස්ථානය හරහා ගෑස් එකතුකිරීමේ පද්ධතියේද වැඩ අවසන් කර නොතිබුණි. තවද අධිකාරිය අපේක්ෂා කළ පරිදි රාජ්‍ය පෞද්ගලික අංශ ඒකාබද්ධව ව්‍යාපෘතියේ ඉතිරිවැඩ අවසන් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති වීම ගැටළුවක් වී තිබූ බවද නිරීක්ෂණය විය.

(ච) පැලියගොඩ වෙයාර් හවුසස් සමාගමේ රු.මිලියන 376.44 පිරිවැය සහිත ගුදම් ගොඩනැගිලි 2017 අගෝස්තු 31 දින සිට අධිකාරිය වෙත පවරා ගැනීමට අධිකාරියේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. නමුත් මෙම වාර්තාවේ දිනය දක්වා අදාළ ගොඩනැගිලි අධිකාරිය වෙත පවරා ගැනීමට හා ඒ අනුව අධිකාරියේ වත්කම් ලෙස වාර්තාගත කිරීමට කටයුතු කර නොතිබුණි. එහෙත් අධිකාරිය විසින්

මෙම ගුදම් සංකීර්ණ කුලියට දීමෙන් 2017 අගෝස්තු සිට 2020 දෙසැම්බර් 31 දක්වා රු.මිලියන 45.85 ක කුලී ආදායමක් උපයාගෙන තිබුණි.

(ජ) අධිකාරිය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද ගනුදෙනුකරුවන්ගේ තැන්පතු වලට අදාළ උපලේඛනය පරීක්ෂා කිරීමෙදි 2020 දෙසැම්බර් 31 දක්වා අවස්ථා 04කදී ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ඉක්මවා රු.මිලියන 6,042.68 ක් අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් ලෙස දරා තිබීම විගණනයේ දී ප්‍රශ්නකාරී විය.

(ට) විවිධ අවශ්‍යතාවයන් සඳහා කොළඹට හා තදාසන්න නගර වෙත රථ වාහනවලින් පැමිණෙන මහජනයාගේ රථ වාහන නවතා තැබීම සඳහා රථගාල් ඉදි කිරීම සහ කලින් කල එකී පහසුකම් වැඩි කිරීම තුළින් කොළඹ සහ තදාසන්න නගරවල මාර්ග තදබදය පාලනය කිරීමට මැදිහත් වීම අවශ්‍යයෙන්ම අධිකාරිය විසින් සිදුකළ යුතු වුවත් ඒ පිළිබඳව අධිකාරිය ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. අගනගරය තුළ රථගාල් ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘති 15 න් 05 ක් ගිවිසුම් ප්‍රකාරව ක්‍රියාත්මක වී නොතිබුණි.

(ඨ) විගණන වෙත ඉදිරිපත් කරන ලද වන්දි ගෙවීම් උපලේඛනය අනුව අධිකාරිය විසින් පවරාගෙන තිබූ ඉඩම් අක්කර 66 රූඩ් 02 පර්චස් 25.5 ක ප්‍රමාණයක් සඳහා හිමිකරුවන් නිශ්චිතව හඳුනාගත නොහැකිව තිබුණු අතර ඒ වෙනුවෙන් වෙන් කරන ලද වන්දි ප්‍රමාණය රු මිලියන 2,040.72 ක් හා පොලිය රු.මිලියන 493.83 ක් විය. මෙම ශේෂ අතුරින් 1984 වර්ෂයේ සිට පැවත එන ශේෂද පැවති අතර හිමිකරුවන් හඳුනාගත නොහැකි වීම හේතුවෙන් අධිකාරියට පොලිය ලෙස අමතර වැයබරක් දැරීමට සිදුව තිබුණි.

(ඩ) කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් චතුරස්‍ර ඉඩම රු.මිලියන 4,999.7 කට දේශීයව ස්ථාපිත විදේශීය පෞද්ගලික සමාගමක් වෙත මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2012 වර්ෂයේ දී වර්ෂ 5 ක ව්‍යාපෘති කාලයක් සඳහා බදු දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව සංවර්ධන කටයුතු ආරම්භ නොකිරීම නිසා 2018 ජූලි 04 දින නැවත ගිවිසුම්ගත වී තිබුණි. නමුත් 2023 ජූලි වන විට වසර 05ක් ගත වී තිබුනද ව්‍යාපෘතිය නිම කර නොතිබූ අතර ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ අපේක්ෂිත සම්පූර්ණ මහල් 81කින් සමන්විත වූ ගොඩනැගිල්ලෙන් මහල් 60ක් සඳහා ගොඩනැගිලි සැකිල්ල පමණක් ඉදිකර තිබුණි. මෙම ප්‍රමාදය හේතුවෙන් නැවත ගිවිසුම්ගත වූ 2018 ජූලි 04 දිනට වූ වෙළඳපොල වටිනාකමත් පූර්ව කල්බදු වටිනාකමත් අතර වෙනස වූ රු.මිලියන 1,290.04 ක් මෙම වාර්තාවේ දිනය දක්වාම අය කර ගෙන නොතිබුණි.

(ත) අධිකාරිය සතු කොළඹ කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතට මායිමව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 21.4 ක ඉඩම ප්‍රසිද්ධ මිල කැඳවීමෙන් තොරව 2007 වසරේ සිට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් වෙනුවෙන් ඉඩමේ හුක්තිය රැන්ක් එන්ටර්ටේන්මන්ට් හෝල්ඩින් ලිමිටඩ් සමාගම වෙත ගිවිසුමකින් හා අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව ලබාදී තිබුණි. එයින් වසර දෙකකට පසු එනම් 2009 අගෝස්තු 12 දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර 2010 පෙබරවාරි 18 දින අවබෝධතා ගිවිසුමක් මගින් වසර 30 ක දීර්ඝ කාලීන බදු පදනමට රු .මිලියන 1,300 කට තක්සේරු බදු වටිනාකමට මෙම ඉඩමේ හුක්තිය ලිඛිතව අදාල සමාගම වෙත භාරදී තිබුණි. මේ

පිළිබඳ අධිකාරියේ පවත්නා නීති ප්‍රතිපත්ති අනුව බදු මුදල් ගෙවා අවසන් වන තෙක් ඉඩමේ හුක්තිය ලබානොදිය යුතු වුවද, එයට පටහැනිව බදු මුදල් ගෙවා නොතිබියදී ඉඩමේ හුක්තිය භාරදී තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ නමුත් 2009 අගෝස්තු සිට 2013 සැප්තැම්බර් 25 දින දක්වා අවස්ථා 07 කදී රු .මිලියන 557 ක් පමණක් සමාගම විසින් බදු මුදල් ලෙස ගෙවා තිබුණි. එසේ වුවද සමාගම විසින් 2010 වර්ෂයේදී අත්සන් කළ අවබෝධතා ගිවිසුම පරිදි ඉඩමේ කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණු අතර එම ඉඩම රථගාලක් ලෙස යොදා ගනිමින් 2007 වසරේ සිට ආදායම් උපයා තිබුණි. පසුව 2013 මාර්තු 25 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබූ අතර එම ගිවිසුමට ද පටහැනිව උපයාගත් ආදායමින් අදාල ගෙවීම් අධිකාරිය වෙත නොගෙවා තිබියදීත් 2016 අගෝස්තු 12 දිනැති ප්‍රධාන තක්සේරුකරුගේ රු.මිලියන 3620 ක තක්සේරු වටිනාකමට නැවත 2017 පෙබරවාරි 16 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත වසර 50 කට බදුදීමට මුල් සමාගමේ හිමිකරු සතු තවත් සමාගමක් සමඟ රු.මිලියන 3,352 කට එකඟව් ගිවිසුම් ගතව් තිබුණි. ඉහත සමාගම 2007 සිට 2017 දක්වා වාහන ගාල් කිරීමට යොදවා ආදායම් ඉපයූ කාලය තුල ඉඩම වෙනුවෙන් ගෙවූ රු.මිලියන 557 ට පොලියක් ඔවුන් වෙත ගෙවිය යුතු බවට කල ඉල්ලීමට අනුව ප්‍රධාන තක්සේරුකරුගේ වටිනාකමින් රු.මිලියන 330 ක් අඩු කිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතියකින් තොරව ආයෝජනකරු සමඟ එකඟවීම නිසා අධිකාරියට දැරීමට සිදුවූ අලාභය සම්බන්ධව වගකිව යුතු පාර්ශවය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබූ අතර 2023 ජූලි 30 දින දක්වාම කිසිදු සංවර්ධන කටයුත්තක්ද එම ඉඩමේ සිදුකර නොතිබූ බවද නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිවරයාගේ නිරීක්ෂණ

විගණකාධිපති වාර්තාව සඳහා සභාපතිතුමාගේ නිරීක්ෂණ

---

1. මූල්‍ය ප්‍රකාශන

(අ) **<u>නිරීක්ෂණය</u>**

යෝජිත කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගමේ ගබඩා සංකීර්ණය පිහිටි ඉඩකඩද ඇතුළුව පැලියගොඩ පිහිටි ඉඩම් වරාය අධිකාරිය වෙත පවරා ගැනීම සඳහා එම අධිකාරිය විසින් කරන ලද ඉල්ලීමකට අනුව පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගම ඇවර කිරීම සඳහා තීරණය කර ඇත.

ඒ අනුව, 2014 වර්ෂයේ දී එම සමාගමේ මෙහෙයුම් වියදම් ආවරණය කර ගැනීම සඳහා එහි මෙහෙයුම් කටයුතු ඇවර කිරීමට යටත්ව පවත්වාගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇත. කෙසේ වෙතත් 2017 වර්ෂය දක්වාත් වරාය අධිකාරිය විසින් ඒ සඳහා අදාළ ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් එම සමාගම ඇවර කිරීමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබුණි.

පසුව 2017 වර්ෂයේදී වරාය අධිකාරිය විසින් උක්ත යෝජිත වරාය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකරන බවත්, තවදුරටත් ඔවුන් වෙත අදාළ ඉඩම් ඇතුළත්ව පැලියගොඩ පිහිටි ඉඩම අවශ්‍ය නොවන බවත් දන්වා තිබූ හෙයින් PWCC සමාගම 2017.08.31 දින සිට මෙහෙයුම් කටයුතු හා වත්කම් අධිකාරිය වෙත පවරා ඇවර කිරීමේ කටයුතු අවසන් කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, අදාල ගුදම් සංකීර්ණ පරිපාලනය හා එම සමාගම සතුව පැවති අනෙකුත් වත්කම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇත.

2012 සිට 2016 වර්ෂය දක්වා පැලියගොඩ ගබඩා සංකීර්ණ සමාගමේ ගිණුම් විගණනයට ඉදිරිපත් කර ඇත. එම සමාගමේ 2017.12.31 දිනට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය වෙත එම සමාගම විසින් ලබා දී ඇති ගිණුම් වාර්තාවන් මඟින් රු.මිලියන 267.88 ක වත්කම් හා රු.මිලියන 25.74 ක වගකීම්වල තොරතුරු ඉදිරිපත් කර ඇති අතර, එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත.

කෙසේ වෙතත්, ඇවරකරු විසින් මේ දක්වා එම සමාගම් ඇවර කිරීමේ ගිණුම් ලබා දී නොමැති බැවින් 2017 වසරින් පසු එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර නොමැත. මේ සඳහා ඔහු වෙත වරින් වර අදාළ ලිපි සහ සිහි කැඳවීම් ලිපි යොමු කර ඇත. ඒ අනුව, 2023 වර්ෂයේදී මෙම සමාගම් ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු සිදුකරන ලෙසට ඇවරුකරු වෙත දැන්වීමටත්, එසේ නොමැත්තේ නම්, ඒ සම්බන්ධව නෛතිකව කටයුතු සිදු කිරීමට නිති අංශයට ලබා දීමට කටයුතු සිදු කරනු ලැබේ.

(ආ) **නිරීක්ෂණය**

සමාලෝචිත වර්ෂයට අදාළව නාගරික සංවර්ධන අධිකාරිය හා වෝටර්ස් එජ් සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව පාරිතෝෂික සඳහා ගැලපීම් සිදුකර ඇත. කෙසේවෙතත්, සමූහයට අයත් අනෙකුත් පරිපාලිත සමාගම් දෙක වන නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම හා ලංකා රෙස්ට් හවුස් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව පාරිතෝෂික සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කර නොමැති බැවින් ඒකාබද්ධ ගිණුම් සැකසීමේදී සැලකිල්ලට ගෙන නොමැත. කෙසේනමුත්, මව් සමාගම විසින් මේ සම්බන්ධව අදාළ පරිපාලිත සමාගම් වලට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කර ඇත. ඒ අනුව, උක්ත පරිපාලිත සමාගම් දෙක විසින් 2023 වර්ෂයේ සිට අවසන් ගිණුම් තුළ ඒ සම්බන්ධ අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(ඇ) **නිරීක්ෂණය**

ඉහත ප්‍රකාශය හා එකඟ වේ. වෝටර්ස් එජ් සමාගම විසින් 2020 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී 2020 නොවැම්බර් 12 දින සංස්ථාපනය කරන ලද වෝටර්ස් එජ් රීක්‍රිඒෂන් සමාගම සැලකිල්ලට ගෙන නොමැති අතර එලෙස පිළියෙල කරන ලද ගිණුම් පදනම් කරගෙන අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

මව් සමාගම විසින් මේ සම්බන්ධව පරිපාලිත සමාගමට අවශ්‍ය උපදෙස් ලබා දීම සිදු කර ඇති අතර වෝටර්ස් එජ් සමාගම විසින් 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී වෝටර්ස් එජ් රීක්‍රිඒෂන් සමාගමේ මූල්‍ය ප්‍රකාශන උපයෝගී කරගෙන සමූහයට අදාළ ගිණුම් පිළියෙල කර ඇත. ඒ අනුව, අධිකාරිය විසින් 2021 වර්ෂයට අදාළව ඒකාබද්ධ ගිණුම් සැකසීමේදී වෝටර්ස් එජ් සමාගමේ සමූහයට අදාළ ගිණුම් උපයෝගී කර ගෙන ඇත.

1.2.2 නාගරික සංවර්ධන අධිකාරිය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(i) **නිරීක්ෂණය**

මේ සම්බන්ධ අදාළ හෙළිදරව් කිරීම් 2021 වර්ෂයේ ඒකාබද්ධ ගිණුම් තුළ සිදු කර ඇති අතර නව තක්සේරු අගයන් ගිණුම් වලට ගැනීම 2022 වර්ෂයේ ගිණුම් වල සිදු කරනු ඇත.

(ii) **නිරීක්ෂණය**

අදාළ කල්බදු ගිණුම් සැසඳීමේදී මෙම දේපල වලට අදාළ කල්බදු ගිණුම් ද 2024 වසරේදී සංශෝධනයට ලක්කර නිවැරදි කරනු ලැබේ.

(ආ) **නිරීක්ෂණය**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන එක් එක් ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් ගණුදෙනුකාර තැම්පතු ගිණුම (6605) යටතේ බැර කරනු ලබන අතර එම ව්‍යාපෘතියට අදාළ ප්‍රාග්ධන වියදම් අදාළ ගිණුම් අංක යටතේ හර කරනු ලැබේ.

තවද, අධිකාරිය විසින් රජය හෝ රාජ්‍ය ආයතන වෙනුවෙන් සමාජීය සුභසිද්ධිය උදෙසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමක් සිදු කරනු ලබයි. එහිදී එලෙස කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් ලද අරමුදල් ගණුදෙනුකාර තැම්පතු (client deposit) ලෙස ගිණුම් අංක (6605) දරන ගිණුම යටතේ ගිණුම් ගත කරනු ලැබේ. එලෙස රාජ්‍ය ආයතන වෙනුවෙන් ඉදි කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් මෙම අධිකාරියේ නිලධාරීන් විසින් ලබා දෙනු ලබන උපදේශන සේවා වෙනුවෙන් සමස්ත ව්‍යාපෘති පිරිවැයෙන් එකඟ වූ යම් ප්‍රතිශතයක් (උදා .1%, 6% යනාදී ලෙස) උපදේශන සේවා ආදායම් ලෙස වෙනමම ගිණුම්ගත කර ඇත.

එලෙසම, එකී ව්‍යාපෘති වෙනුවෙන් ලද අරමුදල් (client deposit) එම ව්‍යාපෘතියේ ප්‍රාග්ධන වියදම් වල වටිනාකමට එරෙහිව කපා හරින අතර (set off) අදාළ ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති වලින් පැන නගින ලද ලාභය හෝ අලාභය වෙනමම හඳුනා ගැනීමේ ක්‍රම වේදයක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුගමනය නොකරයි.

(ඇ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 - දේපල පිරියත සහ උපකරණ**

නිරීක්ෂණය

එකඟ වේ.

අධිකාරියේ ස්ථාවර වත්කම් අතරින් දැනට භාවිතයේ පවතින නමුත් ක්ෂය වී අවසන් වූ වාහන ප්‍රත්‍යාගණනය සිදුකර 2023 වර්ෂය තුළදී අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම අනෙකුත් ස්ථාවර වත්කම් ද කාණ්ඩ වශයෙන් ප්‍රත්‍යාගණනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව අදාළ යාවත්කාලීන කිරීම් සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 17 - කල්බදු

(i) **නිරීක්ෂණය**

කල්බදු දේපල විලම්භිත කල්බදු ගිණුම තුළ සැසඳීම වත්කම් කළමනාකරණ හා අයකර ගැනීම් අංශය මඟින් මේ දිනවල සිදුකරමින් පවතින අතර, කල්බදු ආරම්භක දිනයන් සඳහන් නොවන දේපල හා කල්බදු සීමාව හඳුනා නොගත් කල්බදු දේපල කුමක්ද යන්න නිශ්චිත වශයෙන් හඳුනා ගනිමින් පවතී.

මේ වන විට හඳුනාගෙන ඇති විලම්භීත ගිණුමෙහි සැසඳිය යුතු එහෙත් විලම්භනය වීම සඳහා ගිණුමෙහි ඇතුළත් වී ඇති පහත සඳහන් ගිණුම් නිශ්චිතව හඳුනාගෙන ඇති අතර, එය ඔබගේ දැන ගැනීම සඳහා පහතින් ඉදිරිපත් කරමි.

1. කල්බදු දේපල නියමිත පරිදි විලම්භනය කර නොමැති එහෙත් විලම්භනය කළයුතු ගිණුම් 1004 ක් මේ වන විට නිශ්චිතව හඳුනාගෙන ඇත. එය 2024 වර්ෂයේ මුල් කාර්තුවෙහි ජර්නල් සටහන් මඟින් ගිණුම් ගත කර කල්බදු විලම්භීත ගිණුම යාවත්කාලීන කරනු ඇත.

2. කල්බදු විලම්භීත ගිණුමට ඇතුලත් කර ඇති අත්පිට මුදලට අවසතු කරන ලද දේපල 148 ක් හඳුනාගෙන ඇති අතර, කල්බදු විලම්භීත ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

3. කල්බදු පදනම යටතේ දේපල ලබාදී එහෙත් තවදුරටත් කල්බදු ගිණුම් අවසන් කර ඇති ගිණුම් ද විලම්භීත ගිණුමෙහි පවතී. මෙම දේපල කල්බදු ගිණුමෙන් ඉවත් කළයුතුය.

4. විවිධ (MISCL) යටතේ ඇති ගිණුම් 19 ක් ඇත , තවදුරටත් ගිණුම් සැසඳීමට පෙර අධ්‍යයනය කලයුතු අතර, ඒවා නිමකිරීම 2024 දෙවන කාර්තුවේදී සිදුකිරීමට බලාපොරොත්තු වේ.

5. කල්බදු දේපල 288 මාසික කුලී පදනම මත ලබාගත් දේපල වන අතර, ගිණුම් සංකේතයන් නිවැරදි කර නියමිත පිරිදි අදාල මාසික කුලී ගිණුම් සැසඳීමට 2024 වර්ෂයේ දෙවන කාර්තුවේදී සිදුකිරීමට බලාපොරොත්තු වේ.

6. සමස්ත විලම්භීත කල්බදු දේපල 421 ගිණුම් අධ්‍යයනය කළයුතු අතර, ඒවා සැසඳීමට ප්‍රමාණවත් තොරතුරු මේ වනතුරුත් සොයාගත නොහැකි වී ඇති හෙයින් තොරතුරු එක්රැස් කරගත් වහාම ගිණුම් සැසඳීමට හෝ තොරතුරු නොමැති ගිණුම් නිසි අනුමැතිය ලබාගෙන කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

(ii) <u>නිරීක්ෂණය</u>

සමාලෝචිත වර්ෂයේදී ආයෝජන මත පොලිය සඵලදායී පොලී අනුපාතය (EIR) භාවිතයෙන් වාර්තා කිරීමට අපොහොසත් වූ අතර 2021 වර්ෂයේදී සඵලදායී පොලී අනුපාතය අනුව වාර්තා කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(iii) <u>නිරීක්ෂණය</u>

අධිකාරිය විසින් කල්බදු පදනම මත ලබාගත් වාහන 28 ට අදාළ ගෙවිය යුතු කල්බදු වටිනාකම ජංගම හා ජංගම නොවන වගකීම් යටතේ පෙන්වා ඇති අතර ඊට අදාළ අවිනිශ්චිත පොලී ගිණුම් වන රු.මිලියන 56.41 ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත. කෙසේවෙතත්, ඊට අදාළ ගිණුම්කරණ සටහන නිවැරදි කර පෙන්වීම 2021 වර්ෂයේ සිට සිදු කර ඇත.

(ඉ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 - රාජ්‍ය ප්‍රදාන**

නිරීක්ෂණය

මෙම අධිකාරිය වෙත 1981,1984 හා 1991 වර්ෂ වලදී සෙත්සිරිපාය අදියර 1 ගොඩනැගිල්ල හා මැද කොළඹ වෙළෙඳ සංකීර්ණය හා එවකට ක්‍රියාත්මකව පැවති සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මහාභාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබී ඇති අතර එම කාල වකවානුවේදී මෙම මුදල් ගිණුම් අංක 6161, 6164 හා 6162 යටතේ ගිණුම්ගත කර ඇත.

පසුව ගිණුම් ප්‍රමිත ප්‍රකාරව මෙම රාජ්‍ය ප්‍රදාන වාර්ෂිකව ක්‍රමක්ෂය කළ යුතු බවට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමාලෝචන මණ්ඩලය විසින් ලබා දුන් නිර්දේශයන් මත පැරණි ගිණුම් අනුව, සෙත්සිරිපාය අදියර 1 ගොඩනැගිල්ල හා මැද කොළඹ වෙළෙඳ සංකීර්ණය වෙනුවෙන් ලද මුදල් පිළිවෙලින් 6161, 6162 යටතේ ගිණුම් ගත කර ඇති අතර, රාජ්‍ය ප්‍රදාන පමණක් වත්කමේ ජීව කාලය පදනම්ව ක්‍රමක්ෂය කිරීම සිදු කර ඇත.

ඒ අනුව, ගිණුම් අංක 6164 යටතේ දක්වා ඇති ප්‍රදානයට අදාළව ඉදිකරන ලද වත්කම් සම්බන්ධව තොරතුරු සොයාගැනීමට ඇති අපහසුතාවය හේතුවෙන් රු. මිලියන 357.39 ක් වටිනාකමැති ප්‍රදාන එසේ ක්‍රමක්ෂය සිදුකර නොතිබූ බව දන්වා සිටීමට කැමැත්තෙමු.

මෙම ගණුදෙනු 1981, 1984 හා 1991 වර්ෂ වල සිදු වී ඇති බැවින් (ආසන්න වශයෙන් අවුරුදු 30 ක් 40 ක් අතර කාල සීමවකදී සිදු වී ඇති බැවින්) ඊට අදාළ මූලික ලේඛන විගණනය වෙත ඉදිරිපත් කිරීමට මෙම අධිකාරිය සතුව නොමැති බව දන්වමි.

(ඊ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 - වත්කම් හානිකරණය**

(i) **නිරීක්ෂණය**

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතියේ නම	නොනිමි වැඩ ලේඛණයේ ශේෂය (රු.)	නිරීක්ෂණය
31804000	Meethotamulla Dumpsite re development Project	333,601,953	මීතොටමුල්ල කසල කන්ද ආශ්‍රිතව පාරිසරික ගැටලු තත්ත්වය හේතුවෙන් එවකට පැවති අමාත්‍යාංශය මඟින් ලබා දී තිබූ උපදෙස් මත මූලිකව මෙම කසල කන්ද ව්‍යුහාත්මක ස්ථායිකරණය කිරීම තුළින් මහජනතාව වෙත ඇති බලපෑම අවම කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් මත ක්‍රියාත්මක කර ඇත. පසුව මෙම භූමිය නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම තුළින් මහජනතාව වෙත ලබා දීම සඳහා PPP ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරණ මණ්ඩල අනුමැතිය

			ලබා දී ඇත. එසේම මෙම ඉඩමේ කොටසකට අදාළව අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොමැති බැවින් මෙම ව්‍යාපෘතිය තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ පෙන්වීමට කටයුතු කර ඇත.
3560500	Kotuwegoda Market Area development	16,069,302	කොටුවේගොඩ වෙළෙඳ සංකීර්ණය පිහිටි භූමිය සඳහා බලයලත් මිනින්දෝරු එල්.ආර්. ජයසුන්දර මහතා විසින් මැන පිළියෙල කරන ලද 2000 දෙසැම්බර් 26 දාතම දරන මිනින්දෝරු සැලැස්මේ කැබලි අංක E, F හා G මඟින් පෙන්නුම් කරනු ලබන විශාලත්වයෙන් හෙක්.0.89504 ක් වූ ඉඩම 2001.10.26 දිනැති අංක 1207/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන අධිකාරි පතතේ 15 වන වගන්තිය යටතේ අධිකාරිය වෙත පැවරී ඇත. එසේම විෂයගත දේපල සම්බන්ධ ගණුදෙනු සටහන් කිරීම ව්‍යාපෘති අංක 95906 යටතේ සිදු කර ඇත. කෙසේවෙතත්, විගණන ඇමුණුමේ සඳහන් ව්‍යාපෘති අංකයෙහි නොගැලපීමක් පවතින බව නිරීක්ෂණය වන අතර මේ සම්බන්ධව කරුණු සොයා බැලීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි.
	අනෙකුත් ව්‍යාපෘති 9	906,654	ඉඩම් අත්පත් කරගැනීම් සම්බන්ධයෙන් දරන ලද මූලික වියදම් මෙම ව්‍යාපෘති පිරිවැය තුළ අන්තර්ගත වේ. ඒ අනුව, මෙම ඉඩම් අත්පත් කරගැනීම් සම්බන්ධ වර්තමාන ප්‍රගතිය ඉඩම් අංශය වෙතින් ලබා ගෙන අදාළ ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක නොවන්නේ නම් කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන පොත් වලින් ඉවත් කිරීම හා ඊට අදාළ ගැලපීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

(ii) **නිරීක්ෂණය**

මෙම ප්‍රකාශය සමඟ එකඟ විය නොහැක. මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2019/12/31 දිනට ආයෝජිත දේපල වල සමස්ත වටිනාකම හා 2020 /12/31 දිනට ආයෝජිත දේපල වල සමස්ත වටිනාකම පහත පරිදි වේ.

වර්ෂය	පිරිවැය (රු.)
2020/12/31	94,730,328,940
2019/12/31	98,308,384,910
2019 හා 2020 අතර ශුද්ධ වෙනස	(3,578,055,970)
ගැලපීම් (සටහන් 01)	4,498,200,000
ගැලපීම ඉවත් කරපසු ශුද්ධ වැඩිවීම	920,144,030

සටහන් අංක 01 - මූල්‍ය ප්‍රකාශන තුළ සටහන් අංක 10 හි අනාවරණය කර ඇති පරිදි සමාලෝචිත වර්ෂයේදී ආයෝජන දේපල යටතේ 2014 වර්ෂයේදී ඇතුළත්ව තිබූ බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු වන්දි මුදල වූ රු. 4,498,200,000/- ක මුදල එම ව්‍යාපෘතියෙහි අයිතිය රජය විසින් 2020 වර්ෂයේදී නැවත විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැවරීම හේතුවෙන්, ගෙවියයුතු ලෙස ගිණුම්ගත කර තිබූ මුදල ඉවත් කරන ලදි.

ඒ අනුව, 2019 හා 2020 වර්ෂයන් අතර ශුද්ධ වෙනස වූ රු. (3,578,055,970) වටිනාකමින් බේරේ වැව ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ගෙවිය යුතු වන්දි මුදල වූ රු. 4,498,200,000 වටිනාකම ඉවත් වූ පසු වර්ෂයට අදාළ ශුද්ධ වැඩිවීම රු. 920,144,030 කි. මෙම ශුද්ධ වැඩිවීම සමන්විත වනුයේ සමාලොචිත වර්ෂයේ ආයෝජිත දේපල වල අඩංගු ව්‍යාපෘති 47 ක වැඩිවීම් රු.මිලියන 1137.85 ක් හා ව්‍යාපෘති 11 ක අඩුවීම් (ජර්නල් මඟින් වැරදි නිවැරදි කිරීම් මත) රු.මිලියන 217.7 කිනි. අප විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශුද්ධ වැඩිවීම වූ රු.මිලියන 920.14 වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ වෙන වෙනම පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත.

මෙමඟින් ආයෝජිත දේපල වල සමස්ත වටිනාකමෙහි කිසිදු වෙනසක් සිදු නොවන නමුත්, 2021 වර්ෂයේ සිට වැඩිවීම් හා අඩුවීම් වෙන වෙනම පෙන්නුම් කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමු.

(උ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 38 - අස්පෘශ්‍ය වත්කම්**

<u>නිරීක්ෂණය</u>

මෙම ප්‍රකාශය සමඟ එකඟ වේ. අධිකාරිය විසින් අධිකාරිය සතු පද්ධති සහ මෘදුකාංග වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ දේපල පිරියත හා උපකරණ යටතේ පෙන්නුම් කර ඇත. කෙසේනමුත්, විගණන මඟින් පෙන්වා දී ඇති පරිදි පද්ධති සහ මෘදුකාංග වල පිරිවැය 2021 වර්ෂයේ සිට අස්පෘශ්‍ය වත්කම් යටතේ පෙන්නුම් කිරීමට කටයුතු සිදු කර ඇත.

කෙසේනමුත්, පද්ධති සහ මෘදුකාංග වල පිරිවැය මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ දේපල පිරියත හා උපකරණ යටතේ පෙන්වීම තුළ දේපල පිරියත හා උපකරණ වල අධිගණනයක් සිදු වුවද අධිකාරියේ සමස්ත වත්කම් වල අධිගණනයක් සිදු වී නොමැති බව වැඩිදුරටත් දන්වා සිටීමට කැමැත්තෙමු.

(ඌ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 - ආයෝජන දේපල**

(i) **<u>නිරීක්ෂණය</u>**

<u>නගර සංවර්ධන හා අලංකරණ කටයුතු සඳහා වූ ව්‍යාපෘති 13 ක් වෙනුවෙන් වැයකරන ලද රු.මිලියන 508.86</u>

මේ වන විට අධිකාරිය සතු ආයෝජිත දේපල හඳුනාගෙන තක්සේරු වාර්තාවක් පිළියෙළ කර ඇති අතර එම අගයන් ගිණුම් වලට ගැලපීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවති. මෙම ක්‍රියාවලිය තුළදී දේපල පැහැදිලිව හඳුනා ගැනීමට හැකි වන පරිදි ව්‍යාපෘති නාමයන් ද නිවැරදි කිරීමටත් ඒ සඳහා උප ව්‍යාපෘති අංක හඳුන්වා දීමටත් කටයුතු සිදු කරමින් පවති . ඒ අනුව මෙම ව්‍යාපෘති 13 ට අදාළව අධිකාරිය වෙත වත්කමක් ජනිත වී නොපවතින්නේ නම් එම අගයන් අවශ්‍ය අනුමැතීන් ලබා ගෙන 2023 වර්ෂයේ ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

<u>ලියාහල අගය රු. මිලියන 43.19 ක් වූ අධිකාරිය සතු දේපල, පිරියත</u>

ඉහත ලියාහල අගය ලෙස දක්වා ඇති රු.මිලියන 43.19 ක වටිනාකමෙන් නිරූපණය වනුයේ මෙම අධිකාරියට අයත් සංචාරක බංගලා වලට අදාළ පිරිවැය වන අතර, මෙම සංචාරක බංගලා අධිකාරියේ කාර්යමණ්ඩලවලට අමතරව බාහිර පාර්ශවයන් වෙත ලබා දීම මඟින් ආදායම් ඉපැයීම් සිදු කරනු ලබන බැවින්, එම වත්කම් ආයෝජිත දේපල යටතේ පෙන්නුම් කර ඇත.

කෙසේනමුත්, විගණනය මඟින් පෙන්නුම් කර ඇති පරිදි මෙම ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන වල පෙන්වීමේදී අධිකාරියේ දේපල පිරියත උපකරණ වර්ගීකරණය යටතේ 2021 වර්ෂයේ සිට ගිණුම් වල පෙන්නුම් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

<u>වෙනත් ආයතන වෙනුවෙන් සිදු කල ව්‍යාපෘති 5ක් ද, ආයෝජන දේපල ලෙස ගිණුම්ගත කර තිබීම.</u>

අදාළ ව්‍යාපෘති ලැයිස්තුවෙන් ව්‍යාපෘති අංක 3820200 – Dankotuwa Town Centre Development සහ 3870200 – Kaduruwela Town Expansion Project දරන ව්‍යාපෘති වලට පමණක් පිළිවෙලින් Jetwing Hotel (Pvt) Ltd සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය හරහා අදාළ ගණුදෙනුකාර තැම්පතු ලැබී තිබිණි. අනෙකුත් ව්‍යාපෘති 03 සඳහා කිසිදු ගණුදෙනුකාර තැම්පතු මුදලක් ලැබී නොමැති බැවින් එම ව්‍යාපෘති ආයෝජන දේපල (Investment Property) ලැයිස්තුවෙන් ඉවත් කිරීමට හැකියාවක් නොපවතී.

එබැවින්, ඉහත සඳහන් කල ව්‍යාපෘති 02 පමණක් සංවර්ධන වියදම් උපලේඛනයේ (Development Expenditure Schedule) ආයෝජන දේපල ලැයිස්තුවෙන් (Investment Property) ඉවත් කොට අදාළ ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති ලැයිස්තුව (Client Project List) යටතේ 2021 වර්ෂයේදී පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

2021.03.11 දිනැති ලිපිය අනුව පාර්ලිමේන්තු ඉඩමට අයත් අක්කර 1167 ක් වූ ඉඩමින් කින් අක්කර 37 ක් නාගරික සංවර්ධන අධිකාරියේ භාවිතය සඳහා වෙන් කර තිබුණි.

එම ඉඩම් 2020 වර්ෂයේ ආයෝජිත දේපල තක්සේරුවේදී හඳුනාගෙන ඇති අතර, මේ සම්බන්ධයෙන් අධිකාරිය විසින් තෝරා ගත් බාහිර විගණන සමාගම විසින් ලබා දෙනු ලබන නිර්දේශ මත 2021 වර්ෂයේ ගිණුම්වල අදාළ ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ii) **<u>නිරීක්ෂණය</u>**

අධිකාරිය සතු ආයෝජිත දේපල තුළ ඇතුළත්ව ඇත්තේ අධිකාරිය සතුව පවත්නා ඉඩම් සහ ගොඩනැඟිලිවේ. ඒ අනුව එම දේපල විවිධ වූ සංවර්ධන කාර්යයන් සඳහා බාහිර පාර්ශවයන් වෙත අවුරුදු 30, 50 හා 99 යනාදී ලෙස දිගුකාලීන බදු පදනම මත බදු දී ඇත. එලෙසම අධිකාරිය විසින් මෙම ඉඩම් හා ගොඩනැගිලි 2012 වර්ෂයේදී නව ගිණුම්කරණ ප්‍රමිත වෙත අනුගත වීමේදී ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට හා දිගුකාලයක් ගතවීම හේතුවෙන් එවකට රජයේ විගණන අංශය සමඟ සාකච්ජා කර අභ්‍යන්තර තක්සේරු කමිටුවක් මඟින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදි. අධිකාරිය සතුව ඇති ආයෝජිත දේපල ප්‍රත්‍යාගණනය කර සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරී ආයතනයක ගිණුම්කරණ සහාය ඇතිව 2011/01/01 දිනට පැවති වටිනාකම් ගිණුම් පොත් වලට ගැනීම සිදු කර ඇත. එහිදී අධිකාරිය සතු 99 අවුරුදු බදු පදනම මත ලබා දුන් දේපල හැර අනෙකුත් දේපල තක්සේරු වාර්තා පදනම්ව ගිණුම් වලට ගැනීමට කටයුතු කර ඇත. 99 අවුරුදු බදු පදනම මත ලබා දුන් ඉඩම් වත්කම් බැහැර කිරීමක් ලෙස සලකා පොත් වලින් ඉවත් කල යුතු බවට දන්වන ලදි.

මෙහිදී 99 අවුරුදු ලෙස බදු දී තිබූ ආයෝජිත දේපල ඓතිහාසික පිරිවැය යටතේ ගිණුම්ගත කරනු ලැබුවේ මෙකී ඉඩම් රජය සතු ඉඩම් වන අතර, ඒවා ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන් ඉවත් කිරීමක් සිදු කලහොත් ඒ සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීම මත අධිකාරියේ කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය සහිතව එම ආයෝජිත දේපල වල ඓතිහාසික පිරිවැයට ගිණුම් පොත්වල පෙන්වීමට කටයුතු සිදු කර ඇත.

කෙසේවෙතත්, අධිකාරිය සතු ආයෝජිත දේපල (ඉඩම් හා ගොඩනැගිලි) ඒවායේ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම ගිණුම්ගත කිරීම සිදු කල යුතු බවට රජයේ විගණන අංශය විසින් දිගින් දිගටම පෙන්වා දීම හේතුවෙන් අධිකාරිය විසින් 2021 වර්ෂයේදී ලබා ගන්නා ලද නව තක්සේරු වාර්තාව ගිණුම්ගත කිරීම හා ඊට අදාළව සිදුකල යුතු හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් උපදේශන සේවාව ලබා ගැනීම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව බාහිර විගණන ආයතනයක සේවාව ලබා ගැනීමට කටයුතු සිදුකර ඇත.

එසේම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මඟින් ලබාදුන් උපදෙස් පරිදි එසේ වත්කම් වල වෙළෙඳපොළ වටිනාකම ගිණුම් වලට ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය හා ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිත සමීක්ෂණ මණ්ඩලය මඟින් වැඩිදුරටත් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. ඒ අනුව, මේ සම්බන්ධව උක්ත ආයතන මඟින් ලබා දෙනු ලබන නිර්දේශ පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කල යුතු ගිණුම්කරණ ගැලපීම් හා හෙළිදරව් කිරීම් 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

ගණකාධිකරණ අඩුපාඩු

(එ) **නිරීක්ෂණය**

ගිණුම් කේත අංකය	ගිණුමේ නම	හර / (බැර) ශේෂය (රු.)	ශුද්ධ වටිනාකම (රු.)	මූල්‍ය ප්‍රකාශන කට්ටලයේ පෙන්නුම් කරනු ලබන සටහන් අංකය
4122	Debenture Loans	(539,983,980)		මෙම ගිණුම් අංක 04 අධිකාරිය විසින් 2010 වර්ෂයේදී නිකුත් කරන ලද ණයකර ගිණුම් තැබීම සඳහා හඳුන්වා දී ඇත. වර්තමානයේ මෙම ගිණුමට අදාළ ශේෂය වූ රු.19,978 /- ශේෂය 2010 වර්ෂයේදී සිදු වූ ගණුදෙනු හේතුවෙන් මේ සම්බන්ධව පරීක්ෂා කර බලා ගිණුම් වල සිදු කල යුතු වෙනස්කම් 2021 වර්ෂයේ
6620	Debenture Loan P/ble-Curr-year			
	Repayment of Debenuture Loan	(88,500,000)		
4172	Debenture Loan paid-curr-Year	590,983,778		

7620		37,520,000	19,798	ගිණුම්වල සිදු කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි.
4102	Car Park Fund	20,000	20,000	මෙම අගය රඳවා ගැනීමේ ලාභ ගිණුමට ඇතුළත් වී ඇති අතර මෙම වටිනාකම එම ගිණුමට මාරු කිරීම 2021 වර්ෂයේ ගිණුම්වල සිදු කිරීමට කටයුතු කරනු ඇත.

(ඒ) **නිරීක්ෂණය**

ඉහත ප්‍රකාශය සමඟ සම්පූර්ණයෙන් එකඟ නොවන අතර අප ආයතනය විසින් රට පුරා ක්‍රියාත්මක වන නොයෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ව්‍යාපෘති අංකයක් යටතේ **(Project Code)** එක් එක් වියදම් ශීර්ෂයන් භාවිතා කරමින් **(Account Code)** ගණුදෙනු සටහන් කිරීම සිදු කරනු ලබයි.

විගණන විමසුමේ සඳහන් පරිදි **2020.12.31** දිනට ශේෂ පිරික්සුමේ සංවර්ධන වියදම් වලට අදාළ ගිණුම් අංක සියල්ලෙහි සමස්ත එකතුව වන රු. **162,280,560,957.73** පහත පරිදි සැදුම්ලත්ව ඇත.

සංවර්ධන වියදම් ගිණුම් **115** හි එකතුව **157,437,704,413.73** (ගිණුම් අංක 2101-2699)

උපලේඛන **5** හි එකතුව **4,842,856,544.00** (ගිණුම් අංක **2995 -2999)**

(පැරණි ගිණුම් පද්ධතිය මඟින් **2001** වර්ෂයේදී ඉදිරියට ගෙන එනු ලැබූ ආරම්භක ශේෂයන්**)**

සමස්ත එකතුව **162,280,560,957.73**

අධිකාරිය ආරම්භයේ සිටම ශේෂ පිරික්සුම සැකසීමේදී ගිණුම් අංක ලබාදීම සිදු කර ඇත්තේ අදාළ වියදම් ස්වභාවය නිරූපණය වන පරිදිය. ඒ අනුව, අප වෙත සෑම වර්ගීකරණයන් යටතේ දරන ලද වියදම් පැහැදිලිව හඳුනාගත හැකි වී ඇත. එනම්, අත්පත් කරගැනීමට අදාළ වියදම්, ඉඳිකිරීම් වලට අදාළ වියදම්, සේවක වැටුප් ආදී වශයෙන්ය. ඒ අනුව, කිසියම් ව්‍යාපෘතියකට අදාළ වියදම් එම

ව්‍යාපෘති අංකය ලබාදීම තුළින් ලබා ගැනීමේ හැකියාව ඇත. ඒ අනුව, ව්‍යාපෘති වෙනුවෙන් දරනු ලබන අයභාර වියදම් ලාභාලාභ ගිණුමටත්, ප්‍රාග්ධන වියදම් නියමිත වර්ගීකරණය යටතේ ප්‍රාග්ධන වියදම් යටතේ පෙන්වීමටත් කටයුතු කර ඇත.

අධිකාරියේ පැවති පැරණි ගිණුම් පද්ධතියේ හා නව ගිණුම් පද්ධතියේ ඉහත සඳහන් සංවර්ධන වියදම් වලට අදාළ ගිණුම් වල එකතුව සංවර්ධන වියදම් උපලේඛනය තුළ වර්ගීකරණය කර පවතිනුයේ කෙරීගෙන යන වැඩ, ආයෝජන දේපල, දේපල පිරියත, ගණුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති හා වැඩ අවසන් කල නිවාස ව්‍යාපෘති ලෙසයි. ඒ අනුව අප විසින් ශේෂ පිරික්සුමේ 2020.12.31 දිනට ඉහත ගිණුම් අංක 115 සහ උපලේඛන 5 හි පැවති ශේෂයන්ගේ එකතුව අදාළ වර්ගීකරණයන් යටතේ 2020 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව පෙන්නුම් කර ඇති අතර ඊට අදාළ නිවැරදි උපලේඛනද අප විසින් රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත.

කෙසේ නමුත්, රජයේ විගණන අංශය විසින් නැවත ඉල්ලා සිටි පරිදි, ශේෂ පිරික්සුමේ සඳහන් සංවර්ධන ගිණුම් අංක 115 සහ උපලේඛන 5 හි ශේෂයන් ඉහත සඳහන් කර ඇති වර්ගීකරණයන් 5 හි අන්තර්ගත එකිනෙක ව්‍යාපෘති අංකයන්ට අදාළව ලබාදීමට කටයුතු සිදුකර තිබුණි. පැරණි ගිණුම් පද්ධතියෙන් හා නව ගිණුම්කරණ පද්ධතියෙන් එකිනෙක ව්‍යාපෘති අංකයන්ට අදාළව ශේෂ පිරික්සුමේ සඳහන් සංවර්ධන ගිණුම් වලට අදාළ එකිනෙක ගිණුම් වල ශේෂයන් සැකසීම් සම්බන්ධ ලේඛනයන් සැකසීමක්, මීට පෙර සිදුකර නොතිබූ බැවින් මූල්‍ය ප්‍රකාශන රජයේ විගණන අංශය වෙත ලබා දීමේ දී ඒ ආකාරයෙන් සකසන ලද ලේඛන ලබාදීමට නොහැකි වුව ද පසුව එය ලබා දීමට (මෘදු පිටපතක් ද සහිතව) කටයුතු කර ඇත. තවද මෙම කරුණු සම්බන්ධයෙන් ඔබ විසින් ඉල්ලා ඇති ආකාරයට සියළුම විස්තර ලබා දීමටත් හා මුදල් අංශයේ අදාළ නිලධාරීන් විසින් රජයේ විගණන අංශය වෙත පැමිණ ඊට අදාළ පැහැදිලි කිරීම් ලබාදීමටත් (පරිගණක පද්ධතියෙන් ඊට අදාළ උපලේඛන හා ශේෂ පිරික්සුමෙන් ඊට අදාළ ගිණුම් අංකයන්හි ශේෂයන් සමඟ සැසඳීම් ලබා දීම) සිදුකර ඇත.

කෙසේවෙතත්, විගණනය විසින් පෙන්වා දී ඇත්තේ ඉහත උපලේඛන **05** යටතේ දක්වා ඇති සංවර්ධන වියදම් සඳහා වෙන් වෙන්ව ගිණුම් අංක එක් එක් ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දිය යුතු බවයි. එසේ එක් එක් ව්‍යාපෘතියන් වෙනුවෙන් ගිණුම් අංක ලබා දීම සිදු කරනු ලැබුවහොත් එම ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් ඒවායේ වියදම් ස්වභාවය අනුව එනම්, අත්පත් කරගැනීමට අදාළ වියදම් **(ගිණුම් අංක 2102),** ඉඳිකිරීම් වලට අදාළ වියදම් **(ගිණුම් අංක 2203)** ආදී වශයෙන් ගිණුම්ගත නොවීම හේතුවෙන් අදාළ ව්‍යාපෘතියේ පිරිවැය අවශ්‍ය අවස්ථාවන්හිදී විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කිරීම, මෙකී ගිණුම්කරණ පද්ධතියේ ගැටලු සහගත තත්වයන් වන බව පෙන්වා දීමට කැමැත්තෙමි. එසේම රජයේ විගණන අංශය හා විවිධ ආයතන වෙත තොරතුරු ලබා දීම සඳහා අධිකාරිය ආරම්භයේ සිටම මෙම ගිණුම්කරණ ක්‍රමවේදය එවකට විගණනය විසින්ද දැනුවත් වී අනුගමනය කර ඇත.

කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් පද්ධතිය තුළ සිදු කල යුතු වෙනස්කම් සිදුකිරීම සඳහා අවශ්‍ය කමිටුවක් පත් කිරීමටත් ඊට අදාළ වැඩිදුර උපදේශනයන් රජයේ විගණන අංශය මඟින් ලබාගෙන 2022 ගිණුම් වලට අදාළව ශේෂපත්‍රය සංශෝධනය කර ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

(ඔ) **<u>නිරීක්ෂණය</u>**

RETSUP ලෙස ශේෂ පිරික්සුමේ දක්වා ඇති රු. මිලියන 2,147 ක මුදලින් නිරූපණය වනුයේ අධිකාරිය 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකිනෙක වර්ෂයන් තුළ වාර්තා කර තිබූ ලාභ හා අලාභයන්ගේ සමස්ත එකතුව වේ. එය පහත පරිදි සැකසී ඇත.

වර්ෂය	ලාභය / (අලාභය) රු.(මිලියන)
2016	219,781,082
2017	112,339,650
2018	755,269,339
2019	1060,456,317
සමස්ත එකතුව	**2,147,841,663**

2020/01/01 දිනට හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ රඳවා ගැනීමේ ගිණුමේ ආරම්භක (Retained earnings) ශේෂය වන රු. 75,636,837,782 ක වටිනාකම 2020/01/01 දිනට ශේෂ පිරික්සුමේ පහත ගිණුම් වලින් සැදුම්ලත් වී ඇත.

ගිණුම් අංකය	ගිණුමේ නම	**2020.01.01** දිනට ශේෂය (රු)
RETSUP		2,147,841,663
9999	Retained Earnings	993,270,282
	Capital Reserve	8,462,785
8123-8144 & 8151	Prior Year Adjustment	72,487,277,577
4102	Car Park Fund	20,000,000
සමස්ත එකතුව ශේෂ පිරික්සුමේ ගිණුම් අනුව		75,636,832,307
හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනයේ රඳවා ගැනීමේ ගිණුමේ ආරම්භක ශේෂය		75,636,837,782
වෙනස		**5,474**

ඒ අනුව, රදවා ගැනීම් ගිණුමේ ශේෂයට අදාළ ඉහත සඳහන් එකිනෙක ගිණුම් වල ශේෂයන් 2021 වර්ෂයේදී ගිණුම් අංක 9999 ට (රදවා ගැනීම් ගිණුම) මාරු කිරීමට කටයුතු සිදු කර ඇති අතර තවදුරටත් ඉහතින් දක්වා ඇති වෙනස වන රු. 5,474 සම්බන්ධව කරුණු සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ලබන බව දන්වා සිටිමි.

(ඕ) **<u>නිරීක්ෂණය</u>**

අවුරුදු 99 කල්බදු පදනම මත ලබාදුන් රු. මිලියන 2,098.2 වටිනා ඉඩම් කොටස් 02

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතියේ නම	කල්බද්දේ ආරම්භය	**2020.12.31** දිනට කල්බදු වටිනාකම	නිරීක්ෂණ
8191900	Welikada Land at National app	2021.07.30	2,012,400,000	මෙම කල්බදු ගණුදෙනුවට අදාළ ඉඩම සඳහා පිළිවෙලින් 2019.11.07 හා 2020.02.07 දින මුදල් ලැබී ඇති අතර, මෙම කල්බදු ගණුදෙනුවට අදාළ පරිගණක ගත ගිවිසුමේ ආරම්භක දිනය 2021.07.30 වශයෙන් සඳහන් කොට ඇත. ඉඩමෙහි මායිම සම්බන්ධව ඇතිවූ ගැටලුවක් මත කායික භුක්තිය භාරදුන් දින සිට දේපල ලබාගැනීමට ආයෝජකයා අකමැති වීම හේතුවෙන් 2021.07.30 දිනය බදු කාලයේ ආරම්භක දිනය ලෙස සලකා ඇත. කෙසේ වෙතත් පරිගණක පද්ධතිය තුළ විලම්භිත කල්බදු ගිණුමේ ආදායම ගිණුම් ගතවීම 2022 ජූලි මස සිට සිදුව ඇති අතර J34075 දරන ජර්නල් සටහන මඟින් 2023 නොවැම්බර් මස අදාළ නිවැරදි කිරීම් සිදුකර ඇත.
8087800	Acqu. Land at Madinnagoda from 70818	2021.09.24	85,800,000	මෙම ගණුදෙනුවට අදාළ ඉඩම සඳහා කල්බදු වශයෙන් පිළිවෙලින් 2019.11.30 හා 2021.07.31 දින රු.343,200,000.00 ක මුදලක් ලැබී ඇති අතර, එම මුදල

				පමණක් විලම්භීත කල්බදු ලේඛනයේ යාවත්කාලීන වී ඇත. තවද මෙම ගණුදෙනුවට අදාළ ගිවිසුමට අනුව කල්බදු ආරම්භක දිනය 2021.09.24 වේ. කෙසේ වෙතත් කල්බදු ගිණුම්න් ආදායමට යා යුතු මුදල මේ දක්වා ගිණුම්ගත නොවීම හේතුවෙන් එම ප්‍රමාණය J34075 මහින් 2023 නොවැම්බර් මස ගිණුම්ගත කර අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකර ඇත.

කල්බදු කාලසීමාව ඉක්මවූ රු. මිලියන 7.15 ක වටිනාකම් කල්බදු සම්බන්ධව ඒවායේ ඇති ගිණුම්කරණ අඩුපාඩු දැනටමත් හඳුනාගෙන ඇති ඒ සම්බන්ධව නිවැරදි කිරීමේ කටයුතු දැනටමත් ආරම්භ කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

(ක) **<u>නිරීක්ෂණය</u>**

2020 වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භීත බදු වටිනාකම යටතේ,

නව කල්බදු වටිනාකම - රු.294,837,326.96

වන්දි නිවැරදි කිරීම / ජර්නල් සටහන් මඟින් - විලම්භීත කල්බදු ගිණුම

ගිණුම් ගත වූ වටිනාකම හර වටිනාකම රු.මි.319,180,647.81

බැර වටිනාකම රු.මි.235,896,066.59 ලෙස

දැක්වෙන බව දන්වා සිටිමි.

(ග) **<u>නිරීක්ෂණය</u>**

මෙම හඳුනා නොගැනීම් ශේෂය ඇතිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ, ගණුදෙනුකරුවන් බැංකුව වෙත ඍජුවම මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම වෙනුවෙන් තැන්පත් කරනු ලබන ගාස්තු සහ නිවාස වෙන්කරවා ගැනීම සඳහා එසේ ඍජුව ගෙවනු ලබන ගාස්තු පිළිබඳ විස්තර අධිකාරිය වෙත ලැබීම සඳහා ප්‍රමාණවත් කාලයක් ගතවීමයි. කෙසේවෙතත්, මේ වන විට අධිකාරිය විසින් එවැනි ගණුදෙනු හඳුනාගත හැකිවන පරිදි අධිකාරියේ භාවිතා කරනු ලබන මාර්ගගත පද්ධති වලට සිදු කල යුතු වෙනස්කම් සිදු කිරීම තොරතුරු තාක්ෂණ අංශය හරහා සිදු කරමින් පවතී.

තවද, මෙම කාර්යයන්හි නිරත නිළධාරීන් හා අදාල පළාත් කාර්යාල දැනුවත් කර 2023 වර්ෂය තුළදී එවැනි ගෙවීම් සම්බන්ධයෙන් අනුගමනය කල යුතු උපදෙස් සහිත ලිපි කිහිපයක් යොමු

කිරීමටත් කටයුතු කර ඇත. තවද, නිරන්තරයෙන් ඔවුන් සමඟ සම්බන්ධ වී එවැනි තැන්පතු හඳුනා ගැනීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සිදු කරමින් පවතී.

2020 වර්ෂයේ රට තුල පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රට වසා දැමීම හා නිවසේ සිට වැඩ කිරීම අනුගමනය කිරීමෙන් මෙම අධිකාරිය වෙත සැලසුම් අනුමත කරගැනීමේ කාර්යය වෙනුවෙන් ගණුදෙනුකරුවන් සෘජුව තැන්පත් කරන ලද ගණුදෙනු හා ඒවා තැන්පත් කරනු ලබන දිනයන් පිළිබඳ විස්තර ලබා ගැනීමට පැවති දුෂ්කරතාවයන් හේතුවෙන් එම තැන්පතු, තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් ලෙස දක්වා තිබුණි.

කෙසේවෙතත්, ඊට අදාළ තොරතුරු උප කාර්යාල වෙත යොමු කර ඒවායේ තැන්පතු තොරතුරු රැස් කර ඊට අදාළව ගිණුම් පද්ධතිය තුළ සිදු කලයුතු නිවැරදි කිරීම් බොහෝමයක් මේ වන විට සිදු කර ඇති අතර, තවදුරටත් පවත්නා එවැනි තැන්පත් වලට අදාළ තොරතුරු රැස් කරමින් පවතී.

(ව) **<u>නිරීක්ෂණය</u>**

එකඟ වේ.

2023 වර්ෂය සඳහා දැනට පරිත්‍යාග වශයෙන් ලැබූ වත්කම් වල වටිනාකම ගිණුම්ගත කිරීමේ කටයුතු 2023 වර්ෂයේම සිදුකිරීමට කටයුතු කෙරෙමින් පවතී. පෙර වර්ෂවල විවිධ ආයතන වලින් අධිකාරිය වෙත පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ වත්කම් හී වටිනාකම හඳුනාගෙන 2022 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ජ) **<u>නිරීක්ෂණය</u>**

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතිය	වටිනාකම (රු.)	පිළිතුර
5100500	Con. Of Housing Units Railway Land at Maligawatte	2,126,445,013	මෙම අගය 2022 වර්ෂයේ නිමකරන ලද නිවාස ව්‍යාපෘති වර්ගීකරණය යටතේ ගිණුම් වල පෙන්වීමට කටයුතු කරනු ලැබේ.

3520101	Penelaboda Housing Project under Naula Town Development	966,650	මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහා අයවැය ප්‍රතිපාදන අනුමත නොවූ බැවින් ඉදිකිරීම ප්‍රමාද වී ඇත. මෙම ව්‍යාපෘතිය අත්හැරදැමීමක් 2021 වර්ෂය තෙක් නිර්දේශ නොවූ බැවින් මෙම අගය පොත්වල දක්වා ඇත. මෙම ව්‍යාපෘතිය 2024 වසරේ ක්‍රියාකාරී සැලැස්මට (Action Plan) ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන බව මධ්‍යම පළාත් කාර්යාලය මඟින් දැනුම් දුන් අතර ඒ අනුව මෙම අගය පොත්වල තැබීම නිවැරදි වේ.

අනු අංකය	ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය	යෝජිත ගිණුම්කරණ නිවැරදි කිරීම
1	3180100 10/3/317	Kolonnawa	රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ මෙම අධිකාරිය වෙත පැවරී ඇති රජයේ කර්මාන්ත ශාලා ඉඩම තුළ කොලොන්නාව සංස්කෘතික මධ්‍යස්ථාන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, විෂයගත ඉඩමට ව්‍යාපෘති අංක 3180101 හා 6180100 ලෙස පරිගණකයේ පෙන්වා ඇත. මෙම ඉඩම තුළ ප්‍රමාණයෙන් අක්කර 03 ක නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය ලංකා බැංකුව, කාගිල්ස් ෆුඩ්සිටි යන ආයතනය වෙත බැහැර කර ඇත.	අදාළ අනුමැතීන් ලබා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

2	3240100	Maharagama	මෙම ව්‍යාපෘති අංකයට අදාළ ලිපිගොනුවක් සොයාගත නොහැක.	අදාළ අනුමැතීන් ලබා ගෙන ගිණුම් වලින් ඉවත් කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.
3	3270100 10/2/1587	Mattegoda සියඹලාගහවත්ත නැමැති ඉඩම අත්කර ගැනීම	විෂයගත ඉඩම මහරගම නගර සභාව වෙනුවෙන් අත්කර ගැනීම් කටයුතු ආරම්භ කර ඇති අතර, වන්දි ගෙවා අවසන් කර නොමැත. වන්දි ප්‍රතිපාදන මහරගම නගර සභාව මඟින් ලැබිය යුතු වූවත් මෙතෙක් එම ප්‍රතිපාදන ලැබී නොමැත.	අත්කර ගැනීම් කටයුතු අවසන් කර නොමැති බැවින් තවදුරටත් කෙරී ගෙන යන වැඩ ගිණුමේ පැවතීම නිවැරදි වේ.
4	3160100	Dehiwala – Mt. Lavinia	විෂයගත අත්කර ගැනීමට අදාළව පනතේ 38 (අ) වගන්තිය යටතේ අතුරු විධානය නිකුත් කර ඇති අතර, 17 වන වගන්තිය ප්‍රකාරව වන්දි තක්සේරුව මේ වන තෙක් නිකුත් කර නොමැත.	
5	8142800	Land at Perguson Road	1. තොටළඟ මෝදර උයන නිවාස ව්‍යාපෘතියේ URPCC නිවාස වැඩසටහන යටතේ ඉදිකර ඇත. 2. ඉතිරි කොටස AIIB ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 750 ක් ඉදිකිරීම ආරම්භ කර ඇත.	
6	8273600	Land at Attidiya Road	විෂයගත ඉඩම් කොටස අවසතු කර ඇත.	අදාළ අනුමැතීන් ලබා ගෙන ගිණුම් වලින් ඉවත්

				කිරීමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.
7	8460200	Janasaviya Kendraya - Kundasale	රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍රයකින් ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත.	ආයෝජිත දේපල වලට මාරු කිරීම 2022 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු සිදු කරනු ඇත.
8	8550100	Parawenigodawaththa Hikkaduwa	මෙම ඉඩමට අදාළ 44 වන සහතිකය ලැබී ඇති අතර 6 (1) වගන්තිය යටතේ දීමනා පත්‍රය ඉල්ලුම් කර ඇත.	ආයෝජිත දේපල වලට මාරු කිරීම 2022 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට කටයුතු සිදු කරනු ඇත.

ඉහත ව්‍යාපෘති වලට අදාළව ඒවායේ ව්‍යාපෘති නාමයන් ඉඩම් අංශයේ ඇති තොරතුරු වලට අනුව නිවැරදි කර 2021 ගිණුම් සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(ට) **<u>නිරීක්ෂණය</u>**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2013 වර්ෂයේදී රු.මිලියන 200 ක මුදලක් චෝටර්ස් ඒජ් සමාගමේ වැඩිදියුණු කිරීම් වෙනුවෙන් ලබා දී ඇති අතර එම මුදල පියවීම සඳහා කොටස් නිකුත් කිරීමට කටයුතු කරන ලෙස සමාගම වෙත දන්වා ඇත. එම වර්ෂයේ සිට මෙම යෝජිත කොටස් නිකුතුව අධිකාරියේ ගිණුම් වල මෙන්ම චෝටර්ස් ඒජ් සමාගමේ ගිණුම් වලද තාවකාලික කොටස් නිකුතුවක් ලෙස පෙන්වීමට කටයුතු සිදු කර තිබුනද එම කොටස් නිකුතුව මෙතෙක් සිදු කර නොමැති බැවින් එම ආයෝජනයට අදාළ කොටස් සහතික පත්‍රය විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි විය.

කෙසේවෙතත්, මේ සම්බන්ධයෙන් අදාළ සමාගම දැනුවත් කර ඊට අදාල ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු සිදු කරනු ලබන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

(ඩ) **<u>නිරීක්ෂණය</u>**

අධිකාරියේ පරිපාලිත සමාගමක් වන ලංකා රෙස්ට් හවුසස් සමාගම විසින් කළමනාකරණය කරනු ලබන තානායම් 31 ක් පැවතියත් තානායම් 29 ක අයිතිය අදාළ පළාත් පාලන ආයතන සතු වන අතර නාගරික සංවර්ධන අධිකාරියට අයත් තානායම් 02, 2020 වර්ෂයේ සිදුකරන ලද තක්සේරු වාර්තාවල ඇතුළත් කර ඇත.

(ත) **නිරීක්ෂණය**

අධිකාරිය තුළ ආරම්භයේදී පැවති ගිණුම් පද්ධතීන්වලට අවශ්‍ය පරිදි වියදම් හෝ ආදායම් උපචිත කිරීමට අදාළ ගිණුම් අංක 7 න් ආරම්භවන කේතයන් සහිත ගිණුම් හරහා සිදුවූ අතර එහි නිරවුල්වීම අංක 6 න් ආරම්භ වන කේතයන් ලෙස ගිණුම් 02 ක් පවත්වාගෙන ගොස් ඇත. අවසන් ගිණුම් සැකසීමේදී මෙම ගිණුම් අංක දෙකෙහිම පවතින ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් යටතේ නිවැරදිව පෙන්නුම් කිරීමට කටයුතු කර ඇත. කෙසේ නමුත්, නව පරිගණකගත ගිණුම්කරණ පද්ධතිය හඳුන්වාදීමත් සමඟ අංක 6 න් ආරම්භ ගිණුම් කේතය පමණක් භාවිතා කර වියදම් හෝ ආදායම් උපචිත කිරීම හා නිරවුල් කිරීම සිදු කරන ලෙසට අදාළ අංශයන් / නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත.

කෙසේ නමුත් විගණනය මඟින් පෙන්වාදී ඇති පරිදි වියදම් හෝ ආදායම් උපචිත කිරීම හා නිරවුල් කිරීම ගිණුම්ගත කිරීම සඳහා එක් ගිණුම් අංකයක් භාවිතා කිරීමටද ඊට සම්බන්ධිත අනෙකුත් ගිණුම් අංකයට අදාළව දැනට පවතින ශේෂයන් එම ගිණුම් අංකයටම මාරු කිරීමට ඉදිරියේදී කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමු.

(ද) **නිරීක්ෂණය**

2020 වර්ෂයේ ගෙවිය යුතු වන්දි හා පොලී ලේඛනපත් ව්‍යාපෘති 4 හි පැවති රු. මිලියන 366.55 ක වටිනාකම් ඉවත් කිරීමට හේතු වූ කරුණු පහත වේ.

ව්‍යාපෘති අංකය	වන්දි ලේඛනයෙන් ඉවත් කිරීමට හේතු
1.3240200	2019.12.31 දිනට ගෙවිය යුතු සම්පූර්ණ වන්දිය ගෙවා අවසන් බැවින් ගිණුම්වල අධි වෙන් කිරීම් ගලපා ඇත.
2.5100100	2020 වර්ෂය තුළ රු. මිලියන 57 ක් ගෙවා ඇති අතර, අධි වෙන් කිරීම් ගලපා ඇත.
3.9400300 – 4.9400300	ඉඩම් අත්කර ගැනීමේ පනතේ 50 වන වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇත. (Revoke)

ඒ අනුව, ජර්නල් අංක J 30714 යටතේ අදාළ ගැලපුම් 2020.12.31 දිනට සිදු කර ඇත.

1.2.3 අධිකාරියේ පරිපාලිත සමාගම් සම්බන්ධ විගණන මතයන් හා ප්‍රමාණාත්මක නිරීක්ෂණ

(i) ලංකා රෙස්ට් හවුසස් සමාගම

(අ) **නිරීක්ෂණය**

මෙම තානායම් ලංකා රෙස්ට් හවුසස් ආයතනය සතු දේපලක් නොවන බැවින් ලංකා රෙස්ට් හවුසස් ආයතනය මෙහි පරිපාලන කටයුතු පමණක් සිදු කරනු ලබයි. එබැවින් එම දේපල ලංකා රෙස්ට් හවුසස් ආයතනයේ වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කල නොහැක.

(ආ) **නිරීක්ෂණය**

2020 වර්ෂයේ අවසාන ගිණුම් වාර්තා වල 65% ආදායම පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු බැවින් එය ලංකා රෙස්ට් හවුසස් ආයතනයේ ආදායමක් ලෙස ගණනය නොකෙරුණි. එම වරද නිවැරදි කරමින් 2021 වර්ෂයේ අවසාන ගිණුමෙහි 2021 වර්ෂයට අදාළ ආදායම 35% මෙන්ම 65% ද ආයතනයේ ආදායමක් ලෙස වාර්ෂික ගිණුම තුළ ඇතුළත් කෙරුණි.

(ඇ) **නිරීක්ෂණය**

ලංකා රෙස්ට් හවුසස් ආයතනය 2010 වර්ෂයේ දී ලියාපදිංචි කර ඇති අතර ඊට පෙර රෙස්ට් හවුසස් සතු පරිපාලනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කර ඇත. 2010 වර්ෂයේ දී ලංකා රෙසට් හවුසස් ආයතනයට පවරා දීමේදී පැවති ස්ථාවර වත්කම් පිළිබඳ දත්ත තවදුරටත් සොයමින් පවතී.

(ii) නාගරික ආයෝජන සහ සංවර්ධන (පුද්ගලික) සමාගම

(අ) **නිරීක්ෂණය**

වර්තමානයේ Land Cruiser වාහනය තක්සේරු කිරීමේ ක්‍රියාවලිය පවතින අතරතුර සිදුවූ හදිසි නඩත්තු කටයුත්තක් හේතුකොට ගෙන එය Toyota Company යට යොමු කිරීමට සිදු වූ අතර එය නැවත යථා තත්වයට පත්කොට නැවත භාර දී ඇත. මේ වන විට වාහනය පරීක්ෂා ධාවන මට්ටමේ පවතින අතර එය අවසන් වූ විගස නැවත රජයේ තක්සේරු කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට නියමිතව ඇත.

තවද, අනෙකුත් ස්ථාවර වත්කම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත නැවත තක්සේරු කිරීම සඳහා "හොඳ තත්වයේ පවතින වත්කම් හා බැහැර කල යුතු වත්කම්" නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් අංශයේ තක්සේරු අංශයට යොමු කර ඇති අතර වර්තමානයේ එම අංශය එම ක්‍රියාවලියේ නිරත වී ඇති බැව් දන්වනු කැමැත්තෙමි.

තවද, එය අවසන් වූ විගස 2023 අවසන් ගිණුම් වලට ගැලපීමට නියමිතව ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

නීතිරීති / විධානයට යොමුව	අධිකාරියේ නිරීක්ෂණ
(අ) භාණ්ඩාගාර චක්‍රලේඛ	
(i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	අධිකාරියට අයත් අධිකාරිය භාරයේ පවත්නා, ප්‍රයෝජනයට ගනු ලබන සියළුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පොදු 287 ආකෘතියෙහි ඇතුළත් බොහෝ තොරතුරු පද්ධතියෙහි දැනටමත් ඇතුළත්ව ඇති අතර එම ආකෘතිය අනුව තොරතුරු තාක්ෂණ අංශය හරහා පද්ධති සැපයුම්කරු සම්බන්ධකර 2023 වර්ෂය තුළ පද්ධතිය තවදුරටත් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක පිරිඩි/12	
(i) 10.2.4 (අ) (ආ) ජේද	සමාගම ඇවර කිරීම ආරම්භ කරන ලද 2012.07.31 දින සිට 2017.08.31 දින දක්වා එහි කටයුතු සිදු කිරීම සඳහා අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත කරුණු වාර්තා කර ඇත. ඇවර කිරීම මාස 6 ක් තුළ සිදු කිරීමට නොහැකි වූයේ ප්‍රධාන වශයෙන් වරාය අධිකාරිය විසින් යටෝක්ත ඉඩම භාර ගැනීම සඳහා කටයුතු නොකිරීම හා යෝජිත කොළඹ වරාය වැඩිදියුණු කිරීමේ සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම හා ඒ බැව් වාර්තා කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් ගත කිරීමයි. එසේම එම ගබඩා සංකීර්ණයේ සේවා පහසුකම් ලබා ගෙන තිබූ ආයතන විසින් ඉන් ඉවත් වීම සඳහා ප්‍රමාණවත් කාල සීමාවක් ගත කිරීම හේතුවෙනි. අදාළ ඇවර කිරීමේ කාල සීමාව දීර්ඝ කිරීම සඳහා වෙනමම අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන නොමැත. කෙසේ වුවද, කළමනාකරණ මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි අදාළ ඇවර කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි.

(ඇ)	2007 අංක 7 දරන සමාගම් පනතේ 270 (ආ) ඡේදය	මේ සඳහා වන කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව, එක් එක් සමාගම සඳහා විශේෂ යෝජනා සම්මුති සකසා අනුමැතිය ලබා ගැනීමට පියවර ගනිමින් සිටී.
(ඈ)	2006 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය	
(i)	4.2.1 (අ), (ආ), සහ (ඉ) වගන්තීන් සහ 4.2.2 (අ) වගන්තිය,	2020 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇති අතර එහි ප්‍රසම්පාදනය ආරම්භ කරන දිනය හා ප්‍රසම්පාදනය අවසන් කිරීමට අපේක්ෂිත කාලය සඳහන් කර ඇත.
(ii)	8.10.1 වගන්තිය සහ 8.11.4 (අ) (i) වගන්තිය,	අධිකාරිය විසින් 2023.01.01 දින සිට 2023.06.30 දින දක්වා ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කර ඇති අතර අධිකාරියේ කොන්ත්‍රාත් පැහැරහැරි කොන්ත්‍රාත්කරුවන් නොමැති බැවින් අදාළ දත්ත මූලාශ්‍රයන් ලබාගත නොහැක. ඉදිරියේදී එවැනි කොන්ත්‍රාත්කරුවන් ඇතිවුවහොත් ඒ පිළිබඳ තොරතුරු අධිකාරියේ වෙබ් අඩවියේ පලකරනු ඇත.
(ඉ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ PED 03/2015	අංක 13/2013 හා 2013.08.07 දිනැති කළමනාකරණ මණ්ඩල අනුමැතිය මඟින් ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් හා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු සඳහා කළමනාකරණ මණ්ඩල සාමාජිකයින් ලෙස සහභාගීවීමේදී ගෙවනු ලබන සහභාගීත්ව දීමනාව ගෙවීමට අනුමැතිය ලැබී ඇත. නමුත් විගණනය විසින් අදාළ ගෙවීම නීත්‍යානුකූල නොවන බව පෙන්වාදීමත් සමඟ 2020 නොවැම්බර් මස සිට එම ගෙවීම සිදුකර නොමැත. එසේම 2013 ජනවාරි සිට 2020 නොවැම්බර් දක්වා ඉහත නිලධාරීන් වෙත සහභාගීත්වය වෙනුවෙන් ගෙවනු ලැබූ දීමනාව අයකර ගැනීමට අදාළ මුදල, එකී නිලධාරීන්ට දැනුම්දීම සඳහා 2023.06.22 දිනැති කළමනාකරණ මණ්ඩලයේදී තීරණය කර ඇත. ඒ අනුව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

2.2.3

	බලතල, කර්තව්‍ය, කාර්යයන්	අධිකාරියේ නිරීක්ෂණ
(අ)	1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 8 ඡේදයේ (එ) වගන්තිය	මේ පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් අමාත්‍යාංශය වෙත 2023.06.26 වන දින ඉදිරිපත් කර ඇත.
(ආ)	1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරියේ (සංශෝධන) පනත II කොටසේ 8 (අ) වගන්තිය	2023.11.25 දිනට ප්‍රකාශයට පත් කර ඇති නාගරික බල ප්‍රදේශ 276 අතුරින් 2023 ජූලි මස 13 වන විට සංවර්ධන සැලසුම් 54 ක් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කර ඇත. මීට පළාත් පාලන ආයතන 85 ක් අයත්වේ. 2023.11.30 වනවිට ගැසට් මඟින් ප්‍රකාශයට පත්කර ඇති සංවර්ධන සැලසුම් ගණන 56 ක් වන අතර, ඊට අයත්වන පළාත් පාලන ආයතන ගණන 88 කි. එමෙන්ම 2023 දෙසැම්බර් මස වන විටදී තවත් පළාත් පාලන ආයතන 05 ක් සඳහා සංවර්ධන සැලසුම් ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින අතර, 2024 වර්ෂයේදී පළාත් පාලන ආයතන 22 සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට ඉලක්ක කර ඇත. එමෙන්ම 2025 - 2030 කාල වකවානුව තුළ ඉතිරි නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට යෝජිතව ඇත.

2.2.4

(අ) **<u>නිරීක්ෂණය</u>**

වර්තමානය වනවිට මෙම අධිකාරිය වෙත නිවාස සංකීර්ණවලට අදාළ ඉඩම් අයිතිය පවරාගෙන ඇති ආකාරය පහත පරිදි වේ.

I ඉඩම් අයිතිය පැවරී ඇති නිවාස සංකීර්ණවල සරාංශය

1	මිහිඳුසෙන්පුර	9	මුවදොර උයන
2	මෙත්සර උයන	10	ලක්සෙත සෙවණ
3	සිරිසර උයන	11	ලක්හිරු සෙවණ
4	සිරිසඳ සෙවණ	12	හාබ(ර්) විවි රෙසිඩන්සිස්
5	මිහිජය සෙවණ	13	කොළොම්තොට සරසවි උයන
6	මෙත්සඳ සෙවණ	14	පුරදොර සෙවණ
7	සිරිමුතු උයන	15	ලක්මුතු සෙවණ
8	සංහිඳ සෙවණ	16	ජයමහ සෙවණ

II මෙතෙක් ඉඩම් අයිතිය සම්පූර්ණයෙන් පැවරී නොමැති නිවාස සංකීර්ණවල සරාංශය

1	රන්මිතු සෙවණ
2	සත්හිරු සෙවණ
3	රන්දිය උයන
4	හෙළමුතු සෙවණ
5	ලක්සඳ සෙවණ
6	සියසෙත සෙවණ
7	සියපත් සෙවණ

(ආ) **නිරීක්ෂණය**

සමාලෝචිත වර්ෂයේ (2020) මාසික කුලී පදනම මත ලබාදී ඇති ව්‍යාපාරික ස්ථාන වලින් ලැබිය යුතු ශේෂයට සාපේක්ෂව 2023.10.31 දින වන විට අක්‍රීය කුලී හිමියන් ප්‍රමාණය 3370 ක් වී ඇති අතර, ඔවුන් වෙතින් අයවිය යුතු හිඟ මුදල රු.මිලියන 223.78 ක් විය.

සක්‍රීය කුලී හිමියන් ප්‍රමාණය 4667 ක් ලෙස වැඩිවී ඇති අතර, ඔවුන් වෙතින් අයවිය යුතු හිඟ මුදල ද රු.මිලියන 807.55 ක් දක්වා වැඩි වී ඇත.

තවද 2020.12.31 දිනට අක්‍රීය කුලී හිමියන් වෙතින් ලැබිය යුතු බව සඳහන් අයවිය යුතු හිඟ කුලී මුදල වන රු.මිලියන 255.79, 2023.10.31 දින වන විට 223.78 ක් දක්වා රු.මිලියන 32.1 න් අඩුවී ඇත.

තවද 2020 වසරට සාපේක්ෂව 2023 වර්ෂය වන විට ගණුදෙනුකරුවන් ප්‍රමාණයද වැඩිවීම මත සක්‍රීය ගණුදෙනුකරුවන්ගෙන් අයවිය යුතු ශේෂය වැඩිවීමක් දක්නට ඇත.

එබැවින්, අක්‍රීය ගණුදෙනුකරුවන් වෙතින් අයවිය යුතු ශේෂයන් අයකර ගැනීම සඳහා නෛතික කටයුතු සිදුකරමින් පවතින අතර, සක්‍රීය ගණුදෙනුකරුවන්ගේ ශේෂයන් අයකර ගැනීම සඳහා ද නිරන්තර සිහිකැඳවීම් යැවීම්, සහන ගෙවීම් සැලසුම් ලබාදීම්, ව්‍යාපාරික ස්ථාන මුද්‍රා තැබීම් හා නීති අංශය මඟින් ඔවුන්ට එරෙහිව නඩු ගොනු කිරීම් වැනි කටයුතු මඟින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවද දන්වා සිටිමි.

(ඇ) **නිරීක්ෂණය**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සංවර්ධන කාර්යයන් සඳහා බාහිර පාර්ශවයන් වෙත ඉඩම් බැහැර කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව 2018.03.19 වන දින ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් එම අමාත්‍යාංශයේ දී පැවති සාකච්ඡාවේ දී ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ බලය පැවරීමේ සහතික පත්‍රයකින් නාගරික සංවර්ධන අධිකාරිය සතුවී ඇති ඉඩම්, තෙවන පාර්ශවයක් වෙත බැහැර කිරීම

සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍ර ලබාගත යුතු බවට මෙම අධිකාරිය වෙත උපදෙස් ලබාදී ඇත. ඉන් අනතුරුව මෙම අධිකාරිය විසින් එකී ක්‍රමවේදය අනුගමනය කරමින් අවස්ථානුකූලව දීමනා පත්‍ර ලබා ගැනීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

ඒ අනුව, ඒ වන විටත් සංවර්ධන කාර්යයන් සඳහා තෙවන පාර්ශවයන් වෙත බැහැර කිරීමට හඳුනාගෙන තිබූ ඉඩම් සඳහා පමණක් පළමු අවස්ථාවේ දී 6 (1) වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍ර ඉල්ලුම් කිරීමට කටයුතු කරන ලද අතර, ඉන් අනතුරුව ඉඩම් බැහැර කිරීමේ ප්‍රමුඛතාවය මත වන්දි හා පොලී ගෙවා අවසන් කරන ලද ඉඩම් සඳහා 6 (1) වගන්තිය යටතේ දීමනා පත්‍ර ඉල්ලුම් කිරීමට කටයුතු කර ඇත.

ඒ අනුව, විෂයගත ඉඩම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ බලය පැවරීමේ සහතිකය 2008.04.23 දින නිකුත් කර තිබුණ ද, රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ දීමනා පත්‍ර ලබා ගැනීමේ කටයුතු 2018 මාර්තු මස අග භාගයේ දී පමණ ආරම්භ කර ඇති අතර, විෂයගත ඉඩම සඳහා වන්දි හා පොලී ගෙවා අවසන්ව ඇති බැවින්, 2023 වර්ෂය තුළදී ප්‍රදාන පත්‍රය ලබා ගැනීමේ කටයුතු අවසන් කළ හැකිය. ඒ සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍රය ලබා දීම සඳහා නිර්දේශ වාර්තා ඉතා ඉක්මනින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කරන මෙන් මෙම අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ) විසින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් වෙත 2023.01.04 දින ඉල්ලීමක් යොමු කර ඇත.

2012 වර්ෂයේ වත්කම් තක්සේරුව සිදුකරන අවස්ථාවේදී ඒ සඳහා මෙම ඉඩම අතපසු වීමකින් ඇතුළත් කිරීමට නොහැකි වී ඇති අතර, 2021 වසරේ දී කරනු ලබන සංශෝධිත වත්කම් තක්සේරුවේදී ද වගුරු බිමක් වශයෙන් සඳහන් කර, තක්සේරු කර නොමැත. එසේම, ඉඩම් අත්කර ගැනීමේ වියදම් වශයෙන් දරා ඇති දැනට 2012 වර්ෂයේ දී ලාභයට එරෙහිව කපා හැර ඇති වටිනාකම්, 2021 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශනවල ද වගුරු බිමක් වශයෙන් නිශ්චිත වටිනාකමක් ඇතුළත් නොකල ද, ඉඩම සංවර්ධනය කරනු ලබන අවස්ථාවක දී එකී වර්ෂයට අදාළව තක්සේරු වටිනාකම අනුව අවසන් ගිණුම් වල ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

අංක කොා. 6436 දරන මූලික පිඹුරෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්.2.611 ක් පමණ වන ඉඩම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ 1986.03.05 දින නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කර ගෙන ඇත. මෙම ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කර ගැනීමට කටයුතු කරන මෙන් පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් විසින් 1984.01.30 දිනැති ලිපියෙන් සහ 1984.02.09 දිනැති ලිපියෙන් සෘජු උපදෙස් ලබා දී ඇත. 1984.01.30 දිනැති ලිපියෙහි මෙම ඉඩම අත්කර ගැනීම ක්‍රියාත්මක වනතුරු කොළඹ මහ නගර සභාවට ඉඩමට කැළි කසල දැමීමට ඉඩ සලසා දිය යුතු බව එහි සඳහන් කර ඇත.

පසුව 1985.05.23 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් "නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන කටයුත්තක් සඳහා" මෙම ඉඩම අත්කර ගැනීමේ ඉල්ලුම් පත්‍ර පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තවද, නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇති 44 වන වගන්තිය යටතේ බලය පැවරීමේ සහතිකයේ අත්කර ගැනීමේ අරමුණ ද "නාගරික සංවර්ධන අධිකාරියේ අවශ්‍යතාවයන් සඳහා යොදවා ගත හැකිය" වශයෙන් සඳහන් කර ඇත.

මෙම ඉඩම භෞතිකව පරීක්ෂා කිරීමේ දී සම්පූර්ණයෙන්ම වගුරු සහිත ලඳුකැලෑ භූමියක් වශයෙන් පවතින බව නිරීක්ෂණය වේ.

කෙසේ වෙතත්, මෙම වගුරු සහිත ඉඩම සඳහා 6 (1) වගන්තිය යටතේ දීමනා පත්‍රය ලබා ගැනීමෙන් අනතුරුව, සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමටත් පාරිසරික නිරවුල් සහතිකයක් ඇතුළු අදාළ සියළුම අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කලාපීය සංවර්ධන සැලසුමට අනුකූලව අවසරලත් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීමට අපේක්ෂා කරනු ලැබේ.

(ඈ) **නිරීක්ෂණය**

අමප/10/1830/403/039 හා 2010.10.05 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොළඹ නගරයේ පැල්පත්වාසීන්ට ස්ථිර නිවාස 50,000 ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙල 2010 වර්ෂයේදී නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ආරම්භ කරන ලදී.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් 2023 වන විට නිවාස 14542 ක් ඉදිකර ඇති අතර, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 22 ක් මෙට්‍රෝ හෝම්ස් සහ ලේක්සයිඩ් නිවාස ව්‍යාපෘතිය ඇතුළුව නිවාස 12325 ක පදිංචිකර ඇත. විවිධ රජයේ ව්‍යාපෘති සඳහා නිවාස 1946 ක් වෙන් කර ඇති අතර දැනට නිවාස 271 ක් හිස් තත්ත්වයේ පවතී. එම නිවාස ලබා දීමේ කටයුතු අඛණ්ඩව සිදු කරමින් පවතී. තවද, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නව නිවාස ඒකක 951 ක කටයුතු නිමකොට ඇති අතර, මහභාණ්ඩාගාරයේ අරමුදල් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ව්‍යාපෘතිය ඉදිරියට ගෙන යාම සඳහා ස්වයං මූල්‍යනය යටතේ ඉන් නිවාස ඒකක 450 ක් විවෘත වෙළෙඳපොලේ අලෙවි කිරීමට කටයුතු ආරම්භ කර තිබෙන අතර, ඒ සඳහා කැබිනට් අනුමැතිය ලැබී ඇති අතරම මේ වන විට නිවාස ඒකක 06 ක් අලෙවි කොට තිබේ. එසේම නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහාය දැක්වීමේ ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 3602 ක් ඉදිකිරීමට කටයුතු සිදු කරමින් පවතී. තවද, චීන ආධාර යටතේ නිවාස ඒකක 1996 ක ප්‍රමාණයක් අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු නුදුරේම ආරම්භ කිරීමට නියමිතය.

මහල් නිවාසවල පදිංචිකරනු ලබන ජනතාව වෙත නිවසේ වර්ග අඩි ප්‍රමාණය අනුව නාමික අගයක් නියම කොට එය වාරිකවලින් වසර 30 ක් පුරාවට ගෙවීමෙන් අනතුරුව එහි අයිතිය ඔප්පුවක් මඟින් පැවරීම දැනට තිබෙන ක්‍රමවේදය වන අතර, එහිදී පදිංචිකරුවන් ගෙන් 50% ක් හෝ ඊට

වැඩි ප්‍රමාණයකට හිමිකාරිත්වය හිමිවීමෙන් පමණක් සභාධිපත්‍ය කළමනාකරණ සංස්ථා පිහිටුවිය හැකිය.

කෙසේ වෙතත්, කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නම් ප්‍රධාන වශයෙන් සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය ලබාගත යුතු අතර, ඒ සඳහා අවශ්‍යතාවයන් ගණනාවක් සම්පූර්ණ කළ යුතු අතර, නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ඉදිකර ජනතා අයිතියට පත්කර ඇති නිවාස ව්‍යාපෘති 22 අතරින් දෙමටගොඩ පිහිටි මිහිඳුසෙන්පුර ව්‍යාපෘතිය හා බොරැල්ල සිරිසර උයන නිවාස ව්‍යාපෘතිය සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය ලබාගෙන ඇත.

කෙසේවුවද, සභාධිපත්‍ය සහතිකය ලබා ගැනීමෙන්ම පමණක් කළමනාකරණ සංස්ථා පිහිටුවිය නොහැකි අතර, නිවාසවල හිමිකාරිත්වයද එයට සමගාමීව පදිංකරුවන්ට ලබාදීම කළ යුතු වේ. ඒ සඳහා 2024 අයවැය යෝජනා මඟින් වැඩ පිළිවෙලක් ඉදිරිපත් කොට තිබෙන අතර ඒ සඳහා වූ සැලසුම් සකස් කරමින් ඇත.

තවද, මෙම සියළු ව්‍යාපෘති සඳහා සභාධිපත්‍ය සහතිකය ලබාගැනීමෙන් පසු ප්‍රකාශන ඔප්පු සකස් කිරීම දක්වා වූ කාර්යය ඉලක්ක කොට නාගරික සංවර්ධන අධිකාරිය විසින් වැඩ පිළිවෙලක් සකස්කොට තිබේ.

එම ව්‍යාපෘතිවල විවිධ වියදම් සඳහා වන පිරිවැය පදිංචිකරුවන්ගෙන් මාසිකව අයකරනු ලබන මුදලින් ආවරණය කර ගැනීමට බලාපොරොත්තු වේ. මෙහිදී එවකට පැවති වාතාවරණය අනුව 2020 වර්ෂය තුළ රු. 102,352,692 ක් පමණක් අයකරගෙන තිබෙන අතර, ලැබිය යුතු මුළු ආදායම රු. 283,357,405 ක් වේ. කෙසේවුවද, 2021 වර්ෂයේ එම ආදායම මිලියන 177 ක් ද 2022 වර්ෂයේ එය රු. මිලියන 240 දක්වාද වර්ධනය කර ගෙන තිබෙන අතර, මේ වන විට හිඟ මුදල අයකර ගැනීම සඳහා විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කොට තිබේ.

2020 වර්ෂයේ නියමිත වේලාවට විදුලි බිල්පත් නොගෙවීම මත රු. 1,222,339.93 ක දඩ මුදලක් ගෙවා ඇත. එම මුදල ගෙවීමට සිදුව ඇත්තේ මාර්තු මස සිට රටේ පැවති ගෝලීය ප්‍රශ්නයක් වූ කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් බිල්පත් ගෙවීමේදී විශාල ගැටලු කිහිපයකට මුහුණ දීමට සිදුවීම නිසාය. එනම්,

- ලංකා විදුලිබල මණ්ඩලය විසින් නිසි වේලාවට මෙම අධිකාරිය වෙත බිල්පත් යොමු නොකිරීම හා මනු කියවීම සිදු නොකිරීම.
- රටේ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් හදිසියේම රට තුළ හදිසි ඇඳිරිනීතිය පැනවීමෙන් ආයතන වසා දැමීමට සිදුවිය. එමඟින් බිල්පත් ගෙවීම සිදු නොවිය.

- ටික කාලයකින් ආයතන නැවත රාජකාරී කටයුතු ආරම්භ කලද, නිලධාරී මණ්ඩලය සීමා කිරීමත්, බිල්පත් ගෙවීමේ කටයුතු අංශ කිහිපයක් මඟින් සිදුවීමත් නිසා ක්‍රමවත්ව නියමිත දිනට බිල්පත් ගෙවීමට නොහැකි විය.

- නිවැසියන් නිවසේ සිට වැඩ කිරීම හේතුවෙන් මාසික තොග බිල්පත් වැඩිවීම නිසා ඊට සාපේක්ෂව ප්‍රමාදය මත පනවන ගාස්තුව වැඩි අගයක් ගැනීම.

- දින 14 කින් ගෙවීම් කිරීම අනිවාර්ය වීම හේතුවෙන් ප්‍රමාදවී ලැබුණු බිල්පත් ගෙවීමේදී ලැබුණු කාලය මත එය පාලනය කළ නොහැකි තත්ත්වයට පත් විය.

- කෙසේ නමුත් මේ වන විට විද්‍යුත් මාර්ගගත ක්‍රමයට බිල්පත් ලැබෙන නිසා ප්‍රමාද ගාස්තුවකින් තොරව බිල්පත් ගෙවීමට මාස 07 ක කාලයක සිට හැකියාව ලැබී ඇත. ඒ තුළින් අධිකාරියට අමතර ප්‍රතිලාභයක් (Discount) ලැබී ඇත. ඒ අනුව, වර්තමානයේ දී මේ සම්බන්ධයෙන් කිසිදු දඩ මුදලක් ගෙවා නොමැත.

(ඉ) **<u>නිරීක්ෂණය</u>**

මහර පරිපාලන හා වාණිජ සංකීර්ණයේ 3 වන මහලේ කාර්යාලීය ඉඩකඩ ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලබාදීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති අතර, ලංකා විදුලිබල මණ්ඩලයේ එකඟතාවය ලැබීමෙන් පසු කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගැනීමට කටයුතු කිරීම හා එකී ගොඩනැගිල්ලේ අනෙකුත් මහල් හා ඒකක ටෙන්ඩර් කර බැහැර කිරීමට (ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගැනීම) අවශ්‍ය මූලික කටයුතු කරමින් පවතී.

(ඊ) **<u>නිරීක්ෂණය</u>**

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පරිපාලන අගනගරය ලෙස සංවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව එකී ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය සතු ඌන උපයෝජිත ඉඩම් ප්‍රශස්ත ලෙස යොදා ගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර පොදු මහජනතාව වෙත සේවා සපයනු ලබන මූල්‍ය හා පරිපාලන ආයතන සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් වශයෙන් 2013 වර්ෂයේ දී අවභාවිතයේ දී පැවති රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක 294, 300 සහ 953/1 දරන ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත.

ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 (අ) අතුරු විධානය යටතේ 2013.10.09 දින පහත සඳහන් ඉඩම් කොටස් 03 නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කරගෙන ඇත.

අනු අංකය	වරිපනම් අංකය	ඉඩම් ප්‍රමාණය			මුල් හිමිකරු
		අක්කර	රූඩ්	පර්චස්	
1	294	0	1	2	ජී.ඩී.කුලරත්න මහතා
2	300	2	1	29	ඉලෙක්ට්‍රෝ ප්ලාස්ටික් සමූහ ව්‍යාපාරය
3	953/1	0	1	12	සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම

ඉහත ආකාරයෙන් අත්කර ගන්නා ලද ඉඩමෙන් අනු අංක 02 යටතේ දක්වා ඇති විශාලම ඉඩම් කොටස අවසතු කරන මෙන් 2015 වර්ෂයේ දී ඉඩමේ මුල් හිමිකරුවන් විසින් එවකට නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යතුමා වෙත කරන ලද ඉල්ලීමක් පරිදි අමාත්‍යතුමාගේ උපදෙස් අනුව කළමනාකරණ මණ්ඩල තීරණයකින් අනතුරුව 2015.07.02 දින මුල් හිමිකරුවන් වෙත අවසතු කර ඇත.

ඉන් අනතුරුව එයට යාබදව පිහිටි වරිපනම් අංක 953/1 දරන සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම හිමිකම් දක්වන ලද ඉඩම ද එම ආයතනය විසින් කරන ලද ඉල්ලීමක් සලකා බලා කළමනාකරණ මණ්ඩල තීරණයකින් අනතුරුව අවසතු කර ඇත.

ඒ අනුව, අත්කර ගන්නා ලද ඉඩම් කොටස් 03 න් 02 ක් අවසතු කිරීමෙන් අනතුරුව වරිපනම් අංක 294 දරන ඉතිරි ඉඩම් කොටස අවසතු කිරීමට මුල් හිමිකරුගෙන් ඉල්ලීමක් ඉදිරිපත් නොවූ බැවින්, ඉඩම භාර ගැනීමට මුල් හිමිකරු එකඟ නොවන්නේ නම් අත්කර ගැනීමේ කටයුතු ඉදිරියට ක්‍රියාත්මක කරන මෙන් ඉඩම් අමාත්‍යාංශයෙන් දැනුම් දී ඇත.

අත්කර ගනු ලබන ඉඩම් කොටසක් සඳහා නියමිත වන්දි හා පොලී මුදල් ගෙවීමට නාගරික සංවර්ධන අධිකාරිය නෛතිකව බැඳී සිටින බැවින්, රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම්ගේ දැනුම් දීම පරිදි ඉඩම සඳහා වන්දි හා පොලී වශයෙන් රු.මි.213 ක් පමණ මෙම අධිකාරිය විසින් ගෙවා නිම කර ඇත. මෙම වන්දි හා පොලී මුදල් වාරික වශයෙන් ගෙවන ලද අතර, අවසන් පොලී වාරිකය ගෙවන ලද්දේ 2021.12.31 දිනය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ඉඩම සඳහා 44 වන වගන්තිය යටතේ බලය පැවරීමේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන්නේ සියලුම වන්දි හා පොලී ගෙවීමෙන් අනතුරුවය. ඒ අනුව ඉඩම සඳහා බලය පැවරීමේ සහතිකය 2022.05.23 දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් විසින් මෙම අධිකාරිය වෙත ලබා දී ඇත.

රජයේ ඉඩම් ආඥා පනතේ 6 (1) වගන්තිය යටතේ විශේෂ දීමනා පත්‍රය මෙම ඉඩම සඳහා ලබා දෙන මෙන් 2022.09.16 දින ඉල්ලුම් කර ඇති අතර, ඒ සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් විසින් අවශ්‍ය කටයුතු කරමින් පවතී. එය ලබා ගැනීමෙන් අනතුරුව සුදුසු සංවර්ධන

කාර්යයක් සඳහා තෙවන පාර්ශවයක් වෙත ඉඩම බැහැර කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ.

(ඇ) **<u>නිරීක්ෂණය</u>**

කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියේ අදියර 1 සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සහ සංවර්ධනකරු වන සී/ස ටාටා නිවාස සංවර්ධන සමාගම අතර සංවර්ධන ගිවිසුමක් 2013 ඔක්තෝබර් මස 30 වන දින ඇති කරගෙන ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා සැලසුම් කරන ලද කාල සීමාව මාස 36 කි.

1. එම ගිවිසුම් ප්‍රකාරව වගන්ති අංක 2.12 (ඇමණුම 15) යටතේ සංවර්ධනකරු විසින් ඉදිකිරීම් පිරිවැය දරා එයට අමතරව කුලී ගෙවීම්, ගොඩනැඟිලි ඉවත් කිරීම් ඇතුළු අනෙකුත් වියදම් සඳහා රු. මිලියන තුන්සිය අනු තුනක පිරිවැයක් දැරිය යුතුය. (ඇමරිකානු ඩොලර් මිලියන 3 ක් උපරිම සීමාව දක්වා)

2. එම මුදල පරිශීෂ්ඨ සංවර්ධන ගිවිසුමේ වගන්ති අංක E අනුව ඉහත සඳහන් කරන ලද පිරිවැය මේ වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය වෙත සංවර්ධනකරු ලබා දී ඇත.

3. එමෙන්ම ඊට පසුව ඇතිවන සම්පූර්ණ කුලී ගෙවීම ඇතුළු ගිවිසුමේ සඳහන්ව ඇති අනිකුත් වියදම් ගිවිසුම් කාලය සඳහා මෙම අධිකාරිය මඟින් දැරීම සඳහා දෙපාර්ශවය ගිවිසුම් ප්‍රකාරව එකඟතාවයට පත්ව ඇත.

ඒ අනුව, මෙම සංවර්ධන ගිවිසුම සඳහා වූ පරිශීෂ්ඨ ගිවිසුමේ F වගන්තිය අනුව මෙම ව්‍යාපෘතිය සඳහා තව දුරටත් සිදු කළ යුතු කුලී ගෙවීම් සඳහා නැවත පදිංචි කිරීමේ ගොඩනැඟිල්ල මත අමතර නිවාස 62 ක් ඉදිකර, එම ඉදිකරන ලද නිවාස ඒකක වෙළෙඳපොළ මිල මත විකුණුම් කර, ඒ තුළින් උපයන ලාභයෙන් තවදුරටත් සිදු කළ යුතු කුලී ගෙවීම් ආවරණය කිරීමට යෝජනා කරන ලදී.

පරිශීෂ්ඨ සංවර්ධන ගිවිසුමේ අනු වගන්ති 06 - e ප්‍රකාරව විකිණීමේ පදනම මත ඉදිකරන ලද නිවාස ඒකක 62 සඳහා රජයේ අනුමත බදු හැර රු. 471,739,202/- ක පිරිවැයක් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අදාළ සංවර්ධන ආයතනය වෙත ගෙවීම් සිදු කළ යුතු වේ. එමෙන්ම එම අමතර නිවාස ඒකක ඉදිකිරීම සඳහා දින 150 ක කාලයක් ලබා දී ඇත.

නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය සඳහා සංවර්ධනකරුගේ ඉල්ලීම් සහ කරුණු දැක්වීම මත ව්‍යාපෘතිය සඳහා කාලය දීර්ඝ කිරීම 2019 අප්‍රේල් මස 30 දක්වා මෙම අධිකාරිය මඟින් (ඇමුණුම 16) ලබා දී ඇත. එසේම නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය තුළ කාලය දීර්ඝ කිරීම (EOT) සහ අමතර දින 150 ක් කාලය ඇතුළුව සම්පූර්ණ කාලය ව්‍යාපෘති ගිවිසුම් කාලය ලෙස පරිශීෂ්ඨ සංවර්ධන ගිවිසුමේ 06 (b) මඟින් දක්වා ඇත. එම කාලය 2019 අප්‍රේල් 30 දක්වා වේ. කෙසේ වෙතත්, අදාළ ව්‍යාපෘති ඉදිකිරීම මෙම අධිකාරිය වෙත ලබා දීම 2019 අගෝස්තු මස තුළ සිදු කර ඇත.

එමෙන්ම එම කාලයට පසුව තවදුරටත් ඉදිකිරීම් සිදුවේ නම් තාවකාලික කුලී ගෙවීම් හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා වූ ගෙවීම් මෙම අධිකාරියේ සහ සංවර්ධනකරුගේ අන්නෝන්‍ය එකඟතාවය මත එම ප්‍රමාද වීම් කාලය සඳහා සංවර්ධනකරු ගෙවීම් කළ යුතු වේ. (පරිශිෂ්ඨ ගිවිසුමේ වගන්ති 6 (6).

කෙසේ වෙතත්, ව්‍යාපෘතිය තුළින් අමතරව ඉදිකරන ලද නිවාස ඒකක 62 ක අතුරින් නිවාස ඒකක 58 ක් විකිණීමෙන් රුපියල් 612,800,000.00 ක ආදායමක් මෙම අධිකාරිය වාර්තා කර ඇත. ඒ අනුව මෙම අමතර නිවාස ඒකක විකිණීම තුළින් රුපියල් මිලියන 141 කට ආසන්න ලාභයක් මෙම අධිකාරිය වාර්තා කර ඇත. ඒ අනුව අදාළ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සඳහා ගෙවීම් සහ තාවකාලික පදිංචිය සඳහා ගෙවීම් කරන ලද කුලී මුදල් සම්පූර්ණ ලෙස අදාළ අමතර නිවාස ඒකක විකිණීම මත ආවරණය කරගෙන ඇත.

(ඌ) **<u>නිරීක්ෂණය</u>**

එකී ඉඩමෙහි සිදුව ඇතැයි කියනු ලබන රු.18,900,000.00 ක අලාභය ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත.

I. 2021.01.29 දිනැති ලිපිය මඟින් අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂණ ආරම්භ කරන ලෙස දැනුම් දීම.

II. 2022.07.13 අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත සිහිකැඳවීමක් කිරීම.

III. 2022.01.20 දින අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව වෙත ගොස් ප්‍රකාශ ලබාදීම.

IV. පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව මඟින් දෙන ලද උපදෙස් පරිදි පත්කරන ලද කමිටුවෙහි විමර්ෂණ කටයුතු සඳහා ලිපි ගොනු ලබාදීම.

V. 2022.07.20 දිනැති ලිපි මඟින් අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව හා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කිරීම.

එම අදාළ විමර්ෂණ කටයුතු අවසන් වූ විට එමඟින් දෙනු ලබන නිරීක්ෂණ අනුව කටයුතු කරනු ලබන බව දන්වමි.

2.3 වෙනත් කරුණු

(අ) **<u>නිරීක්ෂණය</u>**

2020.10.21 දින සිට ඕවල් වීව් නිවාස ව්‍යාපෘතියේ නිවාසවල භුක්තිය භාර දීම සිදු කර ඇත. එම නිවාස ව්‍යාපෘතියේ නිවාසවල නීත්‍යානුකූල අයිතිය පැවරීම 2023 වර්ෂයේ ජනවාරි මස සිට ආරම්භ කළ අතර, එය ප්‍රමාද වූයේ ලිපි ලේඛන ලබා ගැනීමට ප්‍රමාද වීම මත හා එම කාලසීමාව තුළ Covid-19 වසංගත තත්ත්වය පැවතීම හේතුකොටගෙන ආයතනවල කාර්යයන් ඉටු කිරීමට ප්‍රමාද වීම නිසාවෙනි. එසේම, ව්‍යාපෘති භූමියේ එක් කුඩා ඉඩම් කොටසක් මෙම අධිකාරියට පවරා ගැනීමට මුල් අවස්ථාවේ හඳුනාගෙන නොතිබූ බැවින්,

- එම ඉඩම් කොටස පවරා ගැනීමෙන් පසු සභාධිපත්‍ය අධිකාරියේ අනුමැතියට යොමු කිරීම සිදු වීම ප්‍රමාදයට හේතුවක් වී තිබිණි.
- සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සභතිකය 2021.11.25 දිනැතිව ලැබී ඇත.

ඉහත සඳහන් හේතු මත පැවරුම්කර සකස් කිරීම ප්‍රමාද වීම නිසා නිවාසවල නීත්‍යානුකූල අයිතිය පැවරීම 2023 වර්ෂයේ ජනවාරි මස වන තෙක් ප්‍රමාද විය.

ඒ අනුව, 2023 වර්ෂයේ නොවැම්බර් මස වන විට මෙම ව්‍යාපෘතියේ පැවරුම්කර 264 ක් පමණ අත්සන් කර ඇති අතර, ඉතිරි නිවාසලාභීන් දේපලේ වර්තමාන වෙළෙඳපොළ වටිනාකම මත මුද්දර ගාස්තුව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවීම පිළිබඳ ගැටලුව මත පැවරුම්කර අත්සන් කිරීමේ ප්‍රමාදයක් ඇති වී තිබේ.

(ආ) **<u>නිරීක්ෂණය</u>**

කොළඹ මහ නගර සභාවේ බදුකරුවන් ලෙස ලියාපදිංචි සියළුම මැනිං වෙළෙඳුන්ට පැලියගොඩ නව මැනිං වෙළෙඳ සංකීර්ණය තුළින් ඔවුන්ගේ වෙළෙඳාම් කටයුතුවල ස්වභාවය අනුව සුදුසු ස්ථානවලින් විකල්ප වෙළෙඳ කුටි ලබාදීමේ කටයුතු මේ වන විට අවසන් කර ඇත.

ඒ අනුව, මෙම විගණන ඡේදයේ 2022.11.30 දිනට විකල්ප වෙළෙඳ කුටි ලබාදී නොමැති බවට වාර්තා වී ඇතැයි සඳහන් මැනිං වෙළෙඳුන් 167 දෙනා වෙත ද මේ වන විට විකල්ප වෙළෙඳ කුටි ලබාදී ඇත.

මේ අතර, මැනිං වෙළෙඳ සංකීර්ණය තුළින් වෙළෙඳ කුටි / කඩ කාමර අයඳුම් කරමින් ඉදිරිපත් වී ඇති අභියාචනා, අභියාචනා සළකා බැලීමේ කමිටුවක් මඟින් පරීක්ෂා කර බලා, එම කමිටුව ලබාදුන් නිර්දේශයන් අනුව වෙළෙඳ කුටි / කඩ කාමර අනුයුක්ත කිරීම සඳහා 2023.06.08 දින පැවති කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු සුදුසුකම් ලැබූ අයඳුම්කරුවන් වෙත වෙළෙඳ කුටි / කඩ කාමර අනුයුක්ත කිරීමට මේ වන විට අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) **<u>නිරීක්ෂණය</u>**

කොටස් ආයෝජනයන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම එම අදාළ සමාගම් විසින් වර්ෂයේ ලාභ ඉපයීම හා අනෙකුත් කාරණා පදනම් කර තීරණය කරනු ලබන බව දැක්වීමට කැමැත්තෙමු. මෙම පරිපාලිත සමාගම් වල කළමනාකරණ මණ්ඩල නියෝජනය කරනු ලබන අධිකාරියේ නිලධාරීන්ද එකී සමාගමේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් කිහිපයකදීම මේ සම්බන්ධයෙන් කරුණු විමසීම් සිදුකර ඇත. කෙසේවෙතත්, ලාභාංශ නොලබන ආයතන සම්බන්ධයෙන් අධිකාරියේ කළමනාකරණය විසින් ඉදිරියේ දී සළකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

(ඇ) **නිරීක්ෂණය**

ඔටර්ස් ඇක්වටික් සමාජ ශාලාව සහ 80 සමාජ ශාලාව, අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මහජනතාව වෙත විවෘත කරන ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් 2022.09.08 දින පැවති රැස්වීමේදී තීරණය කරන ලදී.

ඒ අනුව 80 සමාජ ශාලාව 2023.06.23 දින සිට මහජනතාව වෙත විවෘත කර මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු පවත්වා ගෙන යාම සඳහා පියවර ගෙන ඇති අතර, එකී මහජනතාවට විවෘත කිරීමට විරුද්ධව 80 සමාජ ශාලාවේ සභාපතිවරයා හා ලේකම් විසින් නාගරික සංවර්ධන අධිකාරිය හා වෝටර්ස් ඒජ් රික්‍රියේෂන් ආයතනයට විරුද්ධව කොළඹ දිසා අධිකරණ නඩු අංක DSP/259/ 2023 ප්‍රකාරව නඩුවක් ගොනු කර ඇත. ඒ අනුව කොළඹ දිසා අධිකරණය විසින් එකී සමාජ ශාලාව මහජනතාවට විරුද්ධව අතුරු තහනම් නියෝගයක් නිකුත් කර ඇත.

කෙසේ වෙතත් එම නඩුව මඟින් ආයෝජන යෝජනා කැඳවීම සම්බන්ධයෙන් විරෝධතාවයක් පල කර නොමැති බැවින්, මෙම සමාජ ශාලාව පිහිටි දේපල බුටික් හෝටල් ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කර පවත්වා ගෙන යාම සඳහා අවුරුදු 50 ක බදු පදනමක් මත ආයෝජකයෙකු වෙත බැහැර කිරීම සඳහා 2023.09.14 වන දින සිට 2023.11.02 දින දක්වා ආයෝජන යෝජනා කැඳවීමේ ලේඛන මෙම අධිකාරිය විසින් නිකුත් කරන ලද අතර, ලංසු කැඳවීම 2023.11.21 දින අවසන් විය. ආයෝජන යෝජනා කැඳවීමේ ලේඛන පාර්ශව දෙකක් විසින් ලබා ගත් අතර, කිසිදු පාර්ශවයක් මේ සඳහා ලංසු ඉදිරිපත් කර නොමැත.

ඔටර්ස් සමාජ ශාලාව පිහිටි ඉඩමෙන් කොටසක් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2021.06.20 දින පල කරන ලද පුවත්පත් දැන්වීම් මඟින් ටෙන්ඩර් කැඳවුව ද, එය සාර්ථක නොවීය. එබැවින්, නැවත සම්පූර්ණ ඉඩම සඳහා අදියර 2 ක් යටතේ ආයෝජන යෝජනා කැඳවීමට මෙම අධිකාරිය විසින් තීරණය කර ඇත. ඒ අනුව, සම්පූර්ණ ඉඩමෙන් හෙක්. 0.4 ක භූමි ප්‍රමාණයක් සඳහා ආයෝජන යෝජනා කැඳවීම පළමුවන අදියර යටතේ සිදු කරමින් පවතින අතර, ඒ සඳහා රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වටිනාකම් කැඳවා ඇත.

උක්ත පරිශ්‍රය නවීකරණ කටයුතුවලදී අවශ්‍ය ගොඩනැඟිලි ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සඳහා, වෙනත් උපදේශන ආයතන සඳහා, අපර ව්‍යුහ සංවර්ධන කටයුතු හා ඒ හා සම්බන්ධ ආයතන වෙත ගෙවීම් කටයුතු කිරීම, භූදර්ශන හා සැලසුම්, වැසි ජල අපවහනය ක්‍රමවත් කිරීමේ කටයුතු, අවශ්‍ය වෙනත් ප්‍රසම්පාදන කටයුතු ආදිය සඳහා රු.මි.453.88 ක් වැය කරන ලදී.

(ඉ) **නිරීක්ෂණය**

විසල් හම්බන්තොට නගර සංවර්ධන සැලැස්ම යටතේ ඉදි කරන ලද මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි ඉදිකිරීම් කටයුතු, දකුණු කොරියානු රජයේ ප්‍රදානයක් ලෙස ඉදි වූ ප්‍රධාන ශ්‍රවනාගාරය මිලියන 6.4 USS වියදම්න්ද, ව්‍යාපෘතියේ අනෙකුත් කොටස් ඉදිකිරීම් වෙනුවෙන් රු.3,830,874/- ක් ශ්‍රී ලංකා රජයේ වියදම්න්ද අවසන් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය මෙම ව්‍යාපෘතියේ උපදේශන සේවාවන් සපයන ලද අතර, හම්බන්තොට ප්‍රමුඛතා ව්‍යාපෘතිය මඟින් ව්‍යාපෘති කළමනාකරණය සිදුකරන ලදී.

ව්‍යාපෘතියෙහි කටයුතු සම්පූර්ණයෙන්ම නිමවීමෙන් පසු 2015.12.31 දින ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් වෙතින් නාගරික සංවර්ධන අධිකාරිය එම මධ්‍යස්ථානය භාර ගන්නා ලදී. ව්‍යාපෘතියෙහි කටයුතු නිම කිරීමෙන් පසුව අදාළ ආයතනයන් වෙත පවරාදීමට යෝජිතව තිබූ අතර, එවැනි ආයතනයන් මඟින් මෙම මධ්‍යස්ථානය භාර නොගැනීම හේතුවෙන් අදාළ පවරා දීම් සිදුකරන තෙක් කළමනාකරණ කටයුතු පවත්වාගෙන යාමට නාගරික සංවර්ධන අධිකාරියට සිදුව ඇත. තවද, මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා 2017-2019 වර්ෂ දක්වා රු.75,889,769.97 ක් වැය කරන ලද අතර, එම කාලය සඳහා ආදායම ලෙස රු.20,280,093.14 ක් උපයා ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා විදේශ ණය ලබාගෙන නොමැති අතර, ඉහත සඳහන් ප්‍රදානය පමණක් ලබා දී ඇත.

විසල් හම්බන්තොට නගර සංවර්ධන සැලැස්ම යටතේ යෝජිත සහ ක්‍රියාත්මක කරන ලද වරාය, ගුවන්තොටුපොල ඇතුළු අනෙකුත් ප්‍රධාන ව්‍යාපෘති බලාපොරොත්තු වූ ආකාරයට ක්‍රියාත්මක නොවීම සහ හම්බන්තොට නගර සංවර්ධනය පිළිබඳ විවිධ රජයන් දැක්වූ ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට සෘජුවම බලපා ඇත. රජයේ සහ පෞද්ගලික ආයතන විසින් මෙම මධ්‍යස්ථානයෙහි සංවිධානය කරනු ලබන විවිධ උත්සව, ප්‍රදර්ශන, රැස්වීම් සහ සංදර්ශන වලින් උපයනු ලබන ආදායම වාර්ෂික පිරිවැය හා සැසඳීමේදී සැලකිය යුතු පරතරයක් පෙන්නුම් කරනු ලබයි.

මීට අමතරව, 2020 වර්ෂයේ බලපෑ කොරෝනා වසංගත තත්ත්වය සහ ආර්ථික අර්බුදය හමුවේ, උත්සව සීමාවීම හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් ගැටලු සහගත වී ඇත.

ඉදිරියේදී මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම නාගරික සංවර්ධන අධිකාරිය සහ පුද්ගලික අංශය ඒකාබද්ධව (PPP) සිදු කිරීමට බලාපොරොත්තු වන අතර, පවතින ආර්ථික වතාවරණය අනුව අදාළ අනුමැතීන්ට යටත්ව පුද්ගලික අංශය සමඟ කෙටිකාලීන කළමනාකරණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම තුළින් ආදායම වැඩිකර ගැනීමට බලාපොරොත්තු වේ. ආදායම් ඉපැයීම කෙරෙහි කොතෙක් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවද, අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු හා නොවැළැක්විය හැකි සේවා කිරීම් හේතුවෙන් දැරිය යුතු පිරිවැය එලෙසම පැවති පසුබිමක ආදායම් ඉක්මවා වියදම් දැරීමට සිදුවී ඇත.

(ඊ) **<u>නිරීක්ෂණය</u>**

අධිකාරිය විසින් බාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණු රථගාල් 07 කින් 2023.10.31 දිනට ලැබීමට ඇති හිඟ මුදල් සම්බන්ධ වාර්තාවක් පහත දැක්වේ.

ගණුදෙනුකරු අංක 96596 හා 75777 යටතේ දැක්වෙන ගණුදෙනුකරුවන් පරිගණක පද්ධතියේ දැනටමත් අක්‍රීය කර ඇති අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම සඳහා නීති අංශය වෙත යොමුකර ඇත.

Project code	Cust. code	Project name	Balance as at 01/02/2023	Amount paid	Balance as at 31/10/2023	Remarks
8110500	96596	Charmers Granaries-New Karuna House	11,031,762.45		**24,898,019.68**	Terminated on 15.06.2023. Court case pending.
	100381	Rishi			**1,584,962.70**	
5120100	75777	M/s. New Karuna House	198,375.90		1,291,973.90	Terminated on 31.07.2023. Court case pending.
	100319	Senilka Management Service			(222,061.30)	
8210900	59487	(Oasis Colors)	568,250.00	186,037.50	382,212.50	Terminated.
	100381	Jaykay Marketing Services	-	-	44,006.66	
8091800	75907	National Water Supply	626,400.00	375,840.00	**250,560.00**	
8101200	75909	AJITH SRI PERERA ED	0.00	0.00	0.00	
5950100	58098	GUNARATNE H.A.D.H.MR.	337,534.38	337,534.38	0.00	
8211600	97709	E. WEERASINGHE	421,173.50	-	421,173.50	
			13,183,496.23		**28,650,847.64**	

(ඇ) **නිරීක්ෂණය**

මෙම අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරන පන්නිපිටිය, වීර මාවත නිවාස ව්‍යාපෘතිය ඒකක 500 කින් හා A, B, C, D හා E ලෙස කුළුණු 05 කින් සමන්විත වේ. A, B, C හා D නිවාස කුළුණක ඒකක 101 බැගින් ද E කුළුණේ නිවාස ඒකක 96 ක් ද ලෙස ව්‍යාපෘතිය ක්‍රියාත්මක අතර නිවාස කුළුණු අංක B හා D ඉදිකිරීම් මේ වනවිට සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර, C කුළුණේ ඉදිකිරීම් නිමකොට ගණුදෙනුකරුවන් වෙත භාර දෙමින් ඇත. A හා E කුළුණු මෙම වසර නිම වීමට පෙර සම්පූර්ණ කර නිවාසලාභීන්ට ලබාදීමට අපේක්ෂිතය. B

කුළුණේ නිවාස 101 සඳහා රජයේ කැබිනට් මණ්ඩල තීරණයක් අනුව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත නිවාස ලබාදීම සිදුකර ඇති අතරම D කුළුණෙහි නිවාස 101 අතරින් මුදල් ගෙවා ඇති නිවාස ඒකක 95 ක නිවැසියන් පදිංචි කරවීම අවසන් වෙමින් පවතී. E කුළුණේ නිවාස 96 අතරින් ඒකක 47 ප්‍රමාණයක් මේ වනවිට ගණුදෙනුකරුවන් වෙන් කරවා ගෙන ඇත. එමෙන්ම නාවික හමුදාව වෙත වෙන්කර ඇති නිවාස සඳහා මෙම අධිකාරියට අයවිය යුතු සම්පූර්ණ මුදල් මෙතෙක් ලබාගෙන නොමැත. එමෙන්ම ව්‍යාපෘතිය ආරම්භයේදී සම්පූර්ණ ව්‍යාපෘතිය 2022 සැප්තැම්බර් මස වනවිට අවසන් කිරීමට අපේක්ෂා කරන ලද නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හා රට තුළ ඉන් පසුව උද්ගත වූ ආර්ථික අර්බුදකාරී තත්ත්වය මත ඉදිකිරීම් කර්මාන්තයේ සිදුවුණු බිඳ වැටීම හේතුවෙන් එය සම්පූර්ණ කිරීමට අපහසු විය. එමෙන්ම ආනයනික භාණ්ඩ සඳහා රට තුළ පනවන ලද සීමා හේතුවෙන් හා ඉදිකිරීම් කර්මාන්තය තුළ භාණ්ඩවල පිරිවැය ඉහළ යාම මත නිවාස ඉදිකිරීම් සිදුකරන ආයතනය ප්‍රායෝගිකව ගැටලු සඳහා මුහුණ දීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය සැලසුම් කරන ලද දින වනවිට නිම කිරීමට නොහැකිවී ඇත.

(ඌ) **<u>නිරීක්ෂණය</u>**

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා නිල නිවාස ලබාදීම පිළිබඳ 2021 මැයි මස 20 වන දින ගරු කථානායකතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ගෘහකාරක සභා රැස්වීමේදී ගත් තීරණය ඉදිරියට ක්‍රියාත්මක කිරීම තුළින් B කුළුණෙහි නිවාස 101 ක් අංක 22/0856/520/003-1 දරන කැබිනට් අනුමැතිය යටතේ කුලී පදනම මත ලබාදීම සිදුකර ඇත. එහිදී එම නිවාසවලට අදාළ වාර්ෂික කුලී තක්සේරු වටිනාකම නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු වාර්තාව මඟින් රුපියල් මිලියන 72 ක් ලෙස දක්වා ඇත. එම අභ්‍යන්තර තක්සේරු වාර්තාව ලබාගෙන ඇත්තේ රජයේ තක්සේරු වාර්තාව අයදුම්කර ලැබෙන තුරුය. එමෙන්ම 2022.09.22 හා 15/2022 දරන කළමනාකරණ මණ්ඩල පත්‍රිකාව මඟින් මේ බව දැනටමත් අධ්‍යක්ෂක මණ්ඩලය දැනුවත් කර ඇත. ඒ අනුව, CD/WC(I)/RE/3290 හා 2022 නොවැම්බර් මස දින රහිතව ප්‍රධාන තක්සේරුකරු මඟින් ලැබී ඇති රජයේ තක්සේරු කුලී වටිනාකම (වාර්ෂික) රුපියල් මිලියන 69.45 ලෙස දක්වා ඇත. ඒ අනුව, ඉහත කැබිනට් තීරණය පරිදි මෙම නිවාස ව්‍යාපෘතියේ B කුළුණේ පිහිටි නිවාස 101 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට රජයෙන් මාසික කුලී මුදල මෙම අධිකාරියට ලබාගැනීමේ පදනම මත ලබා දීමට කටයුතු කර ඇත. නමුත් නියමිත පරිදි මුදල් මෙම අධිකාරිය වෙත නොලැබීම නිසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කිහිපවරක් මහාභාණ්ඩාගාරයෙන් මුදල් ලබාදෙන ලෙස සිහිකැඳවීම් සිදුකර ඇතත් මේ වනතෙක් ධනාත්මක ප්‍රතිචාරයක් නොමැත. මේ පිළිබඳව අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා මේ වනවිට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇත. මෙම B ගොඩනැඟිල්ල කළමනාකරණය කිරීම සඳහා මාසිකව නිවාස ලාභීන්ගෙන් අයවිය යුතු මුදලින් 2023 ඔක්තෝම්බර් වන විට රු.1,766,685.90 ක් ලැබී ඇත. ජල සැපයුම් සඳහා රු.682,274.61 ක්, විදුලි ගාස්තුව සඳහා රු.1,643,675.81 ක් හා ගෑස් සඳහා රු.138,395.71 ක හිඟ මුදලක් වාර්තා වී ඇත. තවද, කළමනාකරණ කටයුතු වෙනුවෙන් මේ දක්වා කරන ලද සත්‍ය වියදම්

ඇගයුම් කොට කරන ලද ගණනය කිරීම අනුව රු.5,806,067.06 ක හිඟයක් පවතින අතර, එම මුදල ගෙවීම පිළිබඳව කළමනාකරණ කමිටුව වෙත දන්වන ලෙස රැස්වීමකදී ගරු අමාත්‍යතුමා උපදෙස් දුන් අතර, එය ගෙවීම සඳහා කමිටුව එකඟ විය.

(එ) **<u>නිරීක්ෂණය</u>**

මෙම අඩු ආදායම්ලාභී නිවාස ඒකක තුළින් හිඟ බදු කුලී සහ ජල බිල්පත් අයකර ගැනීම සඳහා මෙම අධිකාරියේ වත්කම් කළමනාකරණ අංශය මඟින් විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වෙමින් පවතී.

(ඒ) **<u>නිරීක්ෂණය</u>**

ගාල්ල දඩල්ල ක්‍රීඩා සංකීර්ණය ඉදිකර ඇති ඉඩම් කොටස මහාභාණ්ඩාගාර ප්‍රතිපාදන මත අත්කර ගැනීම සිදුකර ඇති අතර, ඉඩමෙන් කොටසක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කර ඇත. එම ඉඩමේ දැනට භාවිතයට නොගෙන පවතින ඉතිරි ඉඩම් කොටසද නාගරික සංවර්ධන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය මඟින් පිළියෙල කොට ඇති සවිස්තරාත්මක සැලැස්මට අනුව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කිරීම සුදුසු බවට නාගරික සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලය විසින් 2023.01.16 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

එබැවින්, මුළු විෂයගත ඉඩමම අත්කර ගැනීමට අදාළ වන්දි ගෙවීම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත සිදු කරනු ලබන බැවින්ද, සංවර්ධනය කර ඇති ඉඩම් කොටසට අමතරව ඉතිරි ඉඩම් කොටසද සංවර්ධනය කිරීම ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදුකළ යුතු බවට නාගරික සංවර්ධන අධිකාරියේ දකුණු පළාත් කාර්යාලය නිර්දේශ ලබා දී ඇති බැවින්, ගාල්ල, දඩල්ල පිහිටි අක්.16 රූඩ්.3 පර්.0.57 ක් වූ සම්පූර්ණ ඉඩම අත්කර ගැනීමේ කටයුතු ප්‍රාදේශීය ලේකම් මඟින් සිදුකර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීමේ කටයුතු සිදු කිරීමට හැකිවන පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන, රේඛීය අමාත්‍යාංශය හරහා ඉඩම් අමාත්‍යාංශය වෙත දන්වා යැවීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

(ඔ) **<u>නිරීක්ෂණය</u>**

මේ සම්බන්ධව අභ්‍යන්තර ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් එනම්, අධ්‍යක්ෂ (නීති), අධ්‍යක්ෂ (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ), අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ හා අයකර ගැනීම්) මූලික පරීක්ෂණයක් පැවැත්වූ අතර එහි නිර්දේශ 2022.11.07 දින පැවති කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2022.11.17 පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී සාමාජිකයින් 05 දෙනෙකු ඇතුළත් කමිටුවක් පත්කර ඇති අතර, එම කමිටු නිර්දේශයන් මත ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතව ඇත.

(ඕ) **නිරීක්ෂණය**

2018 - 2019 දක්වා යෝජිත අදියර 05 කින් සමන්විත බේරේ වැව ව්‍යාපෘතියෙහි අදියර IV සහ V (Stage I, II, III completed under the World Bank Funds) නැගෙනහිර බේරේ වැවෙහි බටහිර ඉවුරෙහි ක්‍රියාත්මක කරන ලදී. මෙහි සඳහන් මිලියන 20 ක මුදල වෙන් කරන ලද්දේ බටහිර බේරේ වැවෙහි මුදල් අමාත්‍යාංශය පැත්තෙහි ඉවුර සකස් කිරීමට වූ අතර, එහි කොන්ත්‍රාත්තුව ලබා දීම සඳහා මෙම මුදල ප්‍රමාණවත් නොවූ බැවින්, ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. පවතින මූල්‍යමය ගැටලු අනුව තවදුරටත් ප්‍රතිපාදන වෙන්කරගැනීමේ අපහසුතාවය මත අන්‍යෝන්‍ය අවබෝධතාවයෙන් යුතුව කොන්ත්‍රාත්තුව නිමකර නාගරික සංවර්ධන අධිකාරිය භාරගෙන ඇත.

(ක) **නිරීක්ෂණය**

අධිකාරියේ අවශ්‍යතාවය මත උප සමාගම හරහා බඳවාගෙන සේවයේ යොදවා ගන්නා ලද මෙම නිලධාරීන් සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සේවක සංඛ්‍යා සැලැස්මට ඇතුළත් කර, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ඇතිව අධිකාරියේ ස්ථිර කාර්යය මණ්ඩලයට ඇතුළත් කිරීමට මෙවන විට කටයුතු කර ඇත.

(ග) **නිරීක්ෂණය**

මීතොටමුල්ල කසල කන්ද පිහිටි භූමිය 2017.04.13 වන දින නාය යෑමකට පත් වූ අතර, අනාගතයේ දී නැවත එවැනි ව්‍යසනයක් සිදු වීම වළක්වාලමින් එම භූමිය සුදුසු සංවර්ධන කටයුත්තක් සඳහා යෙදවීමට එවකට පැවති මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව කසල කන්ද සහිත භූමිය සංවර්ධනය කිරීමේ කාර්යයට අවශ්‍ය උපදේශන කටයුතු ලබා ගැනීම සඳහා ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය සමඟ ගිවිසුමකට එළඹ ඇත.

ස්ථායීකරණය කිරීමට පෙර එම කසල කන්ද මීටර් 50 ක් උසට, අක්කර 15 ක භූමි ප්‍රදේශයක් තුල, ආනතිය 60^0 - 90^0 ත් අතර පැවතුනි. 2022.11.22 වන විට වැඩ අවසන් කර ඇති කොටසේ උස මීටර් 30 ක් දක්වා සමතලා කිරීම, එහි ආනතිය 25^0 - 30^0 ත් අතර ප්‍රමාණයකට අඩු කිරීම, මට්ටම් 7 ක් වන පරිදි කසල කන්ද උපදේශකයන්ගේ පිරිවිතරයන්ට අනුව මහජනයාට අනතුරුදායක නොවන ආකාරයට ස්ථායීකරණය කර ඇති බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO) විසින් සනාථ කර ඇත. තවද, අපජල බැහැර කිරීමේ පද්ධතියෙන් 30% ක් පමණද, අහිතකර වායු විමෝචන පද්ධතියේ 25% ක් පමණද අවසන් කර ඇත. ඒ අනුව, දැනට වැඩ අවසන් කර ඇති කාර්යයන්ද ඇතුළුව උපදේශන ගාස්තු, ව්‍යාපෘති පරිපාලන වියදම් ද ඇතුළුව රු. මිලියන 441.74 ක් ඉහත ව්‍යාපෘතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් වියදම් කර ඇත.

කෙසේවෙතත්, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා තවදුරටත් මූල්‍ය ප්‍රතිපාදන ලබා නොදීමට තීරණය කළ අතර ඒ සඳහා විකල්පයක් ලෙස රාජ්‍ය හා පුද්ගලික අංශ ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් අවසන් කිරීමට පුද්ගලික අංශයේ ආයෝජකයෙකු තෝරා ගැනීම පිණිස ආයෝජන යෝජනා කැඳවීම සඳහා අවශ්‍ය මූලික පියවර මෙම අධිකාරිය විසින් දැනටමත් ගෙන ඇත. එසේ වුවද, ව්‍යාපෘතිය භාරනාගෙන ඇති ඉඩමෙන් අක්කර 12 ක ප්‍රමාණයක් මේ දක්වා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වන වගන්ති ප්‍රකාරව අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොමැති බැවින්, ආයෝජකයෙකු තෝරා ගැනීම සඳහා වන ක්‍රියාවලිය අවසන් කිරීමට නොහැකිව ඇත.

(ච) **<u>නිරීක්ෂණය</u>**

මෙම ගුදම් සංකීර්ණය තවදුරටත් PWCC සමාගමේ ගිණුම් පොත්වල දක්වා ඇති අතර ඇවරකරු විසින් ඇවර කිරීමේ ගිණුම් ඉදිරිපත් කරන තෙක් අධිකාරියේ ගිණුම්වලට ලබා ගැනීමට නොහැකිවී ඇත. කෙසේ වෙතත් ඇවරකරු විසින් ඇවරකිරීමේ ගිණුම් ඉදිරිපත් කිරීමට යටත්ව 2017.08.31 දින සිට එම ගුදම් සංකීර්ණවල කළමනාකරණය නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇති බැවින් මෙම කුලී මුදල් උත්පාදනය කරගෙන ඇති අතර එම මුදල නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුම් වලට ඇතුළත් කර ඇත.

(ජ) **<u>නිරීක්ෂණය</u>**

අවස්ථා 04 කදී ගණුදෙනුකරුවන්ගේ තැන්පතු ඉක්මවා අධිකාරිය විසින් ප්‍රාග්ධන වියදම් ලෙස දරන ලද යැයි සඳහන් රු. මිලියන 6,042.68 ක ශේෂය තුළ රු.මිලියන 6,024.09 ශේෂයක් අදාළ වනුයේ අධිකාරිය විසින් අඩු ආදායම්ලාභීන් උදෙසා ක්‍රියාත්මක කරන ලද නාගරික පුනර්ජීවන ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් දරන ලද වියදම් වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහාභාණ්ඩාගාරය විසින් අරමුදල් ලබා දී ඇති අතර ඒවා මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ නාගරික පුනර්ජීවන ව්‍යාපෘති සඳහා රජයේ අනුග්‍රහය (Government Assistant for URPCC Projects) යටතේ පෙන්නුම් කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිවල පිරිවැය ආවරණය කර ගැනීම සඳහා මහාභාණ්ඩාගාරය විසින් රු .මිලියන 6,645.22 ක මුදලක් 2023/11/30 දින වන විට අධිකාරිය වෙත ලබා දී ඇත.

ඊට අමතරව ඉතිරි ශේෂය වන රු.මිලියන 18.59 ක මුදල ගණුදෙනුකරුවන්ගේ තැන්පතු වලට අදාළව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලට අදාළ වන අතර ඒ සම්බන්ධව සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින අතර ඊට අදාළ නිවැරදි කිරීම් හා ගැලපීම් 2022 වර්ෂයේ අවසන් ගිණුම්වල සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(ට) **නිරීක්ෂණය**

භාණ්ඩාගාර අරමුදල් ලබා ගැනීමට අවශ්‍ය අනුමැතිය සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර මෙතෙක් මුදල් සඳහා අනුමැතිය ලැබී නැත.

(ඨ) **නිරීක්ෂණය**

ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38 වගන්තිය යටතේ පවරා ගත් දේපලවල ප්‍රාදේශීය ලේකම් විසින් වන්දි පරීක්ෂණ අවසන් වන තෙක් සහ වන්දිලාභීන් හඳුනා ගන්නා තෙක් 38 වගන්තිය යටතේ දේපල පවරා ගත් දින සිට පනතේ ප්‍රතිපාදන යටතේ පොලී ගෙවිය යුතුව ඇත.

(ඩ) **නිරීක්ෂණය**

අධිකාරිය සතු ඉඩම් බදු දීමේ පදනම මත බැහැර කිරීමේදී අයකර ගත හැකි බදු වටිනාකම අදාළ බදු කාලය අනුව තීරණය වේ. මෙම විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි කොළඹ කොටුව ට්‍රාන්ස්වර්ක් චතුරස්‍ර ඉඩම සඳහා ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද 99 අවුරුදු බදු වටිනාකම වශයෙන් තීරණය කරන ලද මුදල ආයෝජන සමාගම විසින් මෙම අධිකාරිය වෙත ගෙවා ඇත.

99 අවුරුදු බදු වටිනාකම සහ වෙළෙඳපොළ වටිනාකම අතර වෙනස වන රු. 1,250,400,000/- ක් වූ මුදලින් අනුපාතික මුදල නිවාස ඒකක සඳහා විකුණුම් කර නිකුත් කිරීමේදී අයකර ගනු ලැබේ. (ඉඩමෙහි වෙළෙඳපොළ වටිනාකම සහ බදු වටිනාකම අතර වෙනසින් සංවර්ධන ව්‍යාපෘතිය තුළ ඉදිකරනු ලබන නිවාස ඒකකවල ගෙබිම් ප්‍රමාණය මත විකුණුම් පදනම මත බැහැර කරනු ලබන මුළු ගෙබිම් ප්‍රමාණය අනුව ගණනය කරනු ලබන අනුපාතය මත)

එය මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා ඉඩම් බැහැර කිරීමේදී ක්‍රියාත්මක කරනු ලබන ක්‍රමවේදය වන බැවින්, එම තත්ත්වයට පරිබාහිරව අදාළ මුළු මුදල අයකර ගැනීමේ හැකියාවක් අධිකාරිය සතුව නොමැත. අදාළ බදු ගිවිසුම අනුව සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිම කළ පසුව නිවාස ඒකක සඳහා ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ඉඩමේ බදු වටිනාකම හා සින්නක්කර වටිනාකම අතර වෙනස සමානුපාතිකව නාගරික සංවර්ධන අධිකාරිය වෙත අයකර ගනු ලැබේ.

(ත) **නිරීක්ෂණය**

මෙම ගණුදෙනුවට අදාළව,

- රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම (2011 වර්ෂයේදී - 99 අවුරුදු) රු. 2,785,000,000.00.
- බදුකරු ගෙවූ මුදල රු. 577,000,000.00.
- ඉඩම් අත්පත්කර ගැනීම් / වන්දි ගෙවීම් මෙන්ම බදු මුදල් ලබාදීම 2016 වර්ෂය දක්වා ප්‍රමාද වී ඇත.

- ❖ ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ තක්සේරුකරුගේ 99 අවුරුදු බදු වටිනාකම් නැවත ලබාගන්නා ලදී. එය රු. 3,620,000,000.00 කි.
- ❖ බදුකරු වෙත 2011 වර්ෂයේ බදු වටිනාකම් නොව 2016 බදු වටිනාකම් ගෙවන ලෙස දැන්වුවද, ඔහු විසින් ගෙවා තිබූ රු.මිලියන 577 සඳහා පොළියක් අඩුකරන ලෙස අභියාචනය කර තිබූ අතර ඒ අනුව ගණනය කර අඩුකළ පොළිය රු.330,249,000.00 කි.

සම්පූර්ණ බදු මුදලේ වටිනාකමින් මීට පෙර ගෙවූ රු.මිලියන 577 සහ අඩුකරන ලද පොළිය හැර ඉතිරි මුදල බදුකරු ගෙවා තිබූ නමුත් පොළිය අඩු කිරීම සම්බන්ධව විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබූ නිසා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙම මුදල අයකර ගන්නා ලෙස උපදෙස් ලබාදී තිබුණි.

<u>නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්ත්වය</u>

නමුත් බදුකරු ඒ සඳහා එකඟ නොවී පසුගිය කාලය තුළ සිටියද ඉඩමේ සංවර්ධන බලපත්‍රය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවය මත අධිකාරියේ පූර්ව අවසරය ඉල්ලා සිටින ලදී. මෙහිදී මේ සම්බන්ධව අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත වාර්තා කර සංවර්ධන බලපත්‍රය මෙන්ම සංවර්ධන කාලය 2025 දක්වා දීර්ඝ කිරීම සඳහා පහත පරිදි කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබාදෙන ලදී.

1. බදුකරු විසින් අධිකාරිය වෙත ගෙවිය යුතු රු.මිලියන 330,249,000.00 ක මුදල (රජයේ බදු මුදල් සමඟ රු.356,668,920.00) වහාම අධිකාරිය වෙත ගෙවිය යුතුවේ.
2. ඉහත (1) කොන්දේසිය සම්පූර්ණ කළ පසුව පමණක් සංවර්ධන කාලසීමාව 2025.01.31 දින දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.


ඉහත කළමනාකරණ මණ්ඩල තීරණය බදුකරු වෙත දන්වා යවා තිබූ අතර, එයට පිළිතුරු ලිපියක් යොමු කරමින් නැවත තීරණය සලකා බලන ලෙස අභියාචනය කර තිබුණි. මේ සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීමෙන් කළමනාකරණ මණ්ඩලය වෙත නැවත යොමුකළ අතර, එහිදී දීර්ඝ කරුණු අධ්‍යයනයකින් පසුව නීතිපති උපදෙස්වලට යටත්ව බද්ද අවලංගු කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව, අදාළ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට පෙර නීති අංශය මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත මෙම බද්ද අවලංගු කිරීම සම්බන්ධව ගරු නීතිපතිතුමාගේ නිර්දේශ ලබා ගැනීමට මේ වනවිට යොමුකර ඇත.

නිමේෂ් හේරත්

සභාපති

නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය

06, 07, 09, මහල්
සෙත්සිරිපාය අදියර 01
බත්තරමුල්ල, ශ්‍රී ලංකා

+94 112 873 637
https://www.uda.gov.lk
info@uda.gov.lk